- මුදල් රෙගුලාසි 128(1) අනුව පොලිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය පවත්වාගෙන යාම සඳහා වැය සම්මත කළමනාකරණය

සම්බන්ධයෙන් පොලිස්පති ප්‍රධාන ගණන් දීමේ නිලධරයා ලෙස වගකිව යුතු බව,

- මුදල් රෙගුලාසි 133 අභ්‍යන්තර විගණන,
- මුදල් රෙගුලාසි 150 විසර්ජන ගිණුම්,
- මුදල් රෙගුලාසි 152 රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ,
- මුදල් රෙගුලාසි 625 විදේශ ආධාර වියදම් හා භාණ්ඩාරගාර පොත්පත්වල සටහන් කිරීම, යන රාජකාරි සම වගකීම් ඇතුළු මුදල් කළමනාකරණය පොලිස්පතිවරයා විසින් සිදු කළ යුතු බව,

**අඉ.** පොලිස්පතිවරයෙකු ලෙස,

ව්‍යවස්ථාපිත කාර්යය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද විධායකයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා පොලීසිය මෙහෙය වීම පොලිස්පති විසින් සිදු කළ යුතු බව,

**අඊ.** පොලිස් ආඥා පනතේ 56 වගන්තිය යටතේ,

(i) සියලුම අපරාධ, වැරදි සහ පොදු හිරිහැර වැලැක්වීම ට තමාගේ සම්පූර්ණ ධෛර්යය සහ ශක්තිය යෙදවීම ද,

(ii) සාමය ආරක්ෂා කිරීම ද,

(iii) අනිසි ලෙස හැසිරෙන සහ අවිශ්වාස උපදවන තැනැත්තන් සිර භාරය ට ගැනීම ද,

(iv) වරදකරුවන් සොයා දැන ගැනීම හා ඔවුන් අධිකරණය ට ඉදිරිපත් කිරීම ද,

(v) පොදු සාමය සම්බන්ධයෙන් ආරංචි එක් රැස් කිරීම සහ ඒවා දැක්වීම සහ,

(vi) යම්කිසි බලධරයෙකු විසින් නීත්‍යානුකූල ව නිකුත් කරනු ලැබූ සියලු ම නියෝග සහ වරෙන්තු තමා වෙත කරනු ලැබූ නියමය අනුව අප්‍රමාද ව පිළිපැදීම සහ ඉටු කිරීම යන රාජකාරි සිදු කළ යුතු බව ද, වේ.

23. පැමිණිල්ලේ සාක්ෂි අංක 01, 35, 1034, 1216 සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීමෙන් ද, සටහන් කිරීම ට යෙදුණු පිළිගැනීම් සහ ලේඛන පැ.01 සිට පැ.772 ද, සලකුණු කරමින් පැමිණිල්ලේ නඩුව අවසන් කරන ලදී.

**අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200 වගන්තියේ අදාළත්වය**

24. අපරාධ නඩු කටයුත්තක දී, පැමිණිල්ලේ නඩුව අවසන් කිරීමෙන් අනතුරුව, විත්ති වාචක කැඳවන්නේ ද නැද්ද යන්න තීරණය කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්රහයේ 200 වගන්තිය ප්‍රතිපාදන සපයයි. එකී 200 වගන්තිය මෙසේ ය.

"200.(1) චෝදක පක්ෂය වෙනුවෙන් නඩුව ඉදිරිපත් කිරීම අවසන් කරනු ලැබූ විට, චෝදක පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි විනිශ්චයකාරවරයා මුළුමනින් ම අවිශ්වාස කරන්නේ නම් හෝ, අධිචෝදනා පත්‍රයෙ හි චූදිතයා ට විරුද්ධ ව යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා නඟා ඇත්තේ ද, ඒ වරද හෝ ඒ අධිචෝදනා පත්‍රය මත චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි වෙනත් යම් වරදක් හෝ සිදු කර ඇති බව සනාථ කිරීමට ඒ සාක්ෂි අපොහොසත් වන බව විනිශ්වයකාරවරයාගේ මතය වන්නේ නම් විනිශ්වයකාරවරයා විසින් නිදොස් කිරීමේ තීන්දු ප්‍රකාශයක් වාර්තාගත කළ යුතු ය: එසේ වුව ද, නඩු විභාගය පවත්වා ගෙන යාමට හේතු ඇතැයි විනිශ්වයකාරවරයා සලකන්නේ නම් ස්වකීය විත්ති වාචකය ඉදිරිපත් කරන ලෙස විනිශ්වයකාරවරයා විසින් චූදිතයා ට නියම කළ යුතු ය.

(2) සාක්ෂි ඉදිරිපත් කිරීම ට තමා අදහස් නොකරන බව චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා ප්‍රකාශ කරන්නේ නම්, චූදිතයා ට විරුද්ධ ව ඇති සාක්ෂි

සම්පිණ්ඩනය කිරීමේ කාර්යය සඳහා තමාගේ නඩුව සනාථ කරනු පිණිස චෝදනාව මෙහෙයවන නීතිඥවරයා විසින් දෙවන වරටත් අධිකරණය අමතනු ලැබිය හැකි ය."

25. ඉහත ප්‍රතිපාදනයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වැදගත් නඩු තීන්දුවක් ලෙස Attorney General Vs Baranage[1], තීන්දුව සැලකිය හැකි ය. එහි දී, ගරු ගාමිණී අමරතුංග අභියාචනාධිකරණ විනිසුරුතුමා සටහන් කර ඇති පහත කොටස වැදගති. එය පහත පරිදි උපුටා දක්වමු.

"In a trial by a judge without a jury the judge is the trier of facts and as such at the end of the prosecution case in order to decide whether he should call upon the accused for his defence he is entitled to consider such matters as the credibility of the witnesses, the probability of the prosecution case, the weight of evidence and the reasonable inferences to be drawn from the proven facts. Having considered those matters, if the judge comes to the conclusion that he cannot place any reliance on the prosecution evidence, then the resulting position is that the judge has wholly discredited the evidence for the prosecution. In such a situation the judge shall enter a verdict of acquittal.

Even if the Judge has not wholly discredited the prosecution evidence, the words that the Judge 'is the opinion that such evidence fails to establish the commission of the offence charged against the accused or of any other offence of which he might be convicted on such indictment' give him the power to enter a verdict of acquittal without calling for the defence. It appears that the situation contemplated by the above quoted words is similar to Galbraith guideline 2 (a) set out in

[1] [2003] 01 Sri L R 340

the earlier part of this judgment. I set out below the said guideline again.

"When there is some evidence but it is of a tenuous character for example because of inherent weakness or vagueness or because it is inconsistent with other evidence;

If the judge considers that the prosecution case, taken at its highest, is such that a jury, properly directed, could not properly convict on it, it is his duty, on a submission of no case being made to stop the case."

26. එම තීන්දුවේ ම මීට අමතර ව, Curly V United States,[2] S.C. 66/67 - M.C Colombo 34638/A,[3] R. V Shippy[4] යන තීන්දු පිළිබඳ ව ද, අවධානය යොමු කර වැඩිදුරටත් පහත පරිදි නීතිමය තත්ත්වය විස්තර කර ඇත.

"A judge trying a case without a jury is also entitled to approach the evidence in the same way before deciding to call for the defence to the accused. The critical point in this boundary is therefore the existence or non-existence of a reasonable doubt as to the guilt. The law recognizes that the scope of a reasonable mind is broad. If the evidence is such that a reasonable mind, properly directed must necessarily have such a doubt, the judge must acquit because on other result is permussuble in law."

27. ඉහත කරුණු සැලකුව ද, පනතේ 200 වගන්තිය යටතේ වූ කරුණු සැලකුව ද, ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධ වැරදි හෝ චූදිත වරදකරු කිරීම ට හැකි වෙනත් යම් වරදක් හෝ සනාථ කිරීම ට පැමිණිල්ලේ

---

[2] 81 US App D.C, 389
[3] Order of Court at Trial at Bar
[4] (1988) Crim Law Rev. 767

සාක්ෂි අපොහොසත් වන බව ට අධිකරණයේ මතය වන විට අධිකරණය විසින් චූදිතයෙකු නිදොස් කිරීමේ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය. තව ද, මෙහි දී, සාක්ෂිකරුවන්ගේ විශ්වාසනීයත්වය, පැමිණිල්ලේ නඩුවේ විය හැකි භාවය, සාක්ෂි වල වැදගත්කම, යනාදී කරුණු සලකා බැලිය යුතු වේ.

**දණ්ඩ නීති සංග්‍රහයේ 296, 300 සහ 102 වගන්තියේ අදාළත්වය**

28. නඩුවේ චෝදනාවන්ගෙන් 01 සිට 33, 68 සිට 123, 269 සිට 383, 691 සිට 699, 723 සිට 744, 763 සිට 793, 854 සහ 855 යන චෝදනා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියවිය යුතු 296 වගන්තිය යටතේ වැරදි සිදු කළ බව යි. දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ දැක්වෙන මිනී මැරීමේ පනතේ, 293, 294 වගන්ති මෙසේ විස්තර කර යි.

"293. මරණය සිදු කිරීමේ අදහසින් හෝ මරණය සිදුවිය හැකි අන්දමේ ශාරීරික පාඩුවක් සිදු කිරීමේ අදහසින්, හෝ තමා කරන යම් ක්‍රියාවක් මරණය වීමට ඉඩ ඇති බව දනිමින් ම යම් ක්‍රියාවක් කිරීමෙන් මරණය සිදු කරන තැනැත්තෙක් සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය කිරීමේ වරද සිදු කර යි.

294. මෙහි දී මින්මතු බැහැර කරනු ලැබූ අවස්ථාවල දී හැර පහත දැක්වෙන පරිදි වුවහොත්, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනී මැරුමක් වේ. එනම්:-

පළමු වනු ව - මරණය සිදු කළ ක්‍රියාව මරණය සිදු කිරීමේ අදහසින් කරනු ලැබූවක් වීම: හෝ,

දෙ වනුව - පීඩාව සිදු කරනු ලැබූ තැනැත්තාගේ මරණය සිදුවිය හැකි අන්දමේ ශාරීරික පාඩුවක් බව වරදකරු දන්නා වූ පාඩුවක් කිරීමේ අදහසින් එය කරනු ලැබීම : හෝ

තෙ වනු ව - ශාරීරික පාඩුව යම් තැනැත්තකුට කිරීමේ අදහසින් එය කරනු ලැබ, එසේ කිරීමට අදහස් කරනු ලැබූ ශාරීරික පාඩුව ස්වභාවික කටයුතු අතර දී මරණය සිදු කිරීමට ප්‍රමාණවත් වීම: හෝ

හතර වනු ව - අන්තරාය කොපමණ ආසන්න ද කිවහොත් සෑම අතින් ම මරණය සිදුවිය හැකි බව හෝ මරණය සිදුවිය හැකි ශාරීරික පාඩුව විය හැකි බව ක්‍රියාව කරන්නා දැන ගෙන සිටිමින් ම මරණය සිදු කිරීමේ හෝ ඉහත කී ලෙස පාඩුවක් සිදු කිරීමේ අවදානම ට මුහුණපෑම ට සමාව දිය හැකි හේතුවක් නොමැති ව ම, එකී ක්‍රියාව කිරීම.

294. 4 ව්‍යතිරේකය. හදිසි සටනක, හදිසි දබරයක දී, කෝපය ඇවිස්සුණු අවස්ථාවක දී, කල් තබා කල්පනා කිරීමක් නො කර වරදකරු අනිසි වාසියක් නො ලබා හෝ කෲර ලෙස හෝ අස්වාභාවික ලෙස ක්‍රියා නො කොට මරණය සිදු කරනු ලැබුවේ නම්. ඒ සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් නො වේ."

29. 34 සිට 67, 124 සිට 268, 384 සිට 690, (511 හැර)700 සිට 722, 745 සිට 762, 794 සිට 853 චෝදනා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියවිය යුතු 300 වගන්තිය යටතේ වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ 300 වගන්තිය මෙසේ ය.

“300. යම් අදහසකින් හෝ දැනුමකින් හා යම් අවස්ථා යටතේ යම් ක්‍රියාවකින් මරණය සිදු කරන ලද නම් යම් තැනැත්තකු මිනීමැරුම ට වරදකාරයකු වෙතොත්, එබඳු ක්‍රියාවක් කරන තැනැත්තකු ට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයක ට ද යටත් විය යුතු ය. එබඳු ක්‍රියාවකින් යම් තැනැත්තකු ට තුවාල වී නම්, වරදකරු ට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයක ට ද යටත් විය යුතු ය. ”

30. සියලු චෝදනාවන් ට අදාළ වරද දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියවිය යුතු වේ. ඉහත 102 වගන්තිය යටතේ අනු බල දීම යන වරද දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ මෙසේ විස්තර කර යි.

"100. පළමු වනු ව - යම් දෙයක් කිරීම ට යම් කෙනෙකු පෙළඹ වන්නෙක් ; හෝ

දෙ වනු ව - යම් දෙයක් කිරීම ට කුමන්ත්‍රණයක යෙදෙන්නෙක්, හෝ

තුන් වනු ව - යම් දෙයක් කිරීම ට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝදී නොකර හැරීමකින් ඕනෑකමින් ම උපකාර කරන්නෙක්, එය කිරීම ට අනුබල දෙන්නෙක් වේ."

31. අනු බල දෙන්නා යන්න දණ්ඩ නීති සංග්‍රහයේ 101 වගන්තිය යටතේ ද පහත පරිදි විස්තර කර යි.

" වරදක් කිරීම ට හෝ අනුබල දෙන්නාගේ අදහස හා දැනුම ඇති ව නීත්‍යානුකූල ව වරද කිරීම ට පුළුවන් කමක් ඇති තැනැත්තකු විසින් කරන ලද නම් වරදක් වන ක්‍රියාවක් කිරීම ට අනුබල දෙන තැනැත්තා වරදක ට අනුබල දෙන්නේ ය."

32. දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය මෙසේ ය.

" අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුබල දෙනු ලැබූ ක්‍රියාව සිදු කළ විට ද, එබඳු අනුබල දීමක් සඳහා දඬුවමක් පිළිබඳ ව විධි විධානයක් මේ සංග්‍රහයෙන් ප්‍රකාශිත ව සලස්වා නොමැති විට ද, එබඳු වරදක ට අනුබල දෙන්නා ට ඒ වරද සඳහා නියමිත දඬුවමෙන් දඬුවම් කළ යුතු ය. "

33. චූදිත සිදු කළ බව ට කියන වරද ප්‍රධාන වරද සඳහා අනුබල දීම යි. දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සඳහා අනුබල දීම හේතුවෙන් ප්‍රකාශිත ව දඬුවමක් දණ්ඩ නීති සංග්‍රහයේ නැත. ඒ අනුව යම් හෙයකින් 296 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් හා සම්බන්ධ නඩුවේ එක් චෝදනාවක ට හෝ චූදිත වරදකරු වුවහොත්, ප්‍රධාන වරද සම්බන්ධයෙන් නියම කළ දඬුවම චූදිත ට නියම කළ යුතු වේ.

34. මෙම නඩුවේ දී, පැමිණිල්ල විශ්වාස තබන්නේ, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ 3 වන කොටස යටතේ ය. එනම්,

" තුන් වනු ව.- යම් දෙයක් කිරීම ට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නොකර හැරීමකින් ඕනෑකමින් ම උපකාර කරන්නෙක් එය කිරීම ට අනුබල දෙන්නෙක් වේ." මෙහි ඉංග්‍රීසි පරිවර්තනය මෙසේ ය.

" Intentionally aids, by any act or illegal omission, the doing of that thing."

මෙහි දී, අනුබල දීම ට අදාළ ක්‍රියාව පිළිබඳ ව නොකර හැරීම " ඕනෑකමින් ම" උපකාර කරන්නක් (intentionally aids) විය යුතු ය.

35. චෝදනා අංක 01 සිට 33, 68 සිට 123, 269 සිට 383, 691 සිට 699, 723 සිට 744, 763 සිට 793, 854 සහ 855 දක්වා වූ චෝදනාවන් හි නම් සඳහන් අය මිය ගිය බව සහ එම අයගේ මරණය ට හේතුව ඒ ඒ චෝදනාවන් හි දක්වා ඇති පරිදි වූ ස්වයං ඝාතන බෝම්බ පුපුරුවා ගැනීමෙන් බව ට වන කරුණ හබයක් නැත.

36. චෝදනා අංක 34 සිට 67, 124 සිට 268, 384 සිට 690, 700 සිට 722, 745 සිට 762, 794 සිට 853 දක්වා වූ චෝදනාවන් හි නම් සඳහන් අය ට තුවාල වීම ඒ ඒ චෝදනාවන් හි දැක්වෙන පරිදි ස්වයං ඝාතන බෝම්බ පුපුරුවා ගැනීම හේතුවෙන් බව ට වන කරුණ පිළිබඳ ව ද හබයක් නැත.

37. ඉහත කී පුපුරුවා ගැනීම් පීඩාකාරී ආයුධ භාවිතා කිරීම මඟින් සිදු කර ඇත්තකි. එය පිළිගත් කරුණ කි. යම් පීඩාකාරී ආයුධයකින් වූ පුපුරුවා ගැනීමෙන්, පුපුරුවා හැරීම හේතුවෙන් යමෙකු ට තුවාල වී ඇත්නම් එකී තුවාලයේ ප්‍රමාණය, තුවාල වූයේ ද නැද්ද යන්න නොසලකා අදාළ පිපිරීම යමෙකු ඝාතනය කිරීමේ අදහසින් හෝ එසේ ඝාතනය වන බව දැනුමකින් සිදු කරන්නක් ලෙස ට සැලකිය යුතු ය. ඒ අනුව එමඟින් තුවාල සිදු වූවෙකු ට තුවාලයේ ප්‍රමාණය නොසලකා තුවාලකරු ඝාතනය කිරීම ට සිදු කරන

ක්‍රියාවක් ලෙස සැලකිය යුතු වේ. ඒ අනුව ඒ ඒ චෝදනාවන් හි නම් සඳහන් පාර්ශවකරුවන් පිළිගත් ස්වයං ඝාතක බෝම්බකරුවන් එමඟින් ඊට ගොදුරු වූ සියලු දෙනා ඝාතනය කිරීමේ චේතනාවෙන් සහ ඝාතනය වන බව ට වූ දැනුමෙන් සිදු කරන්නක් බව පැහැදිලි ය.

**ඔප්පු කිරීමේ භාරය**

38. චූදිත ට එරෙහි ව දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය යටතේ චෝදනා ගොනු කර ඇත්තේ චූදිත විසින් 01 සිට 33, 68 සිට 123, 269 සිට 383, 691 සිට 699, 723 සිට 744, 763 සිට 793, 854 සහ 855 දක්වා චෝදනාවන් හි සඳහන් පුද්ගලයන්ගේ මරණය සිදු කිරීම ට හා සෙසු අය ට තුවාල සිදු කිරීමේ ක්‍රියාව ට දණ්ඩ නීති සංග්‍රහයේ 101 වගන්තියේ 3 වන කොටසේ, යම් දෙයක් කිරීම ට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නොකර හැරීමකින් ඕනෑකමින් ම උපකාර කිරීම යටතේ ය.

39. මෙහි දී, ඉහත අයගේ මරණය සහ තුවාලකරුවන් ට තුවාල සිදු වීම සඳහා චූදිතගේ නොකර හැරීම ඕනෑකමින් ම සිදු කර උපකාර කළ බව ට පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොර ව සනාථ කළ යුතු වේ. ක්‍රියාවේ නීතිමය තත්ත්වය එය යි.

40. මෙම නඩුවේ ඉහත නම් සඳහන් මරණකරුවන්ගේ මරණය සහ තුවාලකරුවන් ට තුවාල සිදු වීම ඒ ඒ චෝදනාවන් හි සඳහන් ක්‍රියාවෙන් බව ට සැකයක් නැත. මෙහි දී, සාධාරණ සැකයෙන් තොර ව පැමිණිල්ල විසින් සනාථ කළ යුත්තේ, නඩුවේ සඳහන් ඉහත කී මිනී මැරීමේ හා තැත් කිරීමේ ක්‍රියාව සඳහා චූදිත සිය නීති විරෝධී නොකර හැරීම මඟින් ඕනෑකමින් ම උපකාර කළ බව ය.

41. සාධාරණ සැකය යනු හුදෙක් අභව්‍ය ලෙස ඇති විය යුතු සැකයක් නොවේ. එය ප්‍රායෝගික යථාර්ථවාදී සැකයක් විය යුතු ය. මේ බව

S.M.Don Henry Vs The Queen[5] නඩුවේ දී ද තීරණය කර ඇත. එහෙත් පැමිණිල්ල අවසන් කිරීමෙන් අනතුරු ව විත්ති වාචක නොකැඳවා අපරාධ නඩුවක චෝදනා හා සම්බන්ධ ව සාධාරණ සැකයෙන් තොර ව සාක්ෂි ඉදිරිපත් කර ඇද්ද නැද්ද යන්න පිළිබඳ ව සොයා බලන්නේ නම් එය නීතිමය වශයෙන් දෝෂ සහගත ය.

42. මේ අවස්ථාවේ දී අප විසින් සැලකිය යුතු වන්නේ, පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොර සාක්ෂි ඉදිරිපත් කර ඇත් ද නැද්ද යන්න නොව පැමිණිල්ල විසින්, බැලූ බැල්ම ට, විත්ති වාචක කැඳවීම සඳහා ප්‍රමාණවත් පරිදි නඩුවේ චෝදනාවන් සම්බන්ධ ව ප්‍රබල හා කා වදින සාක්ෂි ඉදිරිපත් කර ඇද්ද යන්න පිළිබඳ ව ය.

**සාක්ෂි සම්පිණ්ඩනය**

සාක්ෂි අංක, 1214

43. මෙම නඩුවේ පැමිණිල්ලේ 1214 වන සාක්ෂිකරු ලෙස නම් කර ඇත්තේ, වර්තමාන පොලිස්පතිවරයා වූ චන්දන දීපාල් වික්‍රමරත්න යන අය යි.

44. එම සාක්ෂිකරු කැඳවීමේ දී, ඔහුගේ තනතුර, පත් කිරීම් සහ උසස්වීම්, පොලිස්පතිවරයෙකු පත් කිරීම, පොලිස්පතිවරයගේ බලතල, පොලිස් ආඥා පනතේ 56 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන යන කරුණු ඉහත පිළිගැනීම්වල දැක්වෙන පරිදි වූදිත වෙනුවෙන් පිළිගෙන ඇත.

45. එම සාක්ෂිකරුගේ සාක්ෂි අනුව, මෙම සාක්ෂිකරු වසර නවයක පමන කාලයක් බුද්ධි අංශය භාර ව කටයුතු කරන ලද නිලධාරියකු බව හෙළිදරව් කරන ලදී. එසේම පොලිස් ආඥා පනතේ 56 වන වගන්තිය යටතේ තම රාජකාරි ඉටු කිරීම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පොලිස්පතිවරයෙකුගේ වගකීම බව, එම වගකීම සීමා රහිත ව සිදු කළ යුතු වගකීමක් බව ත්, පැහැදිලි කර දෙන ලදී.

---
[5] 71 NLR 559

46. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සැලකීමේ දී, පෙනී යන එක් කරුණක් වන්නේ, සාක්ෂිකරු පොලිස්පති ලෙස පත් වීමෙන් අනතුරු ව, සාක්ෂිකරු විසින් ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය වශයෙන් යම් යම් තීරණ ගැනීම් පිළිබඳ ව හෙළිදරව් කර තිබීම යි. නමුත් එම කරුණු මෙම නඩුව ට විෂයගත කාලයේ චූදිත සිදු කරන ලද ක්‍රියා හා සම්බන්ධ ව හෝ විධිවිධාන සම්බන්ධ ව අදාළ කර ගත යුතු නැත. අනෙක් කාරණාව වන්නේ, යම් යම් අවස්ථාවන් ට මුහුණ දීමේදී සාක්ෂිකරු ක්‍රියා කරන ආකාරය පැහැදිලි කර තිබීම යි. එය ද, මතයක් වන අතර, එම සාක්ෂිකරු ක්‍රියා කරන පරිදි තවත් අයෙකු කටයුතු කිරීම අවශ්‍ය වන්නේ නැත.

47. යම් තොරතුරක් ලැබුණු පසු එම තොරතුරු තම නිලධාරින් මඟින් වර්ධනය කරගෙන පාවිච්චි කිරීම පිළිබඳ ව ද, සාක්ෂිකරු හෙළිදරව් කර ඇති අතර, එය පොලිස්පතිවරයෙකුගේ වගකීම යි. මෙම නඩුවේ චූදිත එපරිදි කටයුතු කර ඇත්ද යන්න මතුව ට සාකච්ඡා කරනු ඇත.

48. තව ද, තොරතුරු සඳහා ක්‍රියා කිරීමේ දී, එකී තොරතුරු සියය ට සියයක් ම බුද්ධි තොරතුරු විය යුතු නැති බව ත්, ඒවා වර්ධනය කර ගැනීම පොලිස්පතිවරයාගේ රාජකාරියක් බව ත් මෙම සාක්ෂිකරු හෙළිදරව් කර යි.

49. ලැබෙන තොරතුරු වලින් අතිරහස්‍ය ලෙස ලැබෙන තොරතුරු ඒ ආකාරයෙන් ම පහළ නිලධාරීන් ට යොමු කිරීම පිළිබඳ ව මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර ඇත. එහි දී, සාක්ෂිකරුගේ ස්ථාවරය වී ඇත්තේ, තමා එසේ නොයවා අවශ්‍ය තොරතුරු පමණක් පහළ නිලධාරීන් ට යොමු කරන බව යි. එම ක්‍රියාවලිය ද සාක්ෂිකරු විසින් අනුගමනය කළ ක්‍රියාවලියක් විනා සෑම අයෙකු විසින් ම සිදු කළ යුතු බව ට බැඳීමක් නැති ක්‍රියාවලිය කි.

50. වැඩිදුරටත් ලැබෙන තොරතුරු හෝ ලිපි සඳහා පියවර ගැනීමේ දී, FNA යන යෙදුම භාවිතා කිරීම පිළිබඳ ව මෙම සාක්ෂිකරුගෙන් පැමිණිල්ල සාක්ෂි මෙහෙයවා ඇත. FNA යන යෙදුම, For Necessary Action යන යෙදුම සඳහා කෙටියෙන් භාවිතා කරන්නක් බව ත්, එසේ

නැතහොත් සුදුසු කටයුතු සඳහා යන්න යොදන යෙදුමක් බව ට සාක්ෂිකරු හෙළිදරව් කර යි. සාක්ෂිකරුගේ ස්ථාවරය වූයේ, එවැනි යෙදුමක් යොදා පහළ නිලධාරීන් ට පියවර ගැනීම ට යොමු කිරීම සුදුසු නොවන බව ත්, එය වගකීමෙන් මිදීම ට කරන්නක් බව ත් ය.

51. නමුත් එසේ එම යෙදුම යෙදූ පමණින් එය වගකීමෙන් මිදීම ට තරම් ලද්දක් ද, එසේ නැතහොත් අවශ්‍ය පියවර ගැනීම සඳහා නිලධාරීන් දන්නා බව ට, විශ්වාසයකින් කරන ලද්දක් ද යන්න සලකා බැලිය යුත්තේ ඒ ඒ සිද්ධිය ට අදාළ ව ය. මේ බව පොලිස්පතිවරයාගේ සාක්ෂියෙන් ම පැහැදිලි වන අතර, තමා වුව ද සුදුසු කටයුතු සඳහා තම පහළ නිලධාරීන් ට ලිපි යොමු කරන බව ත්, එය පොලිස්පතිවරයගේ කාලය මිඩංගු කිරීම අවශ්‍ය නොවන අවස්ථා වල දී එසේ කරන බව ත්, නමුත් එසේ යොමු කරන ලද නිලධාරියා ට ඒ සම්බන්ධ ව කටයුතු කිරීම ට දැනුමක් ඇත්ද නැද්ද යන්න තමා දන්නා බව ට ත් හෙළිදරව් කර ඇත. එවැනි යෙදුමක් යෙදූ පමණින් හුදෙක් වගකීමෙන් මිදීම ට පමණක් යොදන යෙදුමක් ලෙස නොසැලකිය හැකි බව ත්, ඒ ඒ සිද්ධිය ට අදාළ කරුණු අනුව එය සැලකිය යුතු බව ට ත්, පෙර සඳහන් කළ කරුණ පොලිස්පතිවරයගේ ඉහත සාක්ෂියෙන් ම පැහැදිලි ය.

52. තොරතුරු බෙදා දීම පොලිස්පතිවරයා විසින් සිදු කළ යුතු බව ත්, එය පොලිස්පතිවරයෙකුගේ වගකීම බව ත්, එම සාක්ෂිකරු හෙළිදරව් කර ඇත.

53. 2019 අප්‍රේල් 21 දින ප්‍රහාරයෙන් පසු මෙම සිදු වීම හා සම්බන්ධ ව විමර්ශනයක් පැවැත්වීම ට තමා ට නියෝග ලැබුණු බව ත්, ඒ අනුව ඒ සම්බන්ධ ව පරීක්ෂණයක් පැවැත්වීම ට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න යන අය ට 2019.05.06 දාතමෙන් යුතු ව යොමු කරන ලද ලිපිය පැ.44 ලෙස සලකුණු කරන ලදී. තමා ට උපදෙස් ලද දිනයේ ම එකී ලිපිය යොමු කරන ලද බව ට සාක්ෂිකරුගේ ස්ථාවරය යි.

54. හරස් ප්‍රශ්න විමසීමේ දී ද, ඉහත FNA යන යෙදුම පිළිබඳ ව ද, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගෙන් වාර්තා කැඳවීම පිළිබඳ ව ද, පැමිණිල්ල විසින් ලකුණු කරන ලද ලේඛන වල සඳහන් ව ඇති කරුණු පිළිබඳ ව මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර සිටින ලදී. එහි දී ද, මෙම සාක්ෂිකරුගේ ද ස්ථාවරය පරිදි, බුද්ධි තොරතුරු වර්ධනය කිරීමක දී, එසේ වාර්තා කැඳවීම ට කටයුතු කර ඇති බව පෙනී යයි. සාක්ෂිකරු වෙත පැ.37, පැ.39, පැ.40 ලේඛන පෙන්වා ජරශ්න කිරීමේ දී එම ලේඛන වල මෙම නඩුවේ චූදිත විසින් නිලධාරින්ගෙන් වාර්තා කැඳවා ඇති බව ට සටහන් ව ඇති කරුණ පිළිගන්නා ලදී.

55. නඩුව ට අදාළ සෙසු ලේඛන සැලකීමේ දී, ඉහත දැක්වීම ට යෙදුණු, විශේෂයෙන් පැ.04 (අ), පැ.06 (අ), පැ.07 (අ), පැ.09 (අ), පැ.10 (අ), පැ.14 (අ), පැ.15 (අ), පැ.16 (අ), පැ.18 (අ), පැ.19 (අ), පැ.20 (අ), පැ.21 (අ), පැ.22 (අ), පැ.24 (අ), පැ.25 (අ), පැ.26 (අ), පැ.27 (අ), පැ.29 (අ), පැ.39 හි දෙවන පිටුව, පැ.40 හි අවසන් පිටුව, පැ.41 හි අවසන් පිටුව අනුව පොලිස්පතිවරයා ට ලැබුණු තොරතුරු හා සම්බන්ධ ව සුදුසු පියවර ගැනීම ට ඔබ්බෙන් ගිය පියවරයන් ගෙන ඇති බව පැහැදිලි ය.

56. චූදිතගෙන් වැඩිදුර ට ත් චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න යොමු කිරීමේ දී, පොලිස් දෙපාර්තමේන්තුවේ පණිවිඩ හුවමාරු කරගන්නා ආකාරය පිළිබඳ ව ද, කරුණු හෙළිදරව් කර ඇත. මෙහි දී, දුරකථන සංවාදයන් ට අමතර ව වට්ස්ඇප්, සූම්, වැනි තාක්ෂණ මඟින් පණිවිඩ හුවමාරු කර ගැනීම පිළිබඳ ව පැහැදිලි කර ඇත.

57. Textra (ටෙක්ස්ට්‍රා) සන්නිවේදන ක්‍රමයක් වූ සන්නිවේදන මාර්ගයත් පොලිස් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යාම සම්බන්ධ ව ප්‍රශ්න කිරීමේ දී සාක්ෂිකරුගේ ස්ථාවරය වී ඇත්තේ, එවැනි සන්නිවේදන ක්‍රමවේදයක් පොලිස් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන ගොස් නැති බව යි.

(ටෙක්ස්ට්‍රා මාර්ගයෙන් සන්නිවේදනය කිරීම පිළිබඳ ව පළමු සාක්ෂිකරු සාක්ෂි දී ඇත. ඒ පිළිබඳ ව පසුව ට විස්තර කරනු ඇත.)

58. වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේ දී, මෙම නඩුවේ චූදිත විසින් 2021.04.09 වන දින සිට හුවමාරු වූ ලිපි සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකාය, බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අපරාධ කොට්ඨාශය, එම ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය, යන අය වෙත දැනුම් දීම පිළිබඳ ව ප්‍රශ්න කර ඇත. ඊට අදාළ ලේඛන තමා දුටු බව ට මෙම සාක්ෂිකරු හෙළිදරව් කර ඇත. විශේෂ කාර්ය බලකායේ ප්‍රධානියා ට එවන තොරතුරක් ලබා දුන් විට ඔහු එය විශේෂ කාර්ය බලකා මූලස්ථානයන් ට දැනුම් දිය යුතු බව ට වන කරුණ පිළිබඳ ව ද මෙම සාක්ෂිකරු හෙළිදරව් කර ඇත. මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කිරීමේ දී ජාතික බුද්ධි අධ්‍යක්ෂක හට මෙම තොරතුරු ලැබුණු පසු ක්‍රියා කිරීම සම්බන්ධ ව වගකීම පිළිබඳ ව ප්‍රශ්න කර සිටිය ද, එම කරුණු මෙම නඩුවේ චූදිත හා සම්බන්ධයෙන් අදාළ වන්නේ නැත. තව ද, මෙවැනි අවස්ථාවක වෙනත් අංශවල නිලධාරින් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව ද මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර ඇතත්, එම කරුණු ද මෙම නඩුවේ චූදිත හා සම්බන්ධ චෝදනාවන් ට අදාළ වන්නේ නැත. මන්ද මෙම නඩුවේ දී සලකා බැලිය යුතු වන්නේ, නඩුවේ සඳහන් චෝදනාවන් ට අදාළ ව චූදිත ආධාර අනුබල දීමක් සිදු කර ඇත්ද යන කරුණ යි.

59. පැමිණිල්ල පැ.01 සිට පැ.43 දක්වා ලේඛන ඉදිරිපත් කර උත්සාහ කරන ලද්දේ, පළමු සාක්ෂිකරු විසින්, තමා ට ලද තොරතුරු වර්ධනය කර බුද්ධි තොරතුරු බව ට පත් කරගෙන ඒ බව අදාළ අංශයන් ට දැනුම් දුන් බව ට සනාථ කිරීම ට ය.

60. ඉහත ලේඛන සැලකීමේ දී, පෙර සඳහන් කළ පරිදි විශේෂයෙන් පැ.04 (අ), පැ.06 (අ), පැ.07 (අ), පැ.09 (අ), පැ.10 (අ), පැ.14 (අ), පැ.15 (අ), පැ.16 (අ), පැ.18 (අ), පැ.19 (අ), පැ.20 (අ), පැ.21 (අ), පැ.22 (අ), පැ.24 (අ), පැ.25 (අ), පැ.26 (අ), පැ.27 (අ), පැ.29 (අ), පැ.39 හි දෙවන පිටුව, පැ.40

හි අවසන් පිටුව, පැ.41 හි අවසන් පිටුව දැක්වෙන කරුණු අනුව චූදිත වෙත ලැබුණු එකී ලිපි සම්බන්ධයෙන් පියවර ගැනීම සහ වාර්තා ලබා ගැනීම සහ තමා ට පහළ නිලයන් හි සේවය කළ ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කර ඇති බව පැහැදිලි ය.

61. පැ.07(අ), පැ.30(අ), පැ.31(අ), පැ.33 (අ) ලේඛන පරිදි ම එම තොරතුරු පිළිබඳ ව සුදුසු පියවර ගැනීම ට නිලධාරින් ට දැනුම් දීම ට චූදිත ක්‍රියා කර ඇති බව පැහැදිලි ය.

සාක්ෂි අංක, 1216

62. පැමිණිල්ලේ 1216 වන සාක්ෂිකාර දළුවතුමුල්ල ගමගේ නිමල් සේනාරත්න යන අය සාක්ෂිය ට කැඳවා ඇත. එම නිලධාරියා 2009 මැයි 15 වන දින සිට පොලිස්පති කාර්යාලයේ සේවය කරමින් පොලිස්පතිවරයා වෙත ලැබෙන බුද්ධි තොරතුරු අංශයේ කටයුතු කරන බව හෙළිදරව් කරන ලදී. ඒ අනුව ඔහු විසින් මෙම අධිකරණය ඉදිරිපත් කරන ලද ලේඛනයන් ට අදාළ මුල් පිටපත් ඉදිරිපත් කරන ලදී. මෙම සාක්ෂිකරු මඟින් ඉදිරිපත් කරන ලද ලේඛන, (සාක්ෂිකරු පොලිස් මූලස්ථානයේ මෙම නඩුව ට අදාළ ලේඛන පිළිබඳ විෂය ට සම්බන්ධ අංශයේ සාක්ෂිකරුවෙකු බැවින්) පොලිස් මූලස්ථානය ට ලැබීම පිළිබඳ ව හබයක් තිබිය නොහැකි ය.

63. ඉදිරිපත් කරන ලද ලේඛන වල මුල් පිටපත් අනුසාරයෙන් පොලිස්පතිවරයා වෙත ලැබුණු තොරතුරු පිළිබඳ ව ක්‍රියා කළ යුතු ආකාරය සටහන් තැබීම මෙම සාක්ෂිකරුගේ සාක්ෂි මඟින් හෙළිදරව් කරන ලදී. පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද පොලිස්පතිවරයා ට යොමු කරන ලද ලේඛනවල පොලිස්පතිවරයා විසින් ඒ සම්බන්ධ ගත යුතු පියවර සටහන් කරන ලද ලේඛන වල එසේ සටහන් කිරීම පිළිබඳ ව පාර්ශවකරුවන් අතර හබයක් ඇති වී නැත. එම ලේඛන සැලකීමේ දී, සුදුසු ක්‍රියා මාර්ග ගැනීම ට මෙන් ම පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගෙන් හා නියෝජ්‍ය පොලිස්පති

වරුන්ගෙන් ප්‍රගති වාර්තා කැඳවීම ද චූදිත විසින් සිදු කර ඇති බව ද පැහැදිලි ය.

64. මෙම සාක්ෂිකරුගෙන් හෙළිදරව් වූ පරිදි, මෙම අධිකරණය ට ඉදිරිපත් කිරීම හැරුණු විට වෙනත් කිසිදු විමර්ශනයක් සඳහා අධිකරණය ඉදිරියේ ලකුණු කළ මුල් ලේඛන කැඳවා නැත. (වි.1 ලේඛණය ද ඇතුළු ව) ඒ අනුව පෙනී යන්නේ පැ.44 දරණ ලේඛනය මඟින් පත් කර ඇති විශේෂ පරීක්ෂක මණ්ඩලයේ දී, හෝ මෙම නඩු පැවරීම ට පෙර සිදු කරන ලද වෙනත් කිසිදු විමර්ශනයක දී, මෙම අධිකරණයේ සලකුණු කරන ලද මුල් ලේඛන පරිශීලනය ට ලක් ව නැති බව යි. මෙය විමර්ශනයේ බරපතල අඩුපාඩුව කි. චූදිතගේ අයිතිවාසිකම් පිළිබඳ ව නොසලකා හැරීම කි.

65. ඉදිරිපත් තොරතුරු බුද්ධි තොරතුරු නොවීම හේතුවෙන් සහ බුද්ධි අංශයත් පොලිස්පතිවරයා යටතේ ක්‍රියාත්මක වීම හේතුවෙන් වර්ධනය කරගත යුතු තොරතුරු වර්ධනය කරවා ගැනීමේ වගකීම රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයාගේ වගකීමක් වීම හේතුවෙන් චූදිත විසින් තමා වෙත ලැබුණු තොරතුර සම්බන්ධ ව ක්‍රියා මාර්ග ගෙන ඇති බව පැහැදිලි ය. මෙම ක්‍රියා මාර්ග ගැනීම සඳහා යොමු කරන ලද නිලධාරීන්ගේ දැනීමේ මට්ටම පළපුරුද්ද අනුව බුද්ධි අංශයේ නිලධාරීන් හෝ ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කළ යුතු නිලධාරීන් තම වගකීම ඉටු කිරීම ට බැඳී සිටී.

සාක්ෂි අංක, 35

66. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීම සඳහා පැමිණිල්ලේ 35 වන සාක්ෂිකාර වර්තමාන බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඉදිරිපත් කරන ලද ලේඛන වල මුල් පිටපත් අනුසාරයෙන් පොලිස්පතිවරයා වෙත ලැබුණු තොරතුරු පිළිබඳ ව ක්‍රියා කළ යුතු ආකාරය සටහන් තැබීම මෙම සාක්ෂිකරුගේ සාක්ෂි මඟින් හෙළිදරව් කරන ලදී. පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද පොලිස්පතිවරයා ට යොමු කළ ලේඛන වල පොලිස්පතිවරයා ඒ හා සම්බන්ධ ගත යුතු පියවර සටහන් කරන ලද ලේඛන

වල එසේ සටහන් කිරීම පිළිබඳ ව හබයක් නැත. එම ලේඛන සැලකීමේ දී, සුදුසු ක්‍රියාමාර්ග ගැනීම ට මෙන් ම පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගෙන් හා නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගෙන් ප්‍රගති වාර්තා කැඳවීම ද චූදිත විසින් සිදු කර ඇති බව පැහැදිලි ය. මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී, වි.01 ලෙස ට චූදිත වෙනුවෙන් ලේඛනයක් ලකුණු කර ඇත.

67. එකී ලේඛනය හා සම්බන්ධ ව පැමිණිල්ලේ 35 වන සාක්ෂිකරු මෙසේ පිළිතුරු දී ඇත.[6]

"ප්‍ර: දැන් මහත්මයා පිළින්නවද රාජ්‍ය බුද්ධි අංශය, ජාතික බුද්ධි සේවාව විසින් අවසාන ප්‍රතිඵලය වෙන්න ඕන යම්කිසි අපරාධයක් වැළැක්වීම ට කටයුතු කිරීම කියලා?

උ: එහෙමයි. එයයි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ.

ප්‍ර: දැන් මහත්මයා පිළිගන්නවද මේ සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු හතර දෙනෙකු ට මේ තොරතුර දැනුම් දීමක් කරලා තිබුණයි කියලා?

උ: මම පිළිගන්නවා.

ප්‍ර: ප්‍රධාන වශයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරුන් කවුද?

උ: මේ ලිපියේ පොලිස්පති තුමා විසින් සටහන් යොදලා තියෙන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත හා රථ වාහන, ඒ වගේම අධ්‍යක්ෂබ විශේෂ ආරක්ෂක දිශාව, අධ්‍යක්ෂක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා කියලා මේකේ තියෙන්නේ.

[6] 2022 ජනවාරි 18 පෙ.ව.10.40 සටහන් 11 වන පිටුව සිට පෙ.ව.11.00 සටහන් තුන්වන පිටුව

ප්‍ර: දැන් මහත්මයා පළවෙනි අවස්ථාවේ කිවුවා එවකට හිටපු පොලිස්පතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාතට ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් කරලා තියෙන්නේ?

උ: කිව්වා ස්වාමිනි.

ප්‍ර: ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පිත බස්නාහිර පළාතට දැනුම් දීම් කිරීම තුළ ඒ පොලිස්පතිතුමාට ලැබුණු තොරතුරු සන්නිවේදන කිරීමක් කරලා තියෙනවා කියලා මහත්මයා පිළින්නවද?

උ: පිළිගන්නවා.

ප්‍ර: ඒ වගේම ඒ සන්නිවේදනයක් කිරීම නිසා ඒ තොරතුර සන්නිවේදනය නොකර නොකර හැරීමක් කරලා නෑ කියන එක මහත්මයා පිළිගන්නවද?

උ: තොරතුරක් සන්නිවේදනය කිරීමක් කර තිබෙනවා.

අධිකරණයෙන්:

(ගරු මහාධිකරණ විනිසුරු කේ.එම්.පටබැඳිගේ මැතිතුමා)

මෙම අවස්ථාවේ දී සාක්ෂිකරු සාක්ෂි දෙනු ලබන්නේ ලේඛනයක් සම්බන්ධයෙනි. ලේඛන සම්බන්ධයෙන් වාචික සාක්ෂි මෙහෙය විය නොහැකි බව ත්, ඒ ලේඛන අනුව සාක්ෂිකරු ඉදිරිපත් කර කරුණු බව විත්තියේ නීතිඥ මහතාගේ අවධානය ට යොමු කරනවා.

ප්‍ර: (ලේඛනයක් පෙන්වා සිටී.) දැන් මහත්මයාට මම පෙන්වා සිටිනවා වර්ෂ 2019.04.09 වෙනි දින ආරක්ෂක අමාත්‍යාංශය විසින් එවලා තිබෙන ලිපියක් සම්බන්ධයෙන්?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මහත්මයා මේක හඳුනාගැනීමක් කරනවාද?

උ: හඳුනාගැනීමක් කරනවා ස්වාමිනි.

ප්‍ර: එම ලේඛනය වි.01 වශයෙන් සලකුණු කර සිටී. මේ වි.01 කියන ලේඛනය දිහා බලලා කියන්න ආරක්ෂක අමාත්‍යාංශය විසින් කාටද එවලා තිබෙන්නේ?

උ: පොලිස්පතිවරයා ස්වාමිනි.

ප්‍ර: පොලිස්පතිවරයාට එවපු මේ වි.01 කියන ලේඛනය පොලිස්පතිවරයා විසින් නිලධාරින් හතර දෙනෙකුට යැව්වාය කියන එක මහත්මයා පිළිගන්නවා?

උ: පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: ඒ නිලධාරින් හතර දෙනාගෙන් පළවෙනි නිලධාරියා කවුරු වශයෙන්ද සිටියේ?

උ: බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා ස්වාමිනි.

ප්‍ර: ඊටපස්සේ කාටද ගියේ?

උ: විශේෂ කාර්ය බලකාය භාර නිලධාරියාට ස්වාමිනි.

අධිකරණයෙන්: (ගරු සභාපති මහාධිකරණ විනිසුරු නාමල් බණ්ඩාර බලල්ලේ මැතිතුමා)

ලකුණු කරන ලද පිටු 4 කින් යුත් වි.01 ලේඛනයේ සාක්ෂිකරු විසින් සහතික කරන ලද ඡායා පිටපතක් අද දින හෝ හෙට දින අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.

*********

ප්‍ර: දැන් මහත්මයා පිළින්නවාද මේ පොලිස්පතිතුමාට රාජ්‍ය බුද්ධි සේවයෙන් සහ ජාතික බුද්ධි සේවයෙන් ලබා දුන් තොරතුරු තමයි

එවකට සිටි පොලිස්පති මෙම නඩුවේ චූදිත අනෙක් පැත්තට ලබා දීලා තිබෙන්නේ කියලා?

උ: පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: එතකොට මහත්මයා කියන්න මේක නිශ්චිත කාරණයක් සම්බන්ධයෙන් නොවේ දීලා තිබෙන්නේ කියලා, එතකොට නිශ්චිත තොරතුරක් දීලා නැත්තේ මොන අංශයෙන්ද?

උ: රාජ්‍ය බුද්ධි සේවාව විසින් ජාතික බුද්ධි ප්‍රධානීන්ටත් ජාතික බුද්ධි ප්‍රධානීන් විසින් ඉන් අනතුරුව පොලිස්පතිතුමාටත් අප්‍රේල් මාසේ 04 වෙනිදා බැහැර කරපු තොරතුර නිශ්චිත බුද්ධි තොරතුරක් නෙමෙයි ස්වාමිනි.

ප්‍ර: කෙසේ හෝ මහත්මයා පිළිගන්නවා පොලිස්පතිතුමා විසින් මේ අදාළ අංශ දැනුවත් කළ නිසා තමයි මහත්මයාට මේ තොරතුර ලැබුණේ කියලා?

උ: පිළිගන්නවා ස්වාමිනි. ”

68. මෙමඟින් චූදිත වෙනුවෙන් උත්සාහ දරා ඇත්තේ හැකි සෑම අවස්ථාවක ම චූදිත තම රාජකාරිය ඉටු කළ බව ට සනාථ කිරීම ට බව පෙනී යයි.

69. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ දී හෙළිදරව් වූ පරිදි 2019 අප්‍රේල් 21 වන දින ප්‍රහාරයක් සිදු වන බව සාක්ෂිකරු පවා දැනගෙන නොසිටි කරුණක් බව පැහැදිලි ය. පැ.37 ලේඛනය හා පැ.37 (අ) ලේඛන සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ දී, සාක්ෂිකරු මෙසේ පිළිතුරු දී ඇත. [7]

“ප්‍ර: දැන් මේ තොරතුරේ යම්කිසි ආකාරයක බරපතලභාවයක් ඔබ පුද්ගලිකව නිරීක්ෂණය කලාද?

[7] 2022.01.18 දින සටහන් පෙ.ව.10.00, 07 පිටුව සහ පෙ.ව.10.20 සටහන් 1, 3 පිටු.

උ: නිරීක්ෂණය කලා ස්වාමිනී. එසේ වුවද එවකට පැවති වාතාවරණය තුල විශේෂයෙන්ම 2009 අවුරුද්දේ යුධ ජයග්‍රහණයෙන් පස්සේ මෙරට තුල පැවති සාමාකාමී වාතාවරණයත්, ඒ වගේම අන්තවාදී සංවිධානවල ක්‍රියාකාරීත්වය සම්බන්ධව මෙරට බුද්ධි අංශ සහ ආරක්ෂක අංශ විසින් අපිව දැනුවත් කිරීම සහ අපේ අවධානය යොමු කිරීමේ රටේ තිබිච්ච අඩුපාඩුවත් මත මෙවැනි ඉතාම බරපතල ගණයේ ප්‍රහාරයක් එල්ල වේය යන කාරණාව සම්බන්ධව අවධාරණය කිරීමත් මේ තොරතුරු අප වෙත යොමු කිරීමේදී වෙලා නැහැ ස්වාමිනී. විශේෂයෙන්ම මෙවැනි මෙම මූලිකව මා වෙත යොමු කරපු ලිපි කට්ටලය සහ ඒ අදාල ඇමුණුම්වල මෙය හඳුන්වා තිබෙන්නේ මෙය විය හැකි ප්‍රහාරයක් මිස පාස්කු ප්‍රහාරයක් කියලා කියන වචනයක් මෙහි සඳහන් වෙන්නේ නැහැ. පාස්කු ප්‍රහාරය කියන වචනය භාවිතා වීමත් එක්කම නිශ්චිත දවසක් එහිදී සඳහන් වෙනවා. දැන් 2019 වර්ෂයේ නම් ස්වාමිනී අප්‍රේල් මාසේ 21 වෙනිදා තමයි මේ ප්‍රහාරය සිද්ධ වුණේ. එතකොට දැන් වෙසක් පෝය, පොසොන් පෝය වගේම පාස්කු දවස කියලා කියන එක කවදද කැලැන්ඩරය බලද්දී ඕන කෙනෙකුට දැනගන්න පුළුවන් ස්වාමිනී. මේ තොරතුරේ නිශ්චිත දිනයක් පාස්කු දිනයක් පිළිබඳ සඳහනක් වෙන්නේ නැහැ. මෙය ඉදිරියේදී විය හැකි ප්‍රහාරයක් පිළිබඳව තමයි ඇවිල්ලා ඉවරවෙලා සඳහන් කරලා තියෙන්නේ. ඒකත් ඒ වගේම මේ ප්‍රහාරය පිළිබඳව රාජ්‍ය බුද්ධි ප්‍රධානියා වශයෙන් එවපු ලියුමේ සිංහල පරිවර්තනයක් මේ සමඟ අපිට එවා තිබුණා. එහි සඳහන් කරලා තිබෙනවා පැහැදිලිවම සහරාන් යන අය සමාජ ජාලා ගිණුම් ඔස්සේ සිය අනුගාමිකයන් අභිප්‍රේරණය කිරිමේදී මෙරට කතෝලික පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉලක්ක කරගන්නා ලෙසට නිශ්චිතව සඳහන් කල බවට මේ වන තෙක් නිරීක්ෂණය වී නොමැති නමුත් සියලු අන්‍යාගමිකයින් ඝාතනය කිරීම සඳහා උතුම් ආගමික කරුණක් බව ඔවුන්ගේ අනුගාමිකයින් විනාශ කරමින් ඉස්ලාමීය ප්‍රවර්ධනය කල යුතු බවත් සඳහන් කරමින් 2016 වර්ෂයේ සිට සමාජ ජාලා හා ආගමික දේශනා සඳහා සහරාන් අනුගාමිකයින් අභිප්‍රේරණය

කරන බවට නිරීක්ෂණය වී ඇත යනුවෙන් සඳහනක් තිබෙනවා ස්වාමිනී. එතකොට මේ තොරතුරේ ස්වාමිනී නිශ්චිතභාවය පිළිබඳ කිසියම් ප්‍රශ්නාර්ථයක් මේ තොරතුර මත ලැබී තිබෙනවා. එකක් මේ තොරතුර නිශ්චිතව එල්ල වන දිනයක් පිළිබඳ සඳහනක් නැහැ. අනිත් එක නිත්‍ය වශයෙන්ම මෙය සිදුවෙනවාය කියන කාරණාවක් මේක බැලීමෙන් පෙනෙන්නේ නැහැ. මේ පිළිබඳ කරුණු කාරණා සොයා බලලා තවදුරටත් සොයා බලලා මේ සම්බන්ධයෙන් ක්‍රියා කල යුතුයි කියලා මතයක් තමයි ලබා දීලා තිබෙන්නේ. එසේ ලබා දීමෙන් ස්වාමිනී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා විසින් සඳහන් කරනවා මෙය මහජනතාව දැන ගන්න නොතබා අනිසි බිය ගැන්වීමක් වන නිසා රහසිතගතව තබාගෙන පරීක්ෂා කරන්න කියලා ඉවරවෙලා. එතකොට එතනදි ඇවිල්ලා ඉවරවෙලා අපිට කල යුතු වන්නේ ස්වාමිනී අපි යටතේ ඉන්න මේ පිළිබඳව රහසිගතව සොයා බලලා යම් කිසි නිලධාරියෙක් වේ නම් ඔවුන්ට මේ සම්බන්ධයෙන් සොයා බලලා අපේ ප්‍රදේශයේ මෙවැනි දෙයක් සිද්ධ වෙනවද, මේ මිනිස්සු ගැවසෙනවද , මේ මිනිස්සු ඇවිල්ලා ඉන්නවද සම්බන්ධයෙන් සොයා බැලීමක් තමයි ස්වාමිනී අපි කල යුතු වෙලා තියෙන්නේ.

(අධිකරණයෙන් :-

(ගරු මහාධිකරණ විනිසුරු එම්.වයි.එම්.ඉර්ෂඩීන් මැතිතුමා විසිනි )

ප්‍ර: ඒ කියන්නේ සාක්ෂිකරු කියන්නේ එකී තොරතුර ප්‍රහාරය පිලිබඳව අහවල් දිනයේ අහවල් ස්ථානයේ ප්‍රහාරය වෙනවා කියලා තිබුනා නම් පොලිසියට තිබුනා නේද එය වලක්වා ගන්න ?

උ: නෑ ස්වාමිනි. මෙවැනි තොරතුරක් සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමක් අපිට කරන්න පුලුවන්. ඒකෙදිත් පැහැදිලි උපදෙසක් ලබා දීලා තියෙනවා මේක මහජනතාවට දැනුවත්

කිරීමක් කරලා මහජනතාව අනිසි බිය ගැන්වීමක් කරන්න එපා කියලා.

ප්‍ර: නෑ නෑ මගේ ප්‍රශ්නය ඒක නෙවෙයි සාක්ෂිකරු විසින් දුන්න උත්තරය මත තමයි මම ප්‍රශ්න අහන්නේ හරිද ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: සාක්ෂිකරු කිව්වානේ පාස්කු ප්‍රහාරයක් කියලා කිව්වේ නැහැ කියලා ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: පාස්කු දිනයේ වෙනවා කියලා කිව්වේ නැහැ කියලා ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: අනිවාර්යයෙන් වෙනවා කියලා කිව්වේ නැහැ කියලා ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: විය හැකි භාවයක් තිබෙනවා , දිනයක් නැහැ ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: එහෙම කටයුතු කරන්න බෑ කියලානේ කියන්නේ ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: මගේ ප්‍රශ්නය මහජනතාව බියට පත් කරන්න ඒ නිසා ඕනෑ නැහැ ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: මම අහන්නේ එතකොට අනිවාර්යයෙන් ම අහවල් දිනයේ අහවල් වේලාවේ අහවල් ස්ථානයේ සිද්ධ වෙනවයි කිව්වාම තියෙනවා පාස්කු ප්‍රහාරය ?

උ: එසේ දැනුම් දීමක් කලා නම් ස්වාමිනි අනිවාර්යයෙන් ම එය වලක්වා ගැනීමට උත්සාහයක් දැරිය යුතුව තිබුනා ස්වාමිනි.

ප්‍ර: ඒක තමයි, එසේ දැනුම් දීමක් කලා නම් තිබුනා ඕක වලක්වා ගන්න එහෙම වියහැකි භාවයක් ගැන බුද්ධි තොරතුරක් ආවොත් ඒක සොයා බලලා කටයුතු කරන්න බෑ කියලාද කියන්නේ ?

උ: බැරිකමක් පිලිබඳව නෙවෙයි ස්වාමිනි මම සඳහන් කරන්නේ. ඒකේ තියෙන හැකියාව පහළ මට්ටමක තිබෙන්නේ ස්වාමිනි. මෙහි නිශ්චිත දිනයක් සඳහන් කරලා නැත්නම් ස්වාමිනි මේ කාරණාව සිදූ වෙනවාය කියන කාරණාව අවධාරණය කරන්නෙත් නැත්නම් ස්වාමිනි මේ ලැබිච්ච තොරතුර නිශ්චිත තොරතුරක් ලෙස සළකන්න බෑ ස්වාමිනි. එවැනි තොරතුරක් නෙවෙයි මේක. මේක ඇවිල්ලා විය හැකි ප්‍රහාරයක් පිලිබඳ තොරතුරක්. මේක වකවානුවකින් තොරව කවදා හෝ කවර දවසක හරි වෙන්න පුලුවන්. මෙවැනි තොරතුරු ස්වාමිනි දෛනිකව පොලිස් නිළධාරීන් වන අපිට නිරන්තරයෙන්ම ලැබෙනවා. මේ සංවිධානය පිලිබඳව විතරක් නෙවෙයි නොයෙකුත් සංවිධාන, අපරාධ කණ්ඩායම් පිලිබඳ ව තොරතුරු ලැබෙනවා. සංවිධානාත්මක අපරාධ කල්ලි හෝ වේවා වෙනත් අන්තවාදී කල්ලි විසින් හෝ වේවා යම්කිසි දේවල් කරන්න පුලුවන්. මේ අය මේ මේ විදියේ ප්‍රහාර ලෝකයේ තැන් තැන්වල එල්ල කරලා තිබෙනවා. ඒ නිසා මේවා සම්බන්ධයෙන් අවධානයෙන් ඉඳලා මේවා වලක්වන්න ක්‍රියා

කරන්න කියන තොරතුරු අපිට ලැබෙනවා ස්වාමිනි. එතකොට ඒක ඉලක්ක කරගෙන ඇවිල්ලා නිශ්චිත ක්‍රියා මාර්ග ගන්න බෑ. ඒකයි ස්වාමිනි මා අදහස් කලේ.''

70. ඒ අනුව, එම ලිපිය ලැබෙන අවස්ථාවේ පවා පාස්කු ප්‍රහාරයක් හා සම්බන්ධ ව අවබෝධයක් සාක්ෂිකරු හට ද තිබී නැත. වැඩිදුරටත් හෙළිදරව් වන්නේ, නිශ්චිත තොරතුරක් නොමැති ව මහජනයා බිය වැද්දෙන ආකාරයේ පියවර ගැනීම ට ද නිලධාරීන් ට හැකියාවක් නැති බව යි.

71. වැඩිදුරටත් මෙ සම්බන්ධ ව සාක්ෂි දෙමින් අධිකරණයෙන් විමසන ලද පැනයන් ට මෙසේ පිළිතුරු දී ඇත.[8]

''අධිකරණයෙන් :-

(ගරු මහාධිකරණ විනිසුරු එම්.වයි.එම්.ඉර්ෂඩීන් මැතිතුමා විසිනි )

ප්‍ර: තමුන් ඒ කාලය වනවිටත් බස්නාහිර පළාත් උතුර පළාත භාර ව සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හැටියට තමුන්ට මේ ලිපිය හා මේ ඇමුණුම දැක්කාම ඒ කියන්නේ බස්නාහිර පළාත් භාර ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ගේ ලිපිය සහ ඊට අමුණා ඇති මේ ඇමුණුම දැක්කාම කියවලා බලලා ඒකේ බැරෑරුම් කම සහ බරපතලකම තේරුම් ගත හැකි විශේෂඥයෙක් කියලා කිව්වොත් තමුන් ඒක පිලිගන්නවාද ?

උ: ස්වාමිනි මට කරුණු පැහැදිලි කරන්න පොඩ්ඩක් අවස්ථාවක් දෙන්න.

[8] 2022.01.18 වන දින සාක්ෂි සටහන්හි පෙ.ව.10.20, 12, 13 පිටු

ප්‍ර: නෑ ඒක පිලිගන්නවාද නැද්ද කියලා ඊටපස්සේ ඕනෑ කරුණක් පැහැදිලි කරන්නකෝ තමුන් නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හැටියට අවුරුදු ගණනක් සේවය කරලා තියෙනවා මේ ලිපිය සහ ඊට අමුණා ඇති මේ ලියුම දැක්කාම ඒක කියවලා බලා ඒකේ බැරෑරුම් කම සහ බරපතලකම තේරුම් ගත හැකි විශේෂඥයෙක් කියලා කවුරු හරි කිව්වොත් තමුන් ඒක පිලිගන්නවාද ?

උ: මම පිලිගන්නවා ස්වාමිනි. මම කරුණු පැහැදිලි කරන්නම් ස්වාමිනි.

ප්‍ර: පැහැදිලි කරන්න ?

උ: මම පොලිස් අධිකාරීවරයෙක් ලෙස නුගේගොඩ පොලිස් කොට්ඨාශයේ අවුරුදු 05 ක් සේවය කලා. ඒ කාලයේදී යුද්ධයේ දරුණුතම අවධියේදී මම සේවය කලේ. එතකොට මෙවැනි ආකාරයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මරාගෙන මැරෙන ප්‍රහාර හා නොයෙකුත් ත්‍රස්තවාදී ප්‍රහාරයන් සම්බන්දයෙන් තොරතුරු ලැබුනු අවස්ථා එමටයි ස්වාමිනි. එම අවස්ථාවලදී එම තොරතුරු ලැබුනාට පස්සේ ආරක්ෂක අමාත්‍යාංශයේත් පොලිස් මූලස්ථානයේත් ක්‍රියාත්මක වුනේ කෙසේද කියන කාරණාව සම්බන්ධයෙන් මට ඉතාමත්ම ප්‍රායෝගික අත්දැකීම් තිබෙනවා. අපි රාත්‍රී කාලයේදී පවා හදිසි අවස්ථා වලදී ආරක්ෂක අමාත්‍යාංශයට කැඳවනවා. පොලිස් මූලස්ථානයට කැඳවනවා. එවැනි නිශ්චිත ප්‍රහාර වලක්වා ගැනීම සඳහා පොලිසිවල ඕ.අයි.සී. ලාව අපි රෑ කැඳවලා පසුවදා නැත්නම් අලුයම ඉඳලා ආරක්ෂක සැලසුම් ක්‍රියාත්මත කරපු අවස්ථා මගේ මතකයේ තිබෙනවා. ඒ අනුව මෙම ලිපිය මා අතට ලැබෙන විට මේ සම්බන්ධයෙන් යොදලා තිබෙන අවධානය

සම්බන්ධව විශේෂයෙන් රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානියාගේ ලිපිය කියවීමෙන් මෙය නිශ්චිත නොවූ ස්වභාවය සහ ඒ වගේම මෙය ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා විසින් යොදලා තිබෙන සටහන අනුව මහජනතාව තුළ කැළඹවීමක් ඇති කරන්නේ නැතිව කරලා තිබෙන කාරණාවත් තුළ මේ සම්බන්ධයෙන් නිළධාරීන්ට මේක යොමු කරලා කරුණු සොයා බැලීම විනා නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හැටියට මේ සම්බන්ධයෙන් මීට වැඩිය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව අඩුයි. ඒත් එක්කම මට පැහැදිලි වම හැඟීමක් ඇති වුනා මේ සම්බන්ධව ඉතාම හදිසි හා තදබල අවශ්‍යතාවයක් එහෙම නැත්නම් තදබල අනතුරක් අනතුරුදායක තත්ත්වයක් මේ 21 වෙනිදා වෙනකොට මේ වගේ ඛේදවාචකයක් වෙන්න පුලුවන් තත්ත්වයක් මේ ලිපිය තුළ එවැනි බරක් මේ තුළ නැති බවක් මට හැඟී ගියා ස්වාමිනි.”

සාක්ෂි අංක, 01

72. නඩුව ට විෂයගත චෝදනා 2019 අප්‍රේල් 21 වන දින ස්ථාන හයක සිදු වූ බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙ නි. එනම්, පාස්කු ප්‍රහාරය ලෙස හැඳින්වෙන ස්වයං ඝාතන බෝම්බ පුපුරුවා ගැනීම යි. මෙම සිදු වීම හා සම්බන්ධයෙන් රැස් කර ගත් තොරතුරු සහ බුද්ධි තොරතුරු, ඒවා සන්නිවේදනය කළ පුද්ගලයින් සහ ආකාර පිළිබඳ ව සාක්ෂි දීම ට එවක ට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී නිලන්ත ජයවර්ධන යන අය සාක්ෂිය ට කැඳවන ලදී.

73. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩ ගමගේ නිලන්ත ජයවර්ධන යන අය, පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂි ලැයිස්තුවේ පළමු සාක්ෂිකරු ය. එම සාක්ෂිකරු 2021.11.23 සිට 26 සහ 29 යන දිනයන් හි දී, සාක්ෂි ඉදිරිපත් කර ඇත. මෙම සාක්ෂිකරු චෝදනාවන් ට අදාල කාලයේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වශයෙන් රාජකාරී කර ඇත. නඩුව

ට විෂය ගත ප්‍රහාරයෙන් අනතුරු ව වෙනත් අධ්‍යක්ෂකවරයෙකු පත් කරන තෙක් මෙම අය මෙම තනතුරේ රාජකාරී කර ඇත.

74. මෙම නිලධාරියාගේ පත් වීම, සුදුසුකම් සහ පළපුරුද්ද, ඔහුගේ රාජකාරිය යන කරුණු සම්බන්ධයෙන් ද, රාජ්‍ය බුද්ධි සේවාවේ ව්‍යුහය, රාජ්‍ය බුද්ධි සේවා ව ක්‍රියාත්මක වන පිළිවෙල නිලධාරීන්ගේ සංයුතිය සහ ඉහළ සිට පහළ නිලධාරීන් දක්වා වූ නිලයන් සම්බන්ධ ව සාක්ෂි මෙහෙය වන ලද අතර ඒ පිළිබඳ ව කිසිදු හබයක් නැත. මෙම සාක්ෂිකරු හෙළිදරව් කරන ලද කරුණක් වූයේ තමන් ට ඍජුව ම ජනාධිපතිවරයා හැරුණු විට ආරක්ෂක ලේකම් සමඟ ගණු දෙනු කිරීමේ හැකියා ව ඇති බවත්, එසේම අවශ්‍ය අවස්ථාවන් වල දී, පොලිස්පතිවරයා සමඟ ඍජුව ම සම්බන්ධතා පැවැත් වීම ට ඇති හැකියාව පිළිබඳ ව ද, සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

75. ලේඛන නැතිනම්, තොරතුරු ඉදිරිපත් කිරීමේ දී එම ලේඛන වල යොදන යෙදුම් ලෙස රහස්‍ය ගතයි / අති රහස්‍ය ගතයි / ඇස් වල ට පමණයි (eyes only) යනා දී යෙදුම් පිළිබඳ ව, සාක්ෂි මෙහෙය වීමේ දී ප්‍රශ්න කර ඇත.

76. රහස්‍ය ලෙස දක්වන්නේ, අති රහස්‍ය ගණය ට නොවැටෙන තොරතුරු ඇතුළත් ලේඛන සම්බන්ධයෙන් බව සාක්ෂිකරු පැහැදිලි කර යි. අති රහස්‍ය එසේ නැතහොත් Top secret ලෙස සඳහන් කරන අවස්ථා සම්බන්ධ ව ද, පැහැදිලි කරන ලදී. එවැනි තොරතුරු බාහිරය ට නිරාවරණය වීමෙන් දැඩි අගතිදායක තත්ත්වයක් ඇති විය හැකි තොරතුරු එම ලේඛන වල ඇතුළත් නම් එය අති රහස්‍යගත ලේඛන ලෙස හඳුන් වන අතර රහසිගත ලේඛන ලෙස හඳුන්වන ලේඛනයන් ගේ තොරතුරු වල ට වඩා අඩු වටිනාකම් සහිත තොරතුරු සඳහා එසේ යොදන බව ට සාක්ෂිකරු පැහැදිලි කර ඇත. ඇස් වල ට පමණයි (Eyes Only) යෙදුම සහිත ලිපි පරිශීලනය කරන්නාගේ දෙනෙත ට එසේ නැතහොත් ඔහුගේ පරිශීලනය ට පමණක් යොදවා ගෙන එය ලබන්නා අදාළ ලේඛනය බලා ඒ සම්බන්ධයෙන් කිසිවෙකුටත් දැනුම්

නොදී පියවර ගන්නා අවස්ථා සඳහා යොදන යෙදුමක් බව ට සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

77. වැඩිදුරටත් සාක්ෂිකරු රාජ්‍ය බුද්ධි සේවාවක පරමාර්ථය පිළිබඳව ද, පැහැදිලි කර ඇත. රාජ්‍ය බුද්ධි සේවාවක ප්‍රධානත ම කාර්යය රටේ ජාතික ආරක්ෂාවක ට එල්ල විය හැකි සහ එල්ල වන තර්ජන හඳුනා ගෙන ඒ පිළිබඳ ව තොරතුරු සොයා බලා එම තොරතුරු බුද්ධි තොරතුරු ලෙස වර්ධනය කිරීම බවත්, එසේ වර්ධන ය කිරීමෙන් අනතුරු ව ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අංශ වෙත යොමු කිරීම බව ත්, සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

78. මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු සිය මූලික සාක්ෂියේ දී, මෙසේ ප්‍රකාශ කර ඇත.[9]

"ප්‍ර: නෑ මම අහන්නේ අභ්‍යන්තර ව්‍යුහය නොවෙයි. මම අහන්නේ රාජ්‍ය බුද්ධි සේවය කාගේ අධීක්ෂණය යටතේ ද තිබෙන්නේ ඒ ඔබගේ තොරතුරු රැස් කිරීම වාර්තා කරන්නේ කෙසේද යන කාරණය?

උ: ස්වාමිනි ආරක්ෂක ලේකම්තුමාට සෘජුව වග කියනවා පෙර සඳහන් කළ පරිදි ම ඒ වගේම ඇක්ෂනබල් ඉන්ටලිජන්ස් සෙකනේඩ් ක්ෂණික පියවරක් ගත යුතු තොරතුරු සම්බන්ධයෙන් පොලිස්පතිතුමාව දැනුවත් කරනවා. ඊට අමතර ව ජාතික බුද්ධි නිලධාරිතුමාව ද දැනුවත් කරනවා. ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවාවට තොරතුරක් ලැබුණාම අපි එය බුද්ධි තොරතුරක් බවට පත් කරලා ආරක්ෂක ලේකම්තුමා වෙත ඉදිරිපත් කරනවා. ඒ වගේම යම් කිසි එම තොරතුරට වහා ක්‍රියාමාර්ගයක් ගත යුතු නම් අපි එය සම්බන්ධව නීතිය හා සාමය රකින පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස්පතිතුමා වෙත යොමු කරනවා. උදාහරණයක් විදියට හෙට අපිට තොරතුරක් ලැබෙනවා නම් ස්වාමිනි කොළඹ වටලලා ප්‍රොටෙස්ට් එකක් තියෙනවා කියලා ස්වාමිනි අපි එය

[9] 2021.11.23 දින සටහන් පෙ.ව.9.40 පිටුව 5 – 6 සහ 2021.11.23 දින සටහන් පෙ.ව.9.40, පිටුව 7-8

ආරක්ෂක ලේකම්තුමාට කියලා ඉන්නේ නැහැ ස්වාමිනි අපි පොලිස්පතිතුමාට දැනුවත් කරනවා මේ වගේ සෙනඟක් මේ වගේ එන්න පුළුවන් කියලා අදාළ පියවරයන් ගැනීම සඳහා. ඒ වගේම අපි ජාතික බුද්ධි ප්‍රධානී මහතාගේ කාර්යාලයටත් ඒ පිළිබඳ දැනුවත් කරනවා ස්වාමිනි.

ප්‍ර: දැන් භූමියේ සිටින නිලධාරියෙකුට ලැබෙන තොරතුරක් බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය වන්නේ කවර ක්‍රමවේදයකටද?

උ: ස්වාමිනි එය සංකීර්ණ ක්‍රියා දාමයක්. රාජ්‍ය බුද්ධි සේවය තමයි මම හිතන්නේ ලෝකයේ ලංකාවේ තියෙන හොඳම රෙජිස්ට්‍රි එක තියෙන්නේ. රෙජිස්ට්‍රිය කියන්නේ ලේඛනාගාරය ස්වාමිනි. අපිට බොහෝදත්ත තියෙනවා ස්වාමිනි යම්කිසි තොරතුරක් ලැබුණොත් ඒ තොරතුර හරිද වැරදිද තොරතුරේ විශ්වාසදායක භාවය කෙසේද යන්න කියලා සොයා බලන්න ස්වාමිනි. යම්කිසි පහත් තලයේ පහතම නිලධාරියෙක් වුණත් ස්වාමිනි අපි ඒ නිලධාරීන් ව යොදවලා තියෙන්නේ යම්කිසි ඉලක්කයක් ගැන කන්සිඩර් කරලා ඒ ඉලක්කය ජාතික ආරක්ෂාවට අදාළයි කියන නිර්ණායකයට ඇවිල්ලා ඒ අනුව තමයි එම නිලධාරියා පුහුණු කරලා තියෙන්නේ එතකොට එම නිලධාරියා පවත්වාගෙන යන තොරතුරුකරුවන් සම්බන්ධයෙන් අපි විවිධ ෆයිල්ස් මේන්ටේන් කරනවා. ඒගොල්ලො කොච්චර අපිට තොරතුරු දීලා තියෙනවාද ඊටපස්සේ ඒ තොරතුර ඊට එහා පරිබාහිර තොරතුරුකරුවන් ගෙන් වෙරිෆයි වෙනවාද ඒ වගේ සංකීර්ණ ක්‍රියාවලියකින් පස්සේ තමයි ස්වාමිනි තොරතුරක් බුද්ධි තොරතුරක් කරන්නේ. ඒ අනුව පියවරයන් කිහිපයක් ගැන පරිබාහිර නිලධාරියෙක්ගෙන් බුද්ධි තොරතුර ඒ අනුව අපි තොරතුර බුද්ධි තොරතුරක් බවට පත් කරනවා ස්වාමිනි.”

79. ඉහත කරුණු අනුව රාජ්‍ය බුද්ධි සේවාව ට ලැබෙන තොරතුරක් බුද්ධි තොරතුරක් බව ට පරිවර්තන ය කරවා ගැනීමේ දී, සිදු කරන්නා වූ ක්‍රියාදාමය පැහැදිලි ය.

80. මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වූයේ, රාජ්‍ය බුද්ධි සේවයේ රාජකාරිය තොරතුරු සහ බුද්ධි තොරතුරු රැස් කිරීම, තොරතුරු බුද්ධි තොරතුරු බව ට පරිවර්තනය කිරීම සහ ඒවා නියමිත අංශ වෙත ලබා දීම වන අතර, ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර සම්බන්ධ ව භූමියේ ක්‍රියාත්මක කිරීමේ වගකීමක් සහ පහසුකමක් ඔවුන ට නොමැති බව යි. තව ද, බුද්ධි නිලධාරියෙකු රාජකාරී කිරීමේ දී කිසිදු අවස්ථාවක තමා බුද්ධි නිලධාරියෙකු ලෙස හෙළිදරව් නොවන පරිදි විවිධ ස්වරූපයන්ගෙන් පෙනී සිටීම ද පැහැදිලි කර ඇත.

81. වැඩිදුරටත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ දී, නිලධාරීන් ට උපදෙස් දෙන්නේ සුදු පැහැති පසු බිමක සුදු පැහැති ලෙස පෙනී සිටීමෙන් සහ කළු පැහැති පසු බිමක කළු පැහැයෙන් පෙනී සිටීම ට බවත් ය. ඒ අනුව රාජකාරීමය වශයෙන් බඳවා ගන්නා බුද්ධි සේවාවේ නිලධාරීන් පොලිස් නිලධාරීන් වුව ද ඔවුන ට එම අනන්‍යතාවය කිසිදු විටෙකත් හෙළිදරව් කිරීම ට නොහැකි බවත්, අඩු තරමින් ඔවුන් භාරයේ පොලිස් හැඳුනුම්පතවත් තබා ගැනීම සිදු නොකළ යුතු බව ට නිලධාරීන් ට උපදෙස් දී ඇති බව ට සාක්ෂිකරු හෙළිදරව් කර ඇත. එසේ නොමැති ව ඔවුන් පොලිස් නිලධාරීන් ලෙස සේවය කළහොත්, ඔවුන්ගේ රහස්‍යභාවය හෙළිදරව් වන හෙයින් මෙවැනි විවිධ උපක්‍රම අනුගමනය කරන බව සාක්ෂිකරු පැහැදිලි කර ඇත. ඒ අනුව වැඩිදුරටත් පැහැදිලි කර ඇත්තේ, පොලිස් සේවාවෙන් බුද්ධි සේවාව ට නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් අනතුරු ව සම්පූර්ණයෙන් ම ඔවුන්ගේ බාහිර අභ්‍යන්තර ස්වභාවයන් වෙනස් වීම සම්බන්ධයෙනි.

82. වැඩිදුරටත් මෙම නිලධාරීන් ට පුහුණුව ලබා දෙන ආකාරය පිළිබඳ ව ද ඒවා දෙස් විදෙස් පුහුණු පාඨමාලා බව ට ද මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

83. තොරතුරු රැස් කිරීම පිළිබඳ ව පැහැදිලි කරමින් මූලස්ථානය ට අනුයුක්ත කිරීම් ඒ ඒ පළාත් වල ට අනුයුක්ත කිරීම් සහ ඔවුන්ගේ වගකීම කෙසේ පැවරී ඇත් ද යන්න සහ ධූරාවලිය යටතේ නිලධාරින් ක්‍රියා කරන ආකාරය පැහැදිලි කර ඇත. තොරතුරු රැස් කිරීමේ දී, ඒවා විවිධ අංශ යටතේ රැස් කරන බවත්, ඒ ඒ අංශයන් ට කේත නාමයන් ලබා දී, ඇති අතර ඒ සියළු අංශයන්ගේ ප්‍රධානියා තමා බවත් මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

84. ප්‍රාදේශීය වශයෙන් යම් ක්ෂණික ව ක්‍රියාත්මක විය යුතු තොරතුරක් ලැබුණොත් එය ක්‍රියාත්මක කරන ආකාරය සාක්ෂිකරු මෙසේ පැහැදිලි කර ඇත.[10]

“ප්‍ර: ප්‍රාදේශීය වශයෙන් යම් ක්ෂණිකව ප්‍රතිචාරයක් දක්වන්න ඕන බුද්ධි තොරතුරක් නිශ්චිත වශයෙන් ලැබුණොත් ඒ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කිරීම සිදු වන්නේ කවර ක්‍රමවේදයකට ද?

උ: ස්වාමිනි. බුද්ධි තොරතුරක් මම පෙර ප්‍රකාශ කරපු විදියට තොරතුරක් ලැබුණහම ස්වාමිනි, ඒක ඉහල නිලධාරින්ට ඒ කියන්නේ එතකොට අපි ඒ ගැන කථා කළ යුත්තේ දිසා බුද්ධි අංශය කියලා ස්වාමිනි, දිසා බුද්ධි අංශයේ ස්ථානාධිපතිට දුන්නම එම තොරතුරේ validity එක මෙහේ කොළඹට කථා කරලා කොළඹ මූලස්ථානයේ ලේඛනාගාරයේ තිබෙන පෙර දත්ත සමඟ සන්සන්දනය කරලා මේකේ පසුබිමත් සමඟ තමයි ස්වාමිනි වෙන්නේ. එතකොට මූලස්ථානය මඟින් තමයි ස්වාමිනි, බොහෝ වේලාවට තොරතුර බෙදා හරින්නේ. ඒවගේ හදිසියේ යම්කිසි හදිසියේ ප්‍රශ්නයක් තිබෙනවා නම් මූලස්ථානය දැනුවත් කළාම මූලස්ථානයෙන් කියනවා ගිහිල්ලා වහාම අදාළ ප්‍ර

[10] 2021.11.23 සාක්ෂි සටහන් 9.55, 8,9 පිටු

දේශයේ senior DIG ට හරි එවගේ නිලධාරින් දැනුවත් කරන්න කියලා එහෙම උපදෙස් දීපු අවස්ථාත් තිබෙනවා ස්වාමිනි. බොහෝ වේලාව සියලුම තොරතුරු සම්ප්‍රේෂණය වන්නේ කෙළඹ කාර්යාලයෙන් ස්වාමිනි. නැත්තම් ඒකෙදී රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ට විවිධ ආයතන වලින් handle කරන්න අවස්ථාවක් ලබා දීලා තිබුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය බුදධි නිලධාරින් තම ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධීකරණයෙන් තමයි ඒ කටයුතු කළ යුත්තේ?

උ: බොහෝ වෙලාවට එසේ අපි කරනවා ස්වාමිනි, අපි ප්‍රාදේශීය බුද්ධි සම්මන්ත්‍රණවලට යන්න කියනවා. ඒවත් එක්ක සම්බන්ධ වෙන්න කියනවා. එහෙම තියෙන අවස්ථා වලදී. අපි තොරතුරු දෙන්නේ ස්වාමිනි, බොහෝ වේලාවට ගැටලු ඇති වෙච්ච අවස්ථා තිබුණා ස්වාමිනි, අපි යම්කිසි තොරතුරක් ලබා දුන්නොත් උදාහරණයක් විදියට මට කියන්න පුළුවන් ස්වාමිනි, අපි එක සැරයක් කෙලින්ම ලිව්වා හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කෙනෙක්ට මේ අහවල් නිලධාරියෙක්ගේ හැසිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ කීර්ති නාමයට සහ පොලිස් දෙපාර්තමේන්තුවේ මහජන සාමයට බලපෑමක් වෙන්න පුළුවන් කියලා අන්තිමට ඒ මම ලියපු කොළේ එම නිලධාරියාගේ අතේ තිබුණා ස්වාමිනි, එම නිලධාරියාගේ Face book එකේ දාලා මට බැනලා තිබුණා, ඒ වගේ අවස්ථාවක අපි විශේෂයෙන් පොලිස්පතිතුමා හරහා තමයි බොහෝ වෙලාවට තොරතුරු සම්ප්‍රේෂ්ණය කරන්නෙ, එහෙම වුණ ගමන් ස්වාමිනි, අපේ නිලධාරින්ගේ ආරක්ෂාව පිළිබඳ දැඩි තර්ජන එනවා. මොකද එම නිලධාරින් ඒ ground එකේම ඉඳලා කරන්නේ. ඒක හින්දා අපි බොහෝ වෙලාවට ඒ රහසිගතභාවය රැකීම සඳහා කොළඹ head

quarts හරහා සම්ප්‍රේෂණය කිරීම ස්වාමිනි, බොහෝ වේලාවට සිදු කරනු ලබන්නේ.

ප්‍ර: දැන් ඔබ කියපු උදාහරණය පොලිස් දෙපාර්තමේන්තුවට සම්බන්ධ ඉහළ නිලධාරින් සම්බන්ධයෙන් යම් ආකාරයක බුද්ධි තොරතුරක් ලැබුණොත් එය ආරක්ෂක ලේකම්වරයා හරහා නොව සෘජුවම ඔබට පුළුවන්ද පොලිස්පතිවරයාට සන්නිවේදනය කරන්න?

උ: ස්වාමිනි, පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල් කෙනෙක් හෝ සාජන් කෙනෙක් වගේ නිලයක තොරතුරක් අපිට ලැබුණොත් අපි එය පොලිස්පතිතුමා හරහා සම්ප්‍රේෂණය කරනවා ස්වාමිනි, එසේ නැතිව ඉහළ තලයේ නිලධාරියෙක් පිළිබඳව ලැබුණොත් අපි එය ආරක්ෂක ලේකම්තුමා වෙත සම්ප්‍රේෂණය කරලා සාකච්ඡා කරනවා ස්වාමිනි.”

85. වැඩිදුරටත් ඕනෑම අංශයක් වෙත ලැබෙන තොරතුරුවල වෙනසක් නොමැති කරුණ ද මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇති අතර ඒවා ක්‍රියාත්මක කරන ආකාරය සහ වැඩි දියුණු කරන ආකාරය පිළිබඳ ව මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

86. තොරතුරු රැස් කිරීමේ දී, බාහිරින් සහ අභ්‍යන්තර ව තොරතුරු රැස් කරන ආකාරය එනම්, යම් සංවිධානයක තොරතුරු රැස් කිරීමේ දී, එහි සාමාජිකයෙකු ලෙස බැඳී තොරතුරු රැස් කිරීම මෙන් ම ආගමික මතවාද වැනි දෑ වල දී, නිලධාරින් අදාළ ආගම් පවා ඉගෙන ගැනීම ට කටයුතු කර ඇති ආකාරය පිළිබඳ ව ද සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

87. රාජ්‍ය බුද්ධි සේවාවේ ආරම්භය 1940 - 1941 වර්ෂයේ පමණ පටන් වෙනස්වීම් සහ වර්ධනයන් ට ලක් ව ඇති අතර මෙම සිද්ධිය ට අදාළ කාලයේ එය වෘත්තීය මට්ටමක තිබුණු ආකාරය ද, පැහැදිලි කර ඇත.

88. තමා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කිරීමේ දී, ISIS ත්‍රස්තවාදය ලොව පුරා බිහි වී පැතිරීම පිළිබඳ ව හඳුනා ගන්නා ලද අතර, ඒ සම්බන්ධයෙන් 2015 වර්ෂයේ පමණ සිට තමා ක්‍රියා කළ අතර, ඊට නිලධාරීන් පවා පුහුණු කිරීම ද ඒ සඳහා දෙස් විදෙස් පුහුණුවීම් ලබා දුන් ආකාරය ද පැහැදිලි කර ඇත.

89. 2017 වර්ෂය වන විට මේ සම්බන්ධ පුද්ගලයින් හඳුනා ගත් බව ත්, ඒ අනුව දිගින් දිග ට තොරතුරු රැස් කිරීම පිළිබඳ ව ද, මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

90. මෙම සිද්ධිය හා සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීමේ දී, පුද්ගලයින් සිරියාව ට පවා ගොස් පුහුණුවීම් ත්‍රස්තවාදී ක්‍රියා සඳහා සම්බන්ධ වූ ආකාරය පිළිබඳ ව හඳුනා ගන්නා ලද කාරණාව සාක්ෂිකරු හෙළිදරව් කරන ලදී.

91. මෙහි දී, ජියාඩ් යන සංකල්පයෙන් මීට අදාළ කාරණා ආරම්භ වී ඇති බව ත්, එනම් මුස්ලිම් රාජ්‍යයක් බිහි කිරීමේ සංකල්පය නැතහොත් මුස්ලිම් ලෝකයක් බිහි කිරීමේ සංකල්පය සිරියාවෙන් පටන් ගෙන කටයුතු කිරීම ISIS සංවිධානය කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

92. මෙම සංකල්පය ශ්‍රී ලංකාව ට සම්ප්‍රේශණය වීම ත්, මෙම සංකල්පය ආගමික අන්තවාදයක් නොව ඉස්ලාම් ආගමිකයන් එය අන්තවාදීන් ලෙස සැලකීමේ දී, ඇති වූ කාරණාවක් බව ත්, ඒ සඳහා අන්තවාදී පිරිස් කටයුතු කළ ආකාරයත් මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

93. 2015 වර්ෂයේ සිට මේ සම්බන්ධයෙන් කටයුතු කිරිමේ දී, 2016 වර්ෂය වන විට නෞෆර් මවුලවී පිළිබඳ දැනගත් බව ත්, 2017 ජූලි මාසය වන විට 94 දෙනෙකු ලංකාවෙන් සොයා ගත් බව ත්, පසුව 2015 සිට 2019 වන කාලය වන විට මේ හා සම්බන්ධව වාර්තා 340 ක ට වඩා ප්‍රමාණයක් සකස්

කර ඇති අතර ආරක්ෂක අමාත්‍යාංශයේ සාකච්ඡා වල ට ද, පොලිස් මූලස්ථානයේ වූ සාකච්ඡා වල ට ද නිරන්තරයෙන් ම තමා සහභාගී වී මේ පිළිබඳ ව දැනුවත් කළ අතර, ඒ හා සම්බන්ධ වාර්තා ඉදිරිපත් කිරීම පැහැදිලි කර ඇත.

94. සහරාන් යන අය ට පෙර ෂයිනි, රිල්වාන් යන අය පිළිබඳවත් සොයා ගත් බව ත්, සහරාන් යන අය මේ සඳහා මැදිහත් වූ ආකාරයත් සාක්ෂිකරු හෙළිදරව් කර ඇත. 2019 ජනවාරි 29 වන දින විට සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ට මේ හා සම්බන්ධ ව පුද්ගලයින් 124 දෙනෙකුගේ නම් ලැයිස්තුවක් ලබා දී ඇති බව සාක්ෂියෙන් පෙනී යයි.

95. මෙම ISIS මතවාදය රට තුළ ව්‍යාප්ත වූ ආකාරය සැලකීමේ දී, මුලින් ම නැගෙනහිර පළාත ට සමගාමී ව සිදු වූ අතර, පුහුණුව සඳහා සිරියාවේ මධ්‍යම ප්‍රදේශය ට ගොස් ඇති බව ත්, කාත්තන්කුඩි ප්‍රදේශයේ වූ සිදු වීම සම්බන්ධ ව ත්, මෙම සාක්ෂිකරු පැහැදිලි කර යි.

96. තම ධූර කාලයේ දී, ජාතික බුද්ධි ප්‍රධානී ලෙස වූ තනතුර සඳහා සිසිර මෙන්ඩිස් යන අය පත් කළ අතර, තමා පොලිස්පතිවරු දෙදෙනෙකු යටතේ සේවය කළ බව ත්, ඉන් එක් අයෙකු මෙම චූදිත බව ත්, ප්‍රකාශ කර හඳුනාගෙන ඇත.

97. රාජ්‍ය බුද්ධි සේවාව විදේශ බුද්ධි සේවා සමඟ සම්බන්ධ වූ ආකාරය පිළිබඳ ව ද, මැද පෙර දිග රටවල් සමඟ සම්බන්ධතා පැවැත්වීම ද, තමා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක වීමෙන් පසු ව ආයතන 25 කට 30 කට අධික ප්‍රමාණයක් සමඟ සම්බන්ධ වීම ද, තොරතුරු හුවමාරු කර ගැනීම ද, සිදු කළ බව සාක්ෂිකරු හෙළි කර යි.

98. ආරක්ෂක මණ්ඩලය පිහිටීම පිළිබඳ ව හෙළිදරව් කර ඇති අතර, ඊට පාර්ශවකරුවන් කැඳවීමේ අභිමතය ජනාධිපතිවරයා ට ඇති බව ත්, 2015 වර්ෂයේ සිට ජනාධිපති ලෙස මෛත්‍රීපාල සිරිසේන මහතා කටයුතු කළ අතර

ඔහු සහභාගී වූ ආරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීමේ දී, තමා දැනුවත් කළ රැස්වීම් වල ට සහභාගී වීම සාක්ෂිකරු හෙළිදරව් කර යි. මෙම ආරක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක, ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් සහ පොලිස්පතිවරයා සහ සිවිල් නිලධාරීන් සහභාගී වීම ද සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

99. තමා විසින් සකස් කරන ලද පෙර කී වාර්තා 340 ප්‍රමාණයෙන් 99%ක් පමණ පොලිස්පතිවරයා ට සහ ආරක්ෂක ලේකම්වරයා ට යොමු කළ කාරණාව ද සාක්ෂිකරු හෙළි කර ඇත.

100. පොලිස්පතිවරයා ට යොමු කරන ලද වාර්තා අතර විශේෂයෙන් operational වාර්තා ලෙස ඇති වාර්තා යොමු කරන ලද බව ත්, ඒවා ඉක්මනින් වළක්වා ගත යුතු සහ වළක්වා ගත හැකි ආකාරයේ ක්‍රියාන්විතයන් ට අදාළ තොරතුරු බව මෙම සාක්ෂිකරු පැහැදිලි කර යි. එනම් භූමියේ පියවර ගත යුතු වාර්තා වේ.

101. පොලිස්පතිවරයා ට සහ ආරක්ෂක ලේකම්වරයා ට තමා ඕනෑම අවස්ථාවක කැඳවීමේ අයිතිවාසිකම ඇති බව ත්, එසේ කැඳවූවහොත් එසේ සහභාගී වීම ට තමා බැඳී සිටින බව ත්, මෙම සාක්ෂිකරු හෙළිදරව් කරන හෙයින්, මෙම අන්තවාදය ගැන නිලධාරීන් ව දැනුවත් කිරීම සඳහා පොලිස්පතිවරයා තමා වෙත දැනුම් දී, ඇති බව ද මෙම සාක්ෂිකරු හෙළිදරව් කර යි.

102. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව වැඩිදුරටත් හෙළිදරව් වන්නේ, මාවනැල්ල බුදු පිළිම කඩා දැමීමේ සිද්ධිය ලෙස හඳුන්වන එම බුදු පිළිම සඳහා හානි කිරීමේ සිද්ධියෙන් අනතුරුව, මේ හා සම්බන්ධ ව සිද්ධීන් සහ තොරතුරු රැස් කිරීම් සහ නිලධාරීන්ගේ වගකීම් සහ වෙනස් ආකාරයෙන් ක්‍රියාත්මක වී ඇති අතර, මෙම සිදුවීම 2018 දෙසැම්බර් මස සිදු වූ සිදු වීමක් බව ට ද හෙළිදරව් කරන ලදී. මෙම සාක්ෂිකරුගේ සමස්ථ සාක්ෂිය සැලකීමේ දී, 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ මෙම අන්තවාදී පිරිස්

ක්‍රියා කළ ආකාරය සහ එහි වර්ධනය පිළිබඳ සාක්ෂිකරු හෙළිදරව් කරන අතර, පාස්කු ප්‍රහාරය සිදු වීම ද එක ම ක්‍රියාවලියක් බව පැහැදිලි ය.

103. සාක්ෂිකරු විසින් මේ හා සම්බන්ධයෙන් සකස් කරන ලද සහ යොමු කරන ලද වාර්තා සනාථ කිරීම සඳහා පැ.01 ලෙස 2018.12.30 දාතමින් යුතු ව චූදිත වෙත යවන ලද වාර්තාවක් සලකුණු කරන ලදී. මෙවැනි වාර්තා යවන ලද ආකාරය සම්බන්ධයෙන් ද සලකා බැලිය යුතු ය.

104. මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු මෙසේ විස්තර කර ඇත.[11]

"ප්‍ර: දැන් රහස්‍ය වාර්තාවකුයි, අතිශය රහස්‍ය වාර්තාවකුයි අතර තියෙන කාර්යාලමය බණ්ඩනයේ තියෙන වෙනස කුමක්ද?

උ: ස්වාමිනි අතිශය රහස්‍ය ඔය රහස්‍ය සහ අතිශය රසහ්‍ය වාර්තා යවන විදිය සහ ඒක මේ ලියුම් කවරයක ඇතුළත් කරන විදිය ක්‍රමවේදයක් තියෙනවා ස්වාමිනි. අපේ ඒක පිළිගත්ත ක්‍රමවේදයක් ලෝකේ පුරාම යන ක්‍රමවේදයක් ස්වාමිනි. එතකොට අතිශය රහසිගත එකක් යවන්නේ අපි සාමාන්‍යයෙන් ඒක address කරපු කොනම බලලා තීරණය ගනියි කියලා විශ්වාස කරලා තමයි ස්වාමිනි. අපි ඒ අතිශය රහස්‍ය වාර්තාවක් දාන්නේ. එතකොට අපි කරන්නේ ඇතුල් කවරෙක පලවෙනි කවරේසීල් කරලා නමම ගහලා Top secret කියලා ගහලා ඊටපස්සේ පිට තව කවරයක් දාලා ඒකෙත් නම ගහලා යවලා එතකොට P A කෙනෙක් හරි officer කෙනෙක් හරි කවුරුහරි ඇහුවොත්දන්නවා මේක අභවල් නිලධාරියටම ලබා දිය යුතුයි. මේක Top secret report එකක්. එතකොට අහවල් නිලධාරියා තමයි උපදෙස් ලබා දිය යුතුයි කියලා ඒ ක්‍රමවේදය ස්වාමිනි මම හඳුන්වා දීපු එකක නෙමේ ඒක අපේ බුද්ධි අංශවල භාවිතා වන ක්‍රමවේදයක් ස්වාමිනි.

[11] 2021.11.23 දින පෙරවරු 11.15, 2 සහ 3 පිටු

ප්‍ර: එතකොට මේ සාක්ෂිකරු confidential කියලත් වාර්තාවේ තිබෙනවාද?

උ: එසේය ස්වාමිනි. confidential කියලා අපි බොහෝ වේලාවට යවන්නේ add min වගේ තොරතුරු. අපේ පරිපාලනය සම්බන්ධ වගේ තොරතුරු අපි confidential යවන්නේ. ඒකටත් හේතුව රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ගේ අනන්‍යතාවයත් යම්කිසි classification එකකට එන්න ඕන. රහසිගත හින්දා. නැත්නම් බුද්ධි සේවාවේ වැඩකරන නිලධාරින්ගේ තොරතුරු එලියට යෑමත් ඒකෙන් නිලධාරින්ට ගැටලුවක් විය හැකි හින්දා. බොහෝ වේලාවට අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවය බුද්ධි තොරතුරක් එලියට යවන්නේ secret, Top secret බණ්ඩනයක් classification එක යටතේ ස්වාමිනි.”

105. පැ.01 වැනි ලිපියක් ලැබුණු පසු මේවා පොලිස්පතිවරයා වෙත යොමු කිරීම සම්බන්ධයෙන් සාක්ෂිකරු මෙසේ සාක්ෂි ලබා දී ඇත.[12]

“ප්‍ර: මම අහන්නේ ඔය පැ.01 කියන ලිපිය ගැන නෙවෙයි. පැ.1 වැනි ලිපියක් රාජ්‍ය බුද්ධි සේවයෙන් පොලිස්පතිවරයා වෙත යොමු කරනවා නම් ඊට අදාළ ආයතනික ක්‍රමවේදය කවරක්ද කියන කාරණාව?

උ: රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරියෙක්ට යම්කිසි විදියකින් තොරතුරක් ලැබුණාම ඒ තොරතුර ඒ නිලධාරියා විසින් අදාළ අංශයේ ස්ථානාධිපතිවරයාව දැනුවත් කරලා, එම තොරතුර බුද්ධි තොරතුරක් බවට පත් කරලා, එහිදී ඒකට සහකාර අධ්‍යක්ෂකතුමත් සහභාගී වෙනවා. ඒ වගේ සාකච්ඡාවකින් පසුව ඒගොල්ලෝ වාර්තාවක් පිළියෙල කරනවා තමන්ගේ ළඟ තිබෙන දත්තත්, ලැබිච්ච දත්තත් ඒ කරුණු ප්‍රමාණයන් අරගෙන. මොකද සමහර විට ඒ වාර්තා කරන නිලධාරියා ලැබෙන්නේ තමන් වාර්තා කරන ඒරියා එක පමණයි. එතකොට ඉහල නිලධාරින් ඊට එහා කරුණු පිළිබඳ දන්න නිසා එහෙම

[12] 2021.11.24 දින සාක්ෂි සටහන් 3 පිටුව

ඇනලයිස් කරලා නියෝජ්‍ය අධ්‍යක්ෂක හරහා මා වෙත එනවා. එතකොට මා විසින් ඔවුන් සමඟ  සාකච්ඡා කරනවා මේකේ වැදගත්කම සහ මෙහි විශ්වාසවන්ත භාවය. ඒ අනුව අධ්‍යක්ෂක, රාජ්‍ය බුද්ධි සේවාව විසින් තමන් සතුටු වුණාම එම වාර්තාව පොලිස්පතිතුමා වෙත යොමු කරනවා.”

106. පැ.02 ලෙස ඉදිරිපත් කරන ලද ලේඛනය 2016.08.23 වන දිනැති ලේඛනයක් වන අතර, එය ෆේස්බුක් වෙබ් අඩවිය හරහා පුද්ගලයෙකු ට තර්ජනය කිරීම හා සම්බන්ධ ව වූ කාරණාව කි. මේ ආකාරය ට පෙර සඳහන් කිරීම ට යෙදුණු පැ.01 සිට පැ.34 දක්වා ලේඛන සහ ඉන් පැ.04, පැ.06, පැ.07, පැ.09, පැ.10, පැ.14, පැ.15, පැ.16, පැ.18, පැ.19, පැ.20, පැ.21, පැ.22, පැ.24, පැ.25, පැ.26, පැ.27, පැ.29, පැ.30, පැ.33 යන ලේඛනයන් හි මුල් පිටපත් ද ලකුණු කරන ලදී.

107. පැ.31 සිට පැ.34 දක්වා ලේඛන සැලකීමේ දී, පැ.32 ලේඛනය හැරුණු විට අන් සියලු ලේඛන මෙම නඩුවේ චූදිත වෙත යවන ලද ලේඛන වේ. පැමිණිල්ල විසින් ම ඉදිරිපත් කිරීම ට යෙදුණු මුල් ලේඛන ඉදිරිපත් නොකළ සෙසු ලේඛනයන්ගේ ද එම ලේඛන සඳහා චූදිත විසින් ගන්නා ලද පියවරයන් පැහැදිලි ව සඳහන් ව ඇත. එසේම මුල් ලේඛනයන්ගේ ද එකී කරුණු පැහැදිලි ව දැක්වේ.

108. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂියේ දී, සලකුණු කිරීම ට යෙදුණු පැ.35 ලේඛන 2019.04.04 වන දින පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් යොමු කළ කෙටි පණිවිඩය කි. ලකුණු කරන ලද ලේඛනය එසේ යවන ලද කෙටි පණිවිඩයේ මුහුණත ඡායාරූපය කි. පැ.35 දරණ කෙටි පණිවිඩය හා සම්බන්ධයෙන් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ ස්ථාවරය සලකා බැලිය යුතු ය. එය තමා වෙත ලැබුණු තොරතුර ඒ ආකාරයෙන් යවන ලද බව මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය යි. තමා ට වාචික ව ලද තොරතුර තමා ලිඛිත ව ලබා දෙන ලෙස අයැදීමේ දී, මෙම පණිවිඩය තමා ට ලැබුණු බව ත්, ඒ අනුව එකී

පණිවඩය වට්ස්ඇප් (WhatsApp) මාර්ගයෙන් ලද අතර, පැ.35 දරණ පණිවිඩය තමා සහකාර අධ්‍යක්ෂක වෙත යොමු කරන ලද බව ත්, හෙළිදරව් කර ඇත. මෙහි දී, INPUT ලෙස සඳහන් කිරීම පිළිබඳ ව ද, පැහැදිලි කර ඇත. ඔවුන ට එම තොරතුර ලැබී ඇත්තේ, INPUT තොරතුරක් ලෙස බැවින් එම වචනය ම මෙහි සඳහන් කර ඇති බව මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය යි. එය විවිධ රටවල භාවිතා කරන ආකාරය බව ත්, සමහර අවස්ථාවන් හි දී, අකෝඩින් වූ සෝ(ර්)ස් ලෙස සඳහන් කරන බව ත්, සාක්ෂිකරු පැහැදිලි කර යි. තමා වෙත ලද තොරතුර එනම්, 2019.04.04 ලද තොරතුර 2019.04.07 වන දින ජාතික බුද්ධි ප්‍රධානී වෙත යොමු කළ අතර ඒ සඳහා කාලය ගත වීම පිළිබඳ ව ප්‍රශ්න කිරීමේ දී, සාක්ෂිකරු මෙසේ පැහැදිලි කර ඇත. [13]

"ප්‍ර: එතකොට මුල් තොරතුර ලැබිච්ච 04 වැනි දිනත් 07 වැනි දිනත් අතර කාලය තුල ඔබ කලේ කවරක්ද?

උ: මෙම තොරතුර ලද පසු මා තොරතුරුකරුට පෙර සඳහන් කළ පරිදි කතා කළා. කතාකරලා මගේ නිලධාරින්ට උපදෙස් දුන්නා. මෙම තොරතුරුකරු දැනුවත් කළා මට ලිඛිතව එවන්න කියලා. පස්සේ 05 වැනිදා මම මගේ නිලධාරින් කණ්ඩායමක් ස්ථානාධිපති ඇතුළු නිලධාරින් කණ්ඩායමක් නැගෙනහිර පළාතට යැව්වා මේ වෙරිෆයි කරන්න මේකේ තියෙන නම් ගම් ටික හරියට අයිඩින්ටිෆයි කරගන්න අපි නොදන්න ඒවා කොහේද කියලා. අපිට මෙහෙම ඇටෑක් එකක් ඉන්දියන් හයි කමිෂන්. ඒ තොරතුර බලන කොටම සොෆ්ට් ටාගට්ස් හාඩ් ටාගට් කියලා දෙකක් තියෙනවා. හාඩ් ටාගට් එක ඉන්දියන් හයි කමිෂන් එකේ. එකේ ස්පෙසිෆිකලිම කියලා තියෙන්නෙ හයි කමිෂන් ඉන් ශ්‍රී ලංකා ඉන්ස් වන් ඔෆ් ද ටාගට්ස් ෆෝ ද ෆැලැන් ඇටෑක් කියලා. ඒ කියන්නේ ඒක ස්පෙසිෆිකලි අයිසොලේට් කරලම කියලා තියෙනවා ඉන්දියන් හයි කමිෂන් එකට ඇටෑක් කරන්න තියෙනවා කියලා ඉතින්

[13] 2021.11.25 පෙ.ව.11.05 සාක්ෂි සටහන්, පිටු අංක 02

අපිට එහෙම තොරතුරක් මීට ඉස්සෙල්ලා ඉන්දීය හයි කමිෂන්කාර්යාලයකට ගහනවා අපිට කවදාවත් වාර්තා වෙලා තිබ්බේ නැහැ. ඒ අනුව නිලධාරින් කණ්ඩායමක් යැව්වා 05 වැනිදා. 06 වැනිදා හවස මම කිව්වා ග්රිපින් එකක් ඕන කියලා. 06 වැනිදා හවස මම නියෝජ්‍ය අධ්‍යක්ෂකට කතා කළා. කතා කරලා කිවුවා සර් මේකේ මේගොල්ලෝ මේ අනාගමිකයන් මරණවා කියන එක නිරන්තරයෙන් කියනවා ඉන්දිය හයි කමිෂන් එක ගැන කියන්නේ නැහැ. අපිට එහෙම තොරතුරක් ඇවිල්ලා නැහැ සර් කියලා මම කියනවා එහෙම නම් තොරතුර වැඩිදුර උපදෙස් සඳහා ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙත ලිඛිතව යවලා එම තොරතුර වචනයක්වත් වෙනස් කරන්නේ නැතුව ඔය තොරතුරු පත්‍රය ඇටැච් කරලා ඉන්ෆෝමේෂන් ඇන්ඩ් ඉන්ස්ට්‍රක්ෂස් පිලිස් කියලා එතුමාට යවලා මම මගේ නිලධාරින්ට උපදෙස් ලබා දෙමින් එය ඩිවලොප් කරන්න කටයුතු කළා සාක්ෂිකරු.”

109. මෙම තොරතුර පිළිබඳ ව ප්‍රශ්න කිරීමේ දී, හෙළිදරව් වන්නේ මෙය බුද්ධි තොරතුරක් ලෙස සැලකිය නොහැකි තොරතුරක් ලෙස යි. මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමේ දී, සාක්ෂිකරු මෙසේ පිළිතුරු දී ඇත.[14]

“ප්‍ර: දැන් ඒ පසුබිම එක්ක ඒ ඔබ කියන පසුබිම එක්ක මේ 04 වැනිදා ආපු තොරතුර ඔබ විශ්ලේෂණය කරන්නේ කෙසේද?

උ: අපි මේ සම්බන්ධයෙන් 09 වැනිදා වාර්තාවක් යැව්වා ස්වාමිනි. එකේදී දැන්නුවා අපිටත් බුද්ධි තොරතුරු තිබ්බේ නැහැ එහෙම ඇටැක් කරනවා කියලා. ඒ වුනාට අනාගමිකයන් ඝාතනය කිරීමේ වියරුවකින් පසුව අපි ඒ පිළිබඳ ව වාර්තා කළා මේ තොරතුරු ඇටැච් කරගත්තා.

[14] 2021.11.25 සාක්ෂි සටහන්, පෙ.ව.11.05, පිටු අංක 04

110. පැ.36 ලෙස ලකුණු කිරීම ට යෙදුණු ලිපිය පිළිබඳ ව පැහැදිලි කර ඇත්තේ, ඒ හා සම්බන්ධ ව ජාතික බුද්ධි ප්රධානීගෙන් උපදෙස් ලබා ගැනීම හා සම්බන්ධ ව යි. ජාතික බුද්ධි ප්‍රධානීගේ ක්‍රියාකලාපය හා සම්බන්ධ ව මෙම නඩුවේ චෝදනාවන් ට අදාළ ව චූදිත හා ඍජු සම්බන්ධතාවයක් නැත්තේ ය.

111. පැ.37 ලිපිය ද, පැ.37(අ) – පැ.39, පැ.40, පැ.41 යන තොරතුරු බුද්ධි තොරතුරු බව ට පරිවර්තනය කර නොගත් තොරතුරු වන අතර, නඩු විභාගයේ දී, සලකුණු කරන ලද පැ.42 දරණ කෙටි පණිවිඩයේ මුහුණත ඡායාරූපයන් ද, එසේ නැතහොත් එකී කෙටි පණිවිඩයන් ද සලකා බැලිය යුතු ය. එසේ ලකුණු කරන ලද්දේ ආරක්ෂක ලේකම් වෙත යවන ලද කෙටි පණිවිඩයේ මුහුණත ඡායාරූපය යි.

112. චූදිත වෙනුවෙන් වි.01 ලෙස ලකුණු කර ඇත්තේ, චෝදනා පත්‍රයේ උපලේඛනයේ 111 යටතේ වූ ලේඛනය යි. එකී ලේඛනයේ (අ) ඇමුණුම ලෙස ඇත්තේ පැ.37 (අ) දරණ ලේඛනය ම ය. එම තොරතුරු බුද්ධි තොරතුරක් ව නැති වුව ද, චූදිත විසින් ඒ සම්බන්ධයෙන් ගන්නා ලද පියවර ලේඛනයේ සඳහන් කර ඇති අතර, පැමිණිල්ලේ 35 වන සාක්ෂිකරු ද එම කරුණු පිළිගෙන ඇත.

113. පැ.45 ලේඛනය සහ පැ.46 ලේඛනය දුරකථන සම්බන්ධතා හා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලේඛනයන් ය.

114. පැ.38 ලෙස සලකුණු කරන ලද ලේඛනය හා සම්බන්ධ ව 2019.04.16 වන දින කාත්තන්කුඩි ප්‍රදේශයේ සිදු වූ පිපිරීමක් හා සම්බන්ධ කරුණ යි. මේ සම්බන්ධයෙන් තමා චූදිත වෙත දැනුම් දුන් බව ත්, ඒ හා සම්බන්ධ ව චූදිත තමා ට දැන් වූ පරිදි මෙම සිද්ධිය පිළිබඳ ව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ට දැනුම් දීම පිළිබඳ ව ද, මෙම සාක්ෂිකරු හෙළිදරව් කරන ලදී. ඒ අනුව පැ.39 සිට 41 දක්වා වූ ලේඛනවල අදාළ කරුණු සාක්ෂිකරු විසින් අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ට දැනුම් දී ඇති බව ට පැහැදිලි ය. මෙම කරුණ සම්බන්ධයෙන් වූදිත එසේ දුරකථනයෙන් දැනුම් දීම විනා, තමා ට වෙනත් කිසිදු දැනුම් දීමක් සිදු නොකළ බව සාක්ෂිකරු හෙළිදරව් කර යි. 2019.04.04 වන දින තමා වෙත ලැබුණු තොරතුර ට අමතර ව 2019.04.20 වන දින ද පස්වරුවේ තමා වෙත ලද තොරතුර පිළිබඳ ව මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත. පැ.42 ලෙස ලකුණු කරන ලද්දේ එම තොරතුර යි.

115. මෙම තොරතුර ම පොලිස්පතිවරයා වෙත ද යවන ලද බව සාක්ෂිකරුගේ ස්ථාවරය යි. පැ.43 ලෙස ලකුණු කරන ලද්දේ එම තොරතුර වන අතර, අමතර ව එය එකී පණිවිඩය පොලිස්පතිවරයා ට දැනුම් දී පොලිස්පතිවරයා ට දුරකථනයෙන් ද ඇමතීමක් ද කළ බව සාක්ෂිකරු හෙළිදරව් කර යි. අදාළ තොරතුර සාක්ෂිකරු වෙත ලැබී ඇත්තේ එදින ප.ව.4.16 ට පමණ වේ. එම දින පස්වරුවේ ම මේ බව දැනුම් දුන් බව ත්, විදේශ බුද්ධි තොරතුරු මඟින් ලැබී ඇති පරිදි පසු දින, පල්ලියක ට සහ හෝටලයක ට ඇතුළු ස්ථාන අටක ට ප්‍රහාර එල්ල කිරීම ට සූදානමක් ඇති බව හා සම්බන්ධයෙන් පණිවිඩයක් ද එවන ලද බව ට මෙම සාක්ෂිකරු හෙළිදරව් කර ඇත.

116. පණිවිඩය යැවීම සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී, මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, එසේ යොමු කිරීම Textra යන තාක්ෂණය ඔස්සේ මෙම පණිවිඩය යවන ලද බව යි. මෙහි දී, වර්තමාන පොලිස්පතිවරයා විසින් අධිකරණයේ ලබා දුන් සාක්ෂිය සැලකිය යුතු ය. පොලිස්පතිවරයාගේ සාක්ෂිය වන්නේ, Textra යන තාක්ෂණ මාර්ග පොලිස් දෙපාර්තමේන්තුවේ කිසි විටෙකත් භාවිතා කර නැති බව යි. ඒ අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන පරිදි අදාළ තොරතුර වූදිත වෙත ලිඛිත ව යැවූ බව ට කියන කරුණ සැක සහිත ය. අදාළ තොරතුර එක් එක් නිලධාරීන් ට දැනුම් දීම පිළිබඳ ව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විස්තර කර ඇත. එහෙත් මෙම

නඩුවේ දී, අදාළ වන්නේ, චූදිත ට එනම් එවක ට පොලිස්පතිවරයා ට පණිවිඩය නිසි පරිදි ලැබුණේ ද යන කාරණාව යි.

117. පොලිස්පතිවරයා ට සිදු කළ දැනුම් දීම පොලිස්පතිවරයා බරපතල ලෙස නොගැනීම හේතුවෙන් තමා මේ පිළිබඳ ව ආරක්ෂක ලේකම්වරයා මාර්ගයෙන් ද දැනුම් දුන් බව ද සාක්ෂිකරු හෙළිදරව් කර යි. නමුත් එදින ඉන් අනතුරු ව පොලිස්පතිවරයා තමා නැවත සම්බන්ධ කර නොගත් බව සාක්ෂිකරු හෙළිදරව් කර යි.

118. ඉහත කී තොරතුර සැලකීමේ දී, ප්‍රහාර එල්ල කරන නිශ්චිත ප්‍රදේශයක් දක්වා නොතිබූ බව ත්, පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු හෙළිදරව් කර යි.

**සාක්ෂි විශ්ලේෂණය**

119. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ මූලික සාක්ෂි විමසීමේ දී, පැ.39, 40, 41 යන ලේඛන ලකුණු කරන ලදී. පැ.30, 2019.04.18 දාතමින් යුතු ය. පැ.40, 2019.04.19 දාතමින් යුතු ය. පැ.41, 2019.04.20 දාතමින් යුතු ය. මෙම ලිපි තුනේ ම 2019.04.21 දාතමින් යුතු ව චූදිත විසින් පළමු සාක්ෂිකරුගේ ප්‍රගති වාර්තා කැඳවා ඇති බව ට සටහන් කර ඇත. නමුත් ඉදිරිපත් කරුණු අනුව මෙම ලිපි නැවත පළමු සාක්ෂිකරු වෙත ලැබෙන විට නඩුව ට විෂය ගත ප්‍රහාරය සිදු ව ඇති බව පැහැදිලි ය. මූලික සාක්ෂියේ දී, ප්‍රකාශ කර ඇත්තේ, එම ලිපි වලින් හෙළිදරව් වූ කරුණු සම්බන්ධ ව කිසිවෙකු තමාගෙන් සාකච්ඡාවක ට පැමිණෙන ලෙස හෝ දැනුම් දී නැති බව යි. එහෙත් සිද්ධිය ට පෙර ඉදිරිපත් කරන ලද ඉහත කී, පැ.39, 40 සහ 41 දරණ තොරතුරු බුද්ධි තොරතුරු නොවන බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පිළිගෙන ඇත.

120. නඩුව ට විෂය ගත සිදුවීම හා සම්බන්ධ ව තමා ට විදේශයකින් ලැබුණු තොරතුර පිළිබඳ ව සාක්ෂිකරු පැහැදිලි කර ඇත. එහි දී, පැ.42 ලෙස

එම තොරතුර ආරක්ෂක ලේකම් වෙත යැවූ මුහුණත ඡායාරූපය ලකුණු කරන ලද අතර, පැ.43 ලෙස ලකුණු කරන ලද්දේ, එය චූදිත වෙත යවන ලද බව ට කියන ලේඛනයේ පිටපත යි. එය පෙර සඳහන් කළ පරිදි Textra පණිවිඩ හුවමාරු මෘදුකාංගය යටතේ යවන ලද බව ට කීව ද, වර්තමාන පොලිස්පති වරයා එසේ Textra මෘදුකාංගය භාවිතා කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ දී , සිදු කර නැති බව ට පැහැදිලි කර ඇත.

121. පළමු සාක්ෂිකරු වෙත ලද ප්‍රථම කෙටි පණිවිඩය, පැ.35 ලෙස ලකුණු කර ඇත. එකී පණිවිඩය අනුව දැක්වෙන ප්‍රහාරයන් කෙදිනක කොතැනක සිදු වන්නේ ද යන්න නිශ්චිත ව දක්වා නැත. පැ.43 දරණ ලේඛනය පරිදි පහර දීමේ දිනයක් එනම්, එම පණිවිඩය ලැබුණු දින ට පසු දින දක්වා තිබුණ ද, නිශ්චිත ස්ථානයක් සඳහන් ව නැත. ඒ අනුව පළමු සාක්ෂිකරු බුද්ධි තොරතුරක් ලෙස විශ්වාසය තබන පැ.42, එසේ නැතහොත් පැ.43 ලේඛණයේ ඇති තොරතුරු නිශ්චිත වශයෙන් 100% ක් ම බුද්ධි තොරතුරු ලෙස සැලකිය නොහැකි බව පෙනී යයි. අනෙක් කාරණය වන්නේ, ලද තොරතුර බුද්ධි තොරතුරක් ලෙස විශ්වාස කිරීම ට එක ම හේතුව එය විදේශයකින් ලැබීම නිසා බව සාක්ෂිකරුගේ ස්ථාවරය යි. එපමණකින් ම එම තොරතුර බුද්ධි තොරතුරක් ලෙස සාක්ෂිකරු හැඳින්වූවා මිස, තහවුරු කර ගැනීම සඳහා රාජ්‍ය බුද්ධි සේවාව අනුගමනය කරන ක්‍රමවේදයක් අනුගමනය කර නැත. මේ පිළිබඳ ව වැඩිදුරටත් පසු ව සාකච්ඡා කරනු ඇත.

122. මෙම සාක්ෂිකරු වඩාත් පැහැදිලි කරමින්, 2019.04.21 වන දින උදේ වරුවේ ඒ ආකාරයෙන් ම පණිවිඩයක් තමා ට ලැබුණු බව ට පැහැදිලි කරන ලදී. එම තොරතුර අනිවාර්යයෙන් බුද්ධි තොරතුරක් බව සාක්ෂිකරු පැහැදිලි කර ඇත. ඒ බව පහත සාක්ෂි මඟින් පැහැදිලි ය.[15]

[15] 2021.11.26 දින වෙලාව පෙ.ව.10.20 පිටුව 2, 3

“ ප්‍ර: එතකොට ඔබ මේ ගරු අධිකරණයට කියන්නේ ප්‍රහාරයක් සම්බන්ධයෙන් ලැබිච්ච තොරතුර බරපතල ලෙස අරගෙන ඔබ සන්නිවේදනය කළේ 20 වැනිදා මයි කියලා?

උ: මට පැහැදිලි කිරීමට අවශ්‍යයි. බුද්ධි තොරතුරක් වුණේ කාලානුරූපී ව වර්ධනය කරගෙන යනකොට අපිට යම්කිසි ස්ථානයකට එනවා මේකේ Validity එකක් තියෙනවා කියලා. කවදාවත් ලංකාවේ 2009 පස්සේ ලොකු පිපිරීමක් නැතුව සාමකාමී කාලපරිච්ඡේදයක් තියෙන කොට මේ වගේ තියෙන කොට අපි වර්ධනය කරලා ගන්න ඕන වෘත්තිමය බුද්ධි අංශයක් විදියට. අපි මේවා කරලා ඒක තමයි සාමාන්‍යයෙන් බයිසිකලයක් පිපිරුනාම බයිසිකලේ පිපිරීම හොයන්නේ නැහැ බුද්ධි අංශ. ඒ වුනාට මේ බැක්ග්‍රවුන්ඩ් එකත් අපිට Experience එක්ක තමයි අපි මේ දේවල් කළේ. ඒ අනුව මම 20 වැනිදා මගේ නිලධාරිත් එක්ක සාකච්ඡා කළා. මගේ තොරතුරුකරුත් එක්ක සාකච්ඡා කරලා ඒ අනුව තමයි මම දැනුවත් මෙන්න මේ වගේ ඇටැක් එකක් වෙන්න පුළුවන් තැන් 08 කට ගහනවා කියලා තොරතුරු තියෙනවා කියලා ප්‍රකාශ කලේ.

ප්‍ර: සාක්ෂිකරු මේ 21 වැනිදා ලැබිච්ච පණිවිඩය ගැන ඔබ කිව්වනේ ක්ෂණිකව විවිධ පාර්ශවයන්ට දුරකථනයෙන් දැනුම් දුන්නයි කියලා?

උ: මම නන්දන මුණසිංහ මහත්තයට කෝල් එක අරගෙන එතකොට මම ප්‍රොටකෝල් අනිත් පැත්තට කලේ 20 වැනිදා ප්‍රොටකෝල් එක වෙනස් විදියට කතා කලේ. පොලිස්පතිතුමාට කතා කරලා ආරක්ෂක ලේකම්තුමා ට කතා කරලා ටෙලිෆෝන් එක තියෙන කොටම වගේ නන්දන මුණසිංහ මහත්තයා මට කතා කරලා කිව්වා නිලන්ත ගැහුවනේ කියලා. මට සමාවෙන්න ස්වාමිනි. මම ඇහුවා ඇයි මිනිස්සු පාර හිටියද මම මොකක් හරි කිව්වා ඒ වෙලාවේ. මට කියන්න හම්බ වුනේ නන්දන මුණසිංහට කිවුවා IG ට කිව්වා Secretary ට කියලා

කෝල් එක තියලා විනාඩි ගානකින් මට නන්දන මුණසිංහ කතා කරලා කිව්වා නිලන්ත ගැහුවා කියලා. මම ඇහුවා ඩියුටි දාලා නැහැ වගේ කතා කරන භාෂාවෙන් කතා කලා. එහෙම තමයි ඒක වුනේ. ඊට එහා මට කෝල් දාන්න වුනේ නැහැ.

ප්‍ර: 21 වැනිදාආව පණිවිඩය ඔබ 20 වැනිදා ආප පණිවිඩ වගේ කාට හරි වට්ස්ඇප් මාර්ගයෙන් හෝ SMS මාර්ගයෙන් යොමු කිරීමක් කළාද?

උ: ඉදිරිපත් කළා. එතකොට මම හිතන්නේ පළවෙනි පිපිරීම වෙලා ඉවරයි. ආරක්ෂක ලේකම්තුමාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට මම වට්ස්ඇප් කළා. එතකොට මම හිතන්නේ ප්‍රහාරය සිදු වෙලා ඉවරයි.

ප්‍ර: නමුත් ඔබ උදෑසන් 8.27 පස්සේ පණිවිඩේ ලැබිලා කතා කරද්දි එවැනි පිපිරීමක් වෙලා තිබ්බේ නැහැ. ඔබ දුරකථනයෙන් පෙර කියපු නිලධාරින්ට අමතන අවස්ථාවේ දී පිපිරීමක් ගැන වාර්තා වෙලා තිබ්බද?

උ: නැහැ.”

123. හරස් ප්‍රශ්න සඳහා පිළිතුරු දීමේ දී, සාක්ෂිකරුගේ ස්ථාවරය අනුව සිද්ධිය හා සම්බන්ධ තොරතුර බුද්ධි තොරතුරක් බව ට පත්ව ඇත්තේ 2019.04.04 වන දින ප.ව.4.15 ට පමණ ය. මෙම සාක්ෂිකරුගෙන් එසේ 2019.04.20 දින සවස 4.12 ට පමණ මෙම පණිවිඩය ලැබීමෙන් පසු ව ගන්නා ලද ක්‍රියාමාර්ගය හා සම්බන්ධ ව සාක්ෂිකරු මෙසේ සාක්ෂි දී ඇත. [16]

“ගරු මහාධිකරණ විනිසුරු එම්.වයි.එම ඉර්ෂඩීන් මැතිතුමා විසින් යොමු කරන ලදී.

ප්‍ර: ඒ කියන්නේ අප්‍රේල් 20 වෙලාව 4.12 ට නේද?

---

[16] 2021.11.29 දින සටහන් පෙ.ව.9.35, පිටු 4, 5, 6

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ අප්‍රේල් 20 2019, 4.12 ට නැවතත් වට්ස්ඇප් මාර්ගයෙන් එම තොරතුරු ලැබෙන තෙක් ඒක බුද්ධි තොරතුරක් හැටියට පරිවර්තනය කරගැනීමට නොහැකි වුණා නේද කියලයි අහන්නේ?

උ: බුද්ධි තොරතුරක් කරගන්න බැරි වුණා ස්වාමිනි.

***************

ප්‍ර: ඒක තමයි අහන්නේ. එතකොට 2019.04.20 වෙනිදා සවස 4.12 ඉඳලා පහුවදා ඒ කියන්නේ 21 වෙනිදා උදෑසන 8.27 වෙනකන්ම මහත්මයලා මොකක්ද ගතුත් ක්‍රියාමාර්ගය මේ තොරතුර සම්බන්ධයෙන්?

උ: ප්‍රශ්නය පැහැදිලි නැහැ ස්වාමිනි.

ගරු මහාධිකරණ විනිසුරු ඒ.කේ.එම්.පටබැඳිගේ මැතිතුමා විසින් යොමු කරන ලදී.

ප්‍ර: දැන් අහන්නේ දැන් 4/20 ප.ව.4.12 ට පහුවදාට පහර දීම් 6 ක් හෝ 8 ක් වෙනවා කියලා මහත්මයා කිවුවා. එතකොට මහත්මයාකිවුවා ඒ දෙවෙනි තොරතුර බුද්ධි තොරතුරක් හැටියට තමයි මහත්මයා සලකා තීරණය කලේ කියලා?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ තීරණය කළ මොහොතේ සිට පසුදින උදෑසන 8.00 දක්වා කාල සීමාව තුල මහත්මයා ගත්ත පියවර?

උ: එහෙමයි ස්වාමිනි. ස්වාමිනි මට 4.12 ට පණිවිඩය ලැබුණම ස්වාමිනි මම නැවත කියන්නේ ස්වාමිනි මා මුලින්ම කලේ තොරතුරුකාරයාට කතා කරන එක ස්වාමිනි. ඒකෙන් තොරතුරුකාරයත් සමග කතාකරලා එක පාරක් නෙමේ ස්වාමිනි දෙපාරක් විතර කතා කලා

ස්වාමිනි එක දිගට. කතා කරලා මේ තොරතුරේ පාලම්කුඩා ප්‍රහාරය පිපිරීම පිළිබඳ සනාථ වෙච්ච හින්දා අපිත් ඒ පිළිබඳ ඩ්‍රයිරන් එකක් කියලා තිබ්බ හින්දා ස්වාමිනි ඒ අනුව සාකච්ඡා කරලා මගේ නිලධාරින්ට කා කලා. නියෝජ්‍ය අධ්‍යක්ෂකට සහ සහකාර අධ්‍යක්ෂකට කතා කලා. කතා කරලා මම තීරණයක් ගත්තා මේකේ මං ඒ අනුව තීරණය කලා රයිට් මේකේ බුද්ධි තොරතුරු සැහෙන විශ්වාසවන්තභාවයක් තියෙනවා. මේ බුද්ධි තොරතුරක් විය හැකියි. බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය වෙනවා මේ සියලු දේවල් එක්ක ගත්තම ස්වාමිනි මොකද අපි දැක්කා මේකේ ඩිපලප්මන්ට් එක මෝටර් සයිකල් ගන්න එක, මෝටර් සයිකල් පුපුරන එක, හැංගෙන එක, අයිඩෙන්ටි වනාතවිල්ලුවට සම්බන්ධිත ජාතික හැඳුනුම්පත්‍රයක් භාවිතා කරමින් ස්කූටි පෙට් දෙකක් අනුසර මෝටර්ස් එකෙන් ගැනීම ඒ අනුව ස්වාමිනි 20 වෙනිදා තොරතුර එනකොට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක විදියට වගකීමකින් කටයුතු කරන්න මට බැක්ග්‍රවුන්ඩ් එකක් තිබ්බා ස්වාමිනි මෙය බුද්ධි තොරතුරක් මේ පවතින සාමකාමී වාතාවරණය වුවද මේ තොරතුර බාහිර............

ගරු මහාධිකරණ විනිසුරු නාමල් බණ්ඩාර බලල්ලේ මැතිතුමා විසින් යොමු කරන ලදී.

ප්‍ර: දැන් අහන්නේ ඒ තොරතුර ලැබුණට පස්සේ 8.00 වෙනකන් ගත්ත ක්‍රියාමාර්ගය?

උ: නියෝජ්‍ය අධ්‍යක්ෂකට කතා කළා ස්වාමිනි. තොරතුරුකරුට කතා කළා. නියෝජ්‍ය අධ්‍යක්ෂකට කතාකළා. සහකාර අධ්‍යක්ෂකට කතා කළා ස්වාමිනි. අනුපිළිවෙල අමතක වුණත් ස්වාමිනි ජාතික බුද්ධි ප්‍රධානිට කතා කළා. එස්.එම්.එස්. එකක් යැව්වා. ආරක්ෂක ලේකම්තුමාට කතා කළා. එස්.එම්.එස්.එකක් යැව්වා. වට්ස්ඇප් එකක් යැව්වා ස්වාමිනි ආරක්ෂක ලේකම්තුමාට. පොලිස්පතිතුමාට කතා කළා

පණිවිඩය දැනුම් දීලා එස්.එම්.එස්.එකක් යැව්වා ස්වාමිනි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සීනියර් ඩී.අයි.ජී ට කතා කළා ස්වාමිනි. වට්ස්ඇප් එකක් යැව්වා. මට ලැබිච්ච වට්ස්ඇප් එකම යැව්වා ස්වාමිනි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පලාතට කතා කළා. නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාවට කතා කළා. විශේෂ කාර්ය බලකායට කතා කළා. එම නිලධාරින්ට කතා කරලා මේ පණිවිඩය දුන්නා. වට්ස්ඇප් එක හා එස්.එම්.එස් යැව්වේ පොලිස්පතිතුමාටයි, ජාතික බුද්ධි ප්‍රධානී තුමාට, ආරක්ෂක ලේකම්තුමාට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාට.

ගරු මහාධිකරණ විනිසුරු ඒ.කේ.එම් පටබැඳිගේ විනිසුරුතුමා විසින් යොමු කරන ලදී.

ප්‍ර: අපි දෙගොල්ලන්ටම නීතිඥ මහත්වරුන්ටත් අපිටත් මේ පොලිස් දෙපාර්තමේන්තුවේ සහ බුද්ධි අංශවල තියෙන අභ්‍යන්තර කාර්ය පටිපාටිය පිළිබඳ මනා අවබෝධයක් නොමැති වීම වෙන්න පුළුවන්. ඒක කිව්වේ තොරතුරක් බුද්ධි තොරතුරක් බවට පත් කර ගැනීමේ විවිධ ක්‍රම තියෙනවා හරිද. එතකොට මේක මෙම තොරතුර අර පාලම්කුඩා ප්‍රදේශයට පහරදීමත් නැවත වතාවක් විදේශ තොරතුරුකරු දුන්න තොරතුරත් එකට එක්ව ගත් කල මහත්මයා තීරණය කලා මේ සෑහෙන දුර විශ්වසනීයත්වයකින් යුතු බුද්ධි තොරතුරක් කියලා?

උ: එහෙමයි ස්වාමිනි.”

124. සාක්ෂිකරු විසින් ලබා දුන් මූලික සාක්ෂි මෙන් ම හරස් ප්‍රශ්න විමසීමේ දී, තමා ට විදේශ ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් 2019.04.21 දින පෙරවරු 8.27 ට ලැබුණු බව ට පැහැදිලි කර ඇත. එකී පණිවිඩය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ට සහ ආරක්ෂක ලේකම් වෙත යවන ලද බව ට දක්වා ඇත.

125. නමුත් එකී පණිවිඩය නැතහොත් බුද්ධි තොරතුරක් ලෙස විශ්වාස කරන තොරතුර මෙම නඩුවේ චූදිත වූ, එවක ට පොලිස්පතිවරයා ට යොමු කර නැත. එසේ යොමු නොකිරීම පිළිබඳ ව ප්‍රශ්න කිරීමේ දී, සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, තමා ට ලැබුණු WhatsApp පණිවිඩය Textra මෘදුකාංගය ට මාරු කර යැවීම ට කාලය ප්‍රමාණවත් නොවූ බැවින් පොලිස්පතිවරයා ට දුරකථනයෙන් ඇමතූ බව යි. ඒ බව මෙසේ විස්තර කර ඇත. [17]

"ප්‍ර: ඇයි තමුන් ඒක පොලිස්පතිට ඇරියේ නැත්තේ?

උ: ඇරියේ නැත්තේ ස්වාමිනි මට ඒ WHATS APP එක TEXTRA එකට ට්‍රාන්සර් කරලා ඒ මෝඩ් එක මාරු කරලා ඒ ෆෝන් එකට අරන් යවන්න කාලය මදි ස්වාමිනි. 6-10 අතර ගහනවා කියලා තිබෙන්නේ. මම ඒවා කර කර හිටියේ නැහැ. මම WHATS APP මඟින් ආරක්ෂක ලේකම්තුමාට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවනකොටත් ප්‍රහාරය සිදු වෙලා ඉවරයි. මම Protocol එක වෙනස් විදියට මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාතට දුරකථනයෙන් ඇමතුවා ස්වාමිනි. ඊට පසුව මම ගරු පොලිස්පතිතුමාට දුරකථනයෙන් ඇමතුවා. ඊට පසුව මම ආරක්ෂක ලේකම්තුමාට ඇමතුවා Protocol එකෙන් විනාඩි 4 ක් විතර කෙටි කාලයක් ඇතුළත.

ප්‍ර: දැන් මම අහන ප්‍රශ්නයට පැහැදිලි කෙලින් උත්තරයක් දෙන්න. දැන් මෙවැනි තොරතුරක් WHATS APP මාර්ගයෙන් ලැබුණාම අර පසුගිය දිනයේ හතරයි ගාණට TEXTRA හෝ SMS වෙනත් මාර්ගයකින් ඇයි පොලිස්පතිතුමාව දැනුවත් නොකළේ?

උ: හේතුව විදියට අපි දැන් ගන්න ඕනේ දැන් Immediate නම් දැන 20 වෙනිදා කිව්වෙ හෙට වගේ වෙන දෙයක්. දැන් මේකේ 6-10 අතර. මම ස්වාමිනි ටෙක්ස්ට් කර කර, මැසේජ් වෙනස් කරනවාට වැඩිය ලේසිම ක්‍රමය තමයි මට දුරකථනයෙන් අරගෙන කියන එක. මම

[17] 2021.11.29 දින සටහන් පෙ.ව.10.05 පිටුව 2, 3

දුරකථන ඇමතුම අරගෙන තියෙනකොටම මට නැවත නන්දන මුණසිංහ මහත්තයා ඇවිල්ලා කිව්වා නිලන්ත ගැහුවා කියලා. ඉතින් ස්වාමිනි මම TEXTRA ගගහ හිටියා නම් අඩුම ගානේ මට දුරකථන ඇමතුමවත් දෙන්න වෙලාවක් නැති වෙයි ස්වාමිනි.”

126. ඒ අනුව පොලිස්පතිවරයා ට එස්.එම්.එස් මාර්ගයෙන් හෝ වට්ස්ඇප් මාර්ගයෙන් මෙම පණිවිඩය නොයැවීම පිළිබඳ ව පැහැදිලි පිළිතුරක් ලබා දී නොමැති අතර, කෙසේ හෝ ඒ අවස්ථාවේ ම ප්‍රහාරයක් සිදු වූ බව ට තමා ට දැන ගැනීම ට ලැබුණු බව සාක්ෂිකරු පැහැදිලි කර යි.

127. දුරකථන අංක 071-7582222 දරණ ජංගම දුරකථනය ට අදාළ සම්බන්ධතාවය නඩුව ට විෂයගත කාලයේ චූදිත විසින් භාවිතා කළ බව ද, අංක 070-3999800 දරණ සම්බන්ධතාවය පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පාවිච්චි කළ කරුණ ද මෙම නඩුවේ පිළිගත් කරුණ කි.

128. ලේඛන ලකුණු කිරීමේ දි, පැ.45 ලෙස ඊට අදාළ වාර්තාව පැමිණිල්ලේ 1034 වන සාක්ෂිකරු ෂර්ලි රියන්සි ආරොන් සම්බන්ධීකරණ විමර්ශන, නීති අංශය, මොබිටෙල් පුද්ගලික සමාගම විසින් ලකුණු කරන ලදී. එහි දී, පැ.45 දරණ වාර්තාව මෙන් ම පැ.46 ලෙස දුරකථන ඇමතුම් සම්බන්ධ වාර්තාවක් ද ඉදිරිපත් කරන ලදී. එකී වාර්තාවේ 07 වන පිටුවේ පළමු සාක්ෂිකරු විසින් චූදිත ව පැය 17.03.36 ට වූ ඇමතුම සනාථ වේ.

129. 2019.04.21 වන දින පෙ.ව.8.30.59 ට පළමු සාක්ෂිකරු විසින් චූදිත අමතා ඇති බව පැහැදිලි ය.

130. පළමු සාක්ෂිකරුගේ ප්‍රකාශය ප්‍රකාර ව, ඔහු ට බුද්ධි තොරතුරක් ලෙස ලැබුණු තොරතුර චූදිත වෙත යොමු කළ බව කීව ද, (පැ.43) එය ද එසේ යවන ලද්දේ ද, නැද්ද යන කරුණ සැක සහිත ය. 2019.04.21 වන දින ලද තොරතුර චූදිත වෙත දුරකථනයෙන් දැනුම් දුන් බව පළමු සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. චූදිතගේ ස්ථාවරය වන්නේ, පැ.43 දරණ තොරතුර තමා වෙත

නොලැබුණු තොරතුරක් බව යි. පිළිගැනීම් සටහන් කිරීමේ දී, කෙසේ සටහන් වුව ද චූදිත එම තොරතුර ලැබීම ප්‍රතික්ෂේප කර යි.

131. පැ.43 ලෙස ලකුණු කරන ලද බුද්ධි තොරතුර චූදිත වෙත ලැබුණු බව උපකල්පනය කළ ද, චූදිත ට නඩුවේ චෝදනාවන් හි සඳහන් ආධාර අනුබල දීමේ චෝදනා ප්‍රබල හා කාවදින සාක්ෂි මඟින් ඉදිරිපත් කිරීම ට හැකියාව තිබුණේ ද යන්න පිළිබඳ ව සලකා බැලිය යුතු ය.

132. පළමු සාක්ෂිකරු සහ පැමිණිල්ල විශ්වාසය තබන දෙවැනි බුද්ධි තොරතුර චූදිත වෙත ලබා දුන් බව ට කියා සිටින්නේ, පිපිරීම ට ඉතා ආසන්නයේ ය. ඊට පෙර පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් බුද්ධි තොරතුරක් ලෙස ට විශ්වාසය කළ 2019.04.20 දින සවස 4.00 න් පසු ලැබුණු තොරතුරේ සිට පළමු පිපිරීම සහ දෙවැනි තොරතුර දක්වා අතර ගත ව ඇති කාලය ඉතාම කෙටි කාලය කි. 2019.04.20 සවස ලැබුණු තොරතුර අනුව 2019.04.21 වන දින සිදු කරන පහර දීම පිළිබඳ ව දක්වා ඇත්තේ ස්ථාන 08ක ට පහර දීම සහ ඊට හෝටලයක් සහ පල්ලියක් ඇතුළත් වන බව යි. හෝටලයක් සහ පල්ලියක් ඇතුළත් බව ට තිබූ පමණින් නිශ්චිත තොරතුරක් රහිත ව පොලිස්පතිවරයා ට හෝ ගත යුතු ව තිබූ පියවර ඉතා විශාල පරාසයක ට ඇතුළත් වේ. අඩුම තරමින් එම හෝටලය හෝ පල්ලිය කුමන ප්‍රදේශයක ද යන්නවත් පැහැදිලි නැති අතර, එමඟින් නිශ්චිත ස්ථානයක් පිළිබඳ ව පැහැදිලි කිරීමක් නැත.

133. පොලිස්පතිවරයා ලෙස ට මෙම තොරතුර ලැබීමෙන් අනතුරු ව සියලු හෝටල් සහ පල්ලි සඳහා ආරක්ෂාව දිය යුතු ව තිබුණේ යැයි යමෙකු උපකල්පනය කළ ද, එය ද නොකළ පමණින් මෙම නඩුවේ චූදිත චෝදනාවන් හි සඳහන් නොකර හැරීම අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 100 වගන්තියේ 3 වෙනුවට ඇති "යම් දෙයක් කිරීම ට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නොකර හැරීමකින් ඕනෑකමින් ම" උපකාර කළේ ද යන කරුණ තහවුරු කිරීම ට එය ප්‍රමාණවත් නැත.

134. අංක 01 සිට 855 දක්වා ඇති චෝදනාවන්ගේ දැක්වෙන පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය හා 300 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම ට අනුබල දීම ට චූදිත විසින් කළ බව ට කියන නොසැලකිල්ල ප්‍රමාණවත් ද යන්න සලකා බැලිය යුතු ය. එසේ නැතහොත් එය හුදු නොසැලකිල්ලක් පමණි.

135. දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ 3 වන කොටසේ දැක්වෙන ඕනෑකමින් ම උපකාර කිරීම හා සම්බන්ධ නීතිමය තත්ත්වය පහත පරිදි විමසා බැලිය හැකි ය.

136. නඩුව ට අදාළ ප්‍රධාන වැරදි, එනම්, චෝදනාවන් හි සඳහන් මිනිමැරීම් සහ ඒ සඳහා තැත් කිරීම් සම්බන්ධයෙන් සඳහන් වැරදි මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ක්‍රියා මඟින් සිදු කර තිබීම පිළිබඳ ව මෙම නඩුවේ දී හබයක් නැත.

137. පැමිණිල්ල ප්‍රබල හා කාවදින සාක්ෂි මඟින් සනාථ කළ යුතු වන්නේ, එකී වරද සඳහා මෙම නඩුවේ චූදිත දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ තුන් වන කොටසේ දැක්වෙන පරිදි නීති විරෝධි නොකර හැරීමේ චේතනාවෙන් ම සිදු කර, ඒ සඳහා ආධාර අනුබල දුන්නේ ද යන කරුණ යි.

138. මෙම කරුණ සනාථ කිරීමේ දී, යම් චූදිතයෙකු ප්‍රශ්න ගත සිදු කර ඇති බව ට කියන නොකර හැරීම හුදෙක්, නොකර හැරීමක් පමණක් වීම ප්‍රමාණවත් නැත. මේ බව, Subhash Chandra Bebarta Vs State of Orissa,[18] නඩුවේ දී විස්තර කර ඇත.

139. නීති විරෝධි නොකර හැරීම සනාථ කිරීම සඳහා වැදගත් ම අංගය වන්නේ, චූදිත විසින් සිදු කළ නොකර හැරීම ඕනෑකමින් ම එනම්, ප්‍රධාන වරද සිදු කිරීමේ ඕනෑකමින් චේතනාවෙන් සිදු කළ යුතු වීම යි. (intentionally aids, by any act or illegal omission)

[18] 1974 Cr.L.J.217 at p.218 (Orissa)

140. මේ අවස්ථාවේ දී, අප දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ 3 වන පැහැදිලි කිරීම කෙරේ ද අවධානය යොමු කර යි.

"යම් ක්‍රියාවක් කිරීම ට පෙර හෝ එය කරන වේලාවෙ හි ඒ ක්‍රියාව කිරීම පහසුවන ලෙස යමක් යමකු විසින් කරන ලදුව ඉන්, එම ක්‍රියාව කිරීම පහසු නම්, ඒ ක්‍රියාව කිරීම ට ඔහු ආධාර දුන් ලෙස සැලකේ."

141. මෙම නඩුව ට අදාළ ව නොකර හැරීම සහ හෝ නීති විරෝධි නොකර හැරීම හා සම්බන්ධ ප්‍රතිපාදනයන් දණ්ඩ නීති සංග්‍රහයේ 30, 31, 41 සහ 42 වගන්ති වල හඳුන්වා දී ඇත.

30. මේ සංග්‍රහයෙහි සෑම කොටසක ම පද සංසන්දනයෙන් වෙනස් අදහසක් නොපෙනෙන විට, කරනු ලැබූ ක්‍රියා යැයි සඳහන් කරන වචන වල ට නීති විරෝධි නොකර හැරීම් ද ඇතුළත් වෙයි.

31. (1). " ක්‍රියාව" යන වචනයෙන් එක් ක්‍රියාවක් මෙන් ම ක්‍රියා පෙළක් ද ඇතුළත් වෙයි.

(2). "නොකර හැරීම " යන වචනයෙන් එක් නොකර හැරීමක් මෙන් ම නොකර හැරීම් පෙළක් ද දැක්වෙයි.

41. වරදක් වූ හෝ නීතියෙන් තහනම් කරනු ලැබූ හෝ සිවිල් නඩුවක් පැවරීම ට හේතු වන්නා වූ සෑම දෙයක ට " නීති විරෝධි" හා " නීති විරෝධි ලෙස" යන වචන අදාළ වේ.

42. යමෙකු විසින් නොකර හැරීම නිති විරෝධි වන කවර දෙයක් හෝ " කිරීමට නීත්‍යානුකූල ව බැඳී ඇති " ලෙස සලකනු ලැබේ.

142. මේ අවස්ථාවේ දී, අප පහසු ව තකා දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තිය කෙරේ අවධානය යොමු කර එම වගන්තිය නැවත පහත දක්ව යි.

"100. පළවු වනු ව - යම් දෙයක් කිරීම ට යම් කෙනෙකු පෙළඹ වන්නෙක් හෝ,

දෙවනු ව - යම් දෙයක් කිරීම ට කුමන්ත්‍රණයක යෙදෙන්නෙක් හෝ,

තුන් වනු ව - යම් දෙයක් කිරීම ට යම් ක්‍රියාවකින් හෝ නීති විරෝධී නොකර හැරීමකින් ඕනෑකමින් ම උපකාර කරන්නෙක්, එය කිරීමට අනුබල දෙන්නෙක් වේ. "

ඉහත 100 වගන්තියේ ඉංග්‍රීසි පරිවර්තනය මෙසේ ය.

"100. A person abets the doing of a thing who -

Firstly – instigates any person to do that thing; or

Secondly- engages in any conspiracy for the doing of that thing; or

Thirdly – intentionally aids, by any act or illegal omission, the doing of that thing. "

143. එම වගන්තිය සැලකීමේ දී, 100 වගන්තියේ 111 වන කොටසේ දැක්වෙන "ඕනෑකමින් ම උපකාර කරන්නෙක් ", " intentionally aids " යන අදහස වැදගත් ය.

144. මෙම නඩුවේ දී, නම් එම නොකර හැරීම මිනී මැරීමේ චේතනාවෙන් ම සිදු කළ බව පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොර ව සනාථ කළ යුතු ය. දණ්ඩ නීති සංග්‍රහයේ 107 වගන්තිය යටතේ චූදිතයෙකු ට වගකීම පැවරෙන්නේ එවිට ය. එහෙත් මෙම නඩුවේ දී මේ අවස්ථාවේ සලකා බලන්නේ, චූදිත ට පිළිතුරු දීම ට තරම් ප්‍රමාණවත් නඩුකරයක් පැමිණිල්ල විසින් ප්‍රබල හා කාවදින සාක්ෂි මඟින් ඉදිරිපත් කර ඇත්ද යන කරුණ යි.

මේ අවස්ථාවේ දී දණ්ඩ නීති සංග්‍රහයේ 107 වන වගන්තිය පහත දක්වයි.

"107. නොපැමිණ සිටිය දී අනුබල දෙන්නකු ලෙස දඬුවම් ලැබීම ට යටත් යමෙක් යම් ක්‍රියාවක ට හෝ වරදක ට අනුබල දීමේ ප්‍රතිඵලයක්

වශයෙන් දඬුවම් ලැබෙන ක්‍රියාව හෝ වරද සිදු කරන වේලෙ හි පැමිණ සිටී නම්, ඒ ක්‍රියාව හෝ වරද ඔහු කළ ලෙස සැලකිය යුතු ය.

නිදර්ශනය - යම්කිසි පාරක් දිගේ "සී "වස්තුවක් රැගෙන යන බව" ඒ " "බී" ට ලියා දන්වන අතර ම එතැන නැවතී සිට "සී" ගෙන් එය කොල්ල කෑම ට "බී" පොළඹවයි. එම පෙළඹවීම අනුව "බී නැවතී සිට "සී " ගෙන් කොල්ල කයි. එකී ගමනේ දී "ඒ" ද "ඩී" කැටුව එයි. මේ වගන්තිය යටතේ "ඒ" වරදකාරයෙක් වේ. "

145. දණ්ඩ නීති සංග්‍රහයේ 100 සහ 107 වගන්තිවල දැක්වෙන ප්‍රතිපාදන අනුව යම් වරදක ට ආධාර හා අනුබල දෙන තැනැත්තා ප්‍රධාන වරදකරු ලෙස ට සැලකිය යුතු තත්ත්වයක ට ම සැලකිය හැකි පරිදි ඔහු ට එරෙහි ව පැමිණිල්ල සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

146. දණ්ඩ නීති සංග්‍රහයේ 107 වන වගන්තිය යටතේ ඇති අංග සනාථ කිරීම හා සම්බන්ධ ව මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා[19] මෙසේ විස්තර කර යි.

"A point which need emphasis is connection with section 107 is that the principal which it embodies, is applicable only in circumstances where all the essential elements of abetment are established, so that the accused would be liable as an abettor, had he not been present at the commission of the offence. Section 107 does not been impose criminal liability on a person who, although present when the offence was committed, would not have been liable as an abettor if he had been absent. In other words, presence at the commission of the crime, in itself, is not a decisive consideration and does not necessarily facilitate proof of the independent requirements of abetment. Whether the

[19] Peiris G.L, General Principles Of Criminal Liability In sri Lanka, A Stamford lake Publication 2018, page 399-400

accused is absent or present, the burden of establishing the requisite elements of abetment devolves on the prosecution. the only effect of the provision contained in section 107 is that, after all these elements are proved, the further circumstances of the accused's presence enables him to dealt with qua the principal offender, and not merely as abettor."
"

147. මෙහි දී, තවදුරටත් අධිකරණය Samy And Others Vs Attorney General[20] (Bindunuwewa Murder Case), නඩුවේ කරුණු පිළිබඳ ව අවධානය යොමු කර යි.

148. එහි දී, ශ්‍රේෂ්ඨාධිකරණය පංච පුද්ගල විනිසුරු මඩුල්ලක තීරණය ප්‍රකාශය ට පත් කරමින් වීරසූරිය විනිසුරුතුමා සඳහන් කරන්නේ, නීති විරෝධී නොකර හැරීමක් සම්බන්ධයෙන් අපරාධ චෝදනාවක් ගොනු කිරීමේ දී, හුදු නොකර හැරීමක් පමණක් ප්‍රමාණවත් නොවන බව ත්, එකී නොකර හැරීම චෝදනා කරනු ලබන සාපරාධී වරද ට අදාළ ව සාපරාධී චේතනාවකින් කළ යුතු නොකර හැරීමක් විය යුතු බව යි. එහි දී, 237 වන පිටුවේ වීරසූරිය විනිසුරුතුමා Criminal Law By Wayne R. Lafave and Austin W. Scott, (Second Edition (1986) at Page 202) උපුටා දක්වමින් කර ඇති පහත ප්‍රකාශය වැදගත් වේ.[21]

"The above proposition of the law would make it clear that the mere fact that there was duty to act in the given circumstances and death has resulted due to the said failure to act will not be sufficient to establish the offence unless the prosecution proves that the omission was intentional."

---

[20] [ 2007 ] 2 Sri L R,216
[21] [ 2007 ] 2 Sri L R,216 at page 327

149. ඉහත තත්ත්වය ම, penal law of India[22] නම් ග්‍රන්ථයේ මෙසේ විස්තර කර යි.

"At times even refraining from action and mere impassivity makes a person liable to penalty. There are two kinds of "impassivity". In the one a person remains passive because although he has formed an intention to accomplish something prohibited he does nothing and thereby he fails to accomplish it. In these circumstances he commits no offence. In the other the remaining passive and doing nothing, a person accomplishes something prohibited. It is the latter form of impassivity which is punishable as an offence. N. Kan Majura v. Queen, P.C.A, No. 29 of 1953, dated 14 th January, 1954 (P.C), reported in Yearly Digest, 1954 August, Part, Col. 1191. Simply doing nothing is not an act, and unless, there is a duty to do something there is no illegal omission. Emperor v. Bepin Behari Ganguly, A.I.R 1932 Cal. 549 at p. 550 : 33 Cr. L.J. 699 : 138 I.C 763 : 36 C.W.N. 191. In the case of illegal omission criminal liability for abetment depends no less upon the provisions of this Code than upon the obligation created or duty imposed by other law. In the case of a person under such obligation, in order to constitute abetment, it must be shown that the accused intentionally aided the offence by his non-interference." Khaja Noorul Hossein alias KhajaWaheed Jan, 24 W.R. 26 at pp. 27, 28"

150. මෙම නඩුව ට අදාළ මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ප්‍රහාරය හේතුවෙන් සහ ඔවුන් කළ ක්‍රියාවන් දණ්ඩ නීති සංග්‍රහයේ 293 සහ 294 වගන්තිය යටතේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් මිනී මැරීම ක්‍රියාව

[22] Dr.Gour Hari Singh, penal law of India, 11th edition, Volume 2, law publishers (India) Pvt.Ltd, page 993.

සිදු කළ බව ට වූ කරුණ හබයක් නැත. එසේම ඔවුන් කළ ක්‍රියාව කිසිදු ව්‍යතිරේකයක ට ද යටත් වන්නේ නැත.

151. පෙර ද සඳහන් කළ පරිදි, ඉහත කී ප්‍රහාරයන්ගෙන් චෝදනාවන් හි දැක්වෙන තුවාලකරුවන් ට සිදු වූ තුවාල පිළිබඳ ව ද හබයක් නොමැති අතර, මෙවැනි පිපිරීමකින් යමෙකු මිය නොගිය ද, සුළු තුවාල පමණක් ලැබුව ද, ඒවා මරණය ගෙන දෙන ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන තුවාල හේතුවෙන් මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ක්‍රියාව දණ්ඩ නීති සංග්‍රහයේ 300 වගන්තිය යටතේ වූ මිනී මැරීම ට තැත් කිරීමේ වරද ද, සිදු කර ඇති බව පැහැදිලි ය.

152. සියලු චෝදනාවන්ගේ දැක්වෙන්නේ, චූදිත විසින් කළ බව ට කියන නොකර හැරීම සම්බන්ධ ව මෙසේ ය.

"වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 07 වන දින සහ වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 21 වන දින අතර කාල සීමාව තුළ මෙම අධිකරණයේ බල සීමාව තුළ පිහිටි කොළඹ හි දී, ශ්‍රී ලංකා ජනරජයේ, පොලිස්පති වූ යුෂ්මතා වෙත, පහත “ අ ” උප ලේඛනයේ දැක්වෙන ස්වයං ඝාතන සහ වෙනත් වරද ජාතික තව්හිද් ජමාද් නම් සංවිධානයේ නායක වූ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් හෙවත් සහරාන් හෂීම් ඇතුළු අන් අය විසින් සිදු කරන බව ට තොරතුරු ලැබී තිබිය දී, යුෂ්මතා ඉහත තොරතුරු වල සඳහන් වරද සිදු කිරීම වැළැක්වීම ට ක්‍රියා කිරීම නීති විරෝධී ව නොකර හැරීමෙන් ස්වයං ඝාතකයින් වූ මොහොමඩ් කාසීම් මොහොඩම් සහරාන් හෙවත් සහරාන් හෂීම් සහ මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් යන අය ට වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 21 වන දින…" ලෙස ට ය.

153. එහි දී, චූදිතගේ නොකර හැරීම පිළිබඳ ව මෙසේ දක්වා ඇත. එනම්,

"යුෂ්මතා ඉහත තොරතුරු වල සඳහන් වරද සිදු කිරීම වැළැක්වීම ට ක්‍රියා කිරීම නීති විරෝධී ව නොකර හැරීමෙන්..." ලෙස ට ය.

154. සියලු චෝදනාවන් ට අදාළ වන පරිදි දැක්වෙන්නේ, චූදිත, ඔහු ට සපයා ඇති තොරතුරේ නැතහොත් චෝදනා අඩංගු තොරතුරු ගොනුවේ "අ" උප ලේඛනයේ දැක්වෙන ස්වයං ඝාතන සහ වෙනත් වරද ජාතික තවුහීද් ජමාද් නම් සංවිධානයේ නායක වූ මොහොමඩ් කාසීම්, මොහොමඩ් සහරාන් හෙවත් සහරාන් හාෂීම් ඇතුළු අන් අය විසින් සිදු කරන බව ට තොරතුරු ලැබී තිබිය දී, චූදිත "අ" උප ලේඛනයේ දැක්වෙන තොරතුරු වල සඳහන් වරද සිදු කිරීම වැළැක්වීම ට ක්‍රියා කිරීම නීති විරෝධී ව නොකර හැරි බව යි.

155. මෙම නඩුව ට අදාළ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 450 (4) වගන්තිය යටතේ වූ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී, ඒ සමඟ අමුණා ඇති චෝදනාවන් හි උපලේඛනයේ දැක්වෙන්නේ, "පහත උපලේඛනයේ " ලෙස ට ය. නමුත් අධිකරණයේ පරිශීලනය ට සහ චූදිත වෙත ලබා දී ඇති අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් තැබිය යුතු චෝදනාවන් හි සඳහන් වන්නේ, " පහත "අ" උපලේඛනයේ " ලෙස ට ය. ඒ අනුව, ඉහත 450 (4) යටතේ ඉදිරිපත් කළ වාර්තාව සහ රෙජිස්ට්‍රාර් වරයාගේ අත්සන ට ඉදිරිපත් කර ඇති ලේඛන ඉහත කරුණ ට අදාළ එකිනෙක ට වෙනස් ය. නඩු විභාගයේ දී, බලාත්මක විය යුත්තේ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරන ලේඛන වන අතර, මෙම නඩුවේ කරුණු ඒ අනුව සලකා බැලිය යුතු ය.

156. සපයා ඇති උපලේඛනයේ, I සිට VIII අංක යටතේ පැමිණිල්ල විශ්වාසය තබන ලේඛන දක්වා ඇත. ඉන්,

I, යටතේ වූ ලේඛනය පැ.37 ලෙස ද,

II, යටතේ වූ ලේඛන පැ.36 (අ) හා පැ.37 (අ) ලෙස ද,

IV, යටතේ වූ ලේඛනය පැ.39 ලෙස ද,

V, යටතේ වූ ලේඛනය පැ.40 ලෙස ද,

VI යටතේ වූ ලේඛනය පැ.41 ලෙස ද,

VII යටතේ වූ ලේඛනය පැ.43 ලෙස ද,

III යටතේ වූ කොටස අදාළ ලේඛනය වි.01, ලෙස ද, ලකුණු කර ඇත.

එහෙත්, VIII ලෙස උපලේඛනයේ දැක්වෙන ලේඛනය, නඩු විභාගයේ දී, ලකුණු කර නැත. ඒ අනුව ඒ පිළිබඳ ව සලකා බැලීමක් අවශ්‍ය නැත.

157. තොරතුරු වාර්තාවේ උපලේඛනයේ VIII දැක්වෙන පණිවිඩය හා සම්බන්ධ කාරණාව චූදිත වෙත යැවීම ට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පැහැදිලි කර ඇත.

158. චෝදනා අනුව, පැමිණිල්ල විශ්වාසය තබන්නේ, දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ තුන්වන කොටස යටතේ ය. මෙහි දී, 100 වගන්තියේ තුන්වන කොටසේ දැක්වෙන "ඕනෑකමින් ම උපකාර කරන්නෙක්" "Intentionally aids " යන අදහස යටතේ ය.

159. පෙර දැක්වීම ට යෙදුණු කරුණු අනුව, පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ඔහු ට ලද තොරතුර බුද්ධි තොරතුරක් බව ට තහවුරු කරගෙන ඇත්තේ, 2019.04.20 දින සවස 4.00 න් පසු ව ය. ඒ අනුව එකී තොරතුර ඒ මොහොතේ ම දැනුම් දුන්න ද, චූදිත ට ගත යුතු ක්‍රියාමාර්ග ගැනීම ට ප්‍රමාණවත් කාලයක් නැත. තව ද, පැමිණිල්ලේ පළමු සාක්ෂිකාර රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා ට හෝ මෙම පහර දීම් කුමන ස්ථානයන් ට එල්ල වේ ද යන්න පැහැදිලි අදහසක් තිබී නැත. පැ.42 සහ පැ.43 අනුව ඉන්දියානුවන් බහුල ව ගැවසෙන හෝටලයක ට සහ පල්ලියක ට, (.. a church and a hotel,..) පහර දෙන බව ට සීමා වී ඇත.

160. චූදිත මෙම තොරතුර පිළිබඳ ව උනන්දු නොවුණු හෙයින් තමා එය ආරක්ෂක ලේකම්වරයා ට පවා දැනුම් දී, චූදිත සමඟ ක්‍රියා කරන ලෙස

ආරක්ෂක ලේකම්වරයා ට දැනුම් දුන් බව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. ඒ සම්බන්ධ ව චූදිත සමඟ සාකච්ඡා කළ බව ආරක්ෂක ලේකම්වරයා තමා වෙත පැ.42 ලේඛනය පරිදි දැනුම් දුන් බව ට ප්‍රකාශ කර සිටිය ද, එය හුදෙක් වාචික ව ඉදිරිපත් කරන ලද සාක්ෂියක් මිස ආරක්ෂක ලේකම් කැඳවා තහවුරු කිරීමක් කර නැති සාක්ෂිය කි.

161. පැමිණිල්ල විසින් ලකුණු කිරීම ට යෙදුණු පැ.01 සිට පැ.34, පැ.37, පැ.39, පැ.40, පැ.41, යන ලේඛන ( “ අ ”යන්න ලෙස ලකුණු කළ ලේඛන සහ කොටස් ද ඇතුළු ව) මඟින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු හෙළි කර ගත් බව ට කියන තොරතුරු පිළිබඳ ව චූදිත ව වරින් වර දැනුවත් කර ඇති බව පැහැදිලි ය.

162. ඉන් පැ.04 (අ), පැ.06 (අ) ලේඛන පරිදි එම කරුණු ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ට දැන ගැනීම සඳහා මෙන් ම, තොරතුරු රැස් කිරීම සඳහා යොමු කර ඇත. පැ.24 (අ), පැ.25 (අ), පැ.27 (අ) ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍ය පොලිස්පති වෙත සුදුසු කටයුතු සඳහා ද පැ.26 (අ) එම සුදුසු කටයුතු සඳහා සහ වාර්තාවක් කැඳවීම සඳහා ද, පැ.09 (අ), පැ.10 (අ), පැ.14 (අ), පැ.15 (අ), පැ.18 (අ), 19 (අ), පැ.20 (අ), පැ.22 (අ), ලේඛන පරිදි ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ට එම තොරතුරු පරීක්ෂා කිරීම සහ නිර්දේශ සහිත ව නිරීක්ෂණ කැඳවීම ට යොමු කර ඇත.

163. පැ. 07 (අ) ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත වෙත එම තොරතුරු පරීක්ෂා කිරීම සහ නිර්දේශ සහිත ව නිරීක්ෂණ කැඳවීම ට යොමු කර ඇත.

164. පැ.21 (අ), පැ.33 (අ) ලේඛනය ත්‍රස්ත විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක වෙත තොරතුරු පරීක්ෂා කිරීම සහ නිරීක්ෂණ කැඳවීම ට යොමු කර ඇත.

165. පැ.39, පැ.40, පැ.41, ලේඛන පරිදි පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගෙන් එකී ලේඛන වල දැක්වෙන කරුණු හා සම්බන්ධ බැඳුණු පරීක්ෂණ පිළිබඳ ව ප්‍රගතිය වාර්තා කරන ලෙස ට ද නියම කර ඇත.

166. පොලිස්පතිවරයා නැතහොත් පොලිස්පති තනතුර භූමියේ රාජකාරී කරන නිලධාරියෙකු නොවිය යුතු ය. ඔහු භූමියේ රාජකාරී කරවිය යුතු සහ අධීක්ෂණය කළ යුතු නිලධාරියෙකි. භූමියේ ප්‍රායෝගික රාජකාරී සඳහා සිටින නිලධාරින් පොලිස්පතිවරයාගේ අණ අනුව ක්‍රියාත්මක විය යුතු ය.

167. නඩුවේ සලකුණු කරන ලද ලේඛන අතුරින් පැ.42, පැ.43 ලේඛන හැරුණු විට, අන් කිසිදු ලේඛනයක අඩංගු තොරතුරු බුද්ධි තොරතුරු නොවූ බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ම පැහැදිලි කර ඇත. ඒ අනුව තොරතුරු වාර්තාවේ උපලේඛනයේ I, II, III, IV, V, VI යන කිසිදු තොරතුරක් (සෙසු ලේඛන වල ඇති තොරතුරු මෙන් ම) බුද්ධි තොරතුරක් නොවේ. එබැවින් පොලිස්පතිවරයා ට ඒ හා සම්බන්ධ ව තමා ට පහළින් ඇති ඒ ඒ අංශවල නිලයන් දැනුවත් කිරීම සහ සුපරික්ෂාකාරී වීම හැර වෙනත් ක්‍රියාවක් සිදුකිරීම උගහට ය. මන්ද එකී ලේඛන කිසිවකින් භූමියේ නිශ්චිත ආරක්ෂක රාජකාරියක් යෙදවීම ට තොරතුරක් ලැබී නැත. පැ.20 ලේඛනය පරිදි Mohammed Cassim Mohammed Saharan යන අය අත්අඩංගුව ට ගෙන ලිපියේ දැක්වෙන ප්‍රචාර නැවැත්වීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව ට නිර්දේශ කර ඇත. ඒ සම්බන්ධයෙන් ද කටයුතු කිරීම සඳහා චූදිත විසින් ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ට යොමු කර ඇත.

168. ඒ අනුව ඉදිරිපත් ලේඛන පරිදි, බුද්ධි තොරතුරු බව ට පරිවර්තනය නොවූ තොරතුරු පිළිබඳ ව චූදිත පොලිස්පතිවරයා ලෙස ප්‍රමාණවත් පියවර ගෙන ඇති බව පැමිණිල්ලේ සාක්ෂි මඟින් සහ ලේඛන මඟින් පැහැදිලි ය. තොරතුරු වාර්තාවේ viii යටතේ වූ තොරතුර චූදිත ට මුද්‍රිත හෝ යතුරු ලියන මාධ්‍යයකින් ලබා දී නැත. පැමිණිල්ලේ පළමු

සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ, තමා එම තොරතුර දූරකථන මාර්ගයෙන් පමණක් දැනුම් දුන් බව යි. පැ.46 ලේඛනයේ හත්වන පිටුවේ 14 වන පේළිය අනුව පැය 8.30.59 වේලාව ට පළමු සාක්ෂිකරු දූරකථන ඇමතුමක් චූදිත වෙත ලබා දී ඇති බව පැහැදිලි ය. පළමු සාක්ෂිකරු ම ප්‍රකාශ කරන පරිදි ඒ ආසන්නයේ ම පළමු පිපිරීම සිදු ව ඇති බව පැහැදිලි ය. චෝදනාවන් හි දැක්වෙන පිපිරීම් ඉතා කෙටි කාලයක් තුළ සිදු වූ බව සාක්ෂි අනුව පෙනී යයි. චූදිත ට සෘජුව මැදිහත් ව එකී පිපිරීම් වළක්වා ගැනීම ට ප්‍රමාණවත් කාලයක් හෝ අවකාශයක් තිබූ බව ට පැමිණිල්ල තහවුරු කර නැත. ඒ අනුව 2019.04.21 දින දූරකථනයෙන් ලබා දුන් තොරතුර ලබා දුන්න ද නොදුන්න ද එය බුද්ධි තොරතුරක් වුව ද නොවූව ද, ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ගැනීම ට චූදිත ට කාලය සහ අවකාශ නොතිබූ බව අපගේ ස්ථාවරය යි.

169. මීළඟ ට සලකා බැලිය යුත්තේ, පැ.43 ලෙස ලකුණු කළ තොරතුර හා සම්බන්ධ කාරණාව යි. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ, එය බුද්ධි තොරතුරක් ලෙස තමා සැහීම ට පත් වූ බව යි. එහෙත් එය විදේශයකින් ලැබීම සහ එකී ලද පණිවිඩයේ “reliable input” ලෙස සඳහන් ව තිබීම මත තමා එකී තොරතුර බුද්ධි තොරතුරක් ලෙස විශ්වාස කළ බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කර යි. එසේ සාක්ෂිකරු ම තොරතුරක් බුද්ධි තොරතුරක් බව ට පත් කර ගන්නා ආකාරය පිළිබඳ ව, ප්‍රකාශ කර පැහැදිලි කළ පරිදි, එම තොරතුර බුද්ධි තොරතුරක් බව ට විශ්වාස කිරීම ට අදාළ ක්‍රියාදාමයක ට යටත් නොකර, එම තොරතුර බුද්ධි තොරතුරක් බව ට ප්‍රකාශ කර ඇත.

170. පළමු සාක්ෂිකරුගේ සමස්ත සාක්ෂිය සැලකීමේ දී, පැ.01 සිට පැ.41දක්වා ලේඛනවල සඳහන් තොරතුරු වල ට අමතර ව, පැ.43 ලේඛනයේ තොරතුර බුද්ධි තොරතුරක් ලෙස විශ්වාස කිරීම ට පළමු සාක්ෂිකරු විශ්වාස කර ඇති එක ම හේතුව ඉහත කී පරිදි එය විදේශයෙන් ලැබීම සහ reliable input ලෙස සඳහන් වීම පමණි.

171. පිපිරීම් සිදු වීමෙන් අනතුරුව, පැ.43 හි දැක්වෙන තොරතුර බුද්ධි තොරතුරක් ලෙස තහවුරු වුව ද, එය ලැබෙන අවස්ථාව වන විට එකී තොරතුර බුද්ධි තොරතුරක් බව ට පත් වීම සඳහා විශ්ලේෂණය කිරීම ට වෙනත් සාධක තිබී නැත.

172. මෙම නඩුවේ දී සලකා බැලිය යුතු වන්නේ, තොරතුරු ලැබෙන අවස්ථාවේ එකී තොරතුරු වල ඇති වැදගත්කම යි. මෙම අධිකරණය ට පෙනී යන්නේ, නඩුව ට විෂයගත සිද්ධිය පිළිබඳ ව රාජ්‍ය බුද්ධි සේවාව විසින්, නිශ්චිත ප්‍රමාණවත් බුද්ධි තොරතුරක් ප්‍රහාරය ට පෙර හෙළි කර ගැනීම ට අපොහොසත් ව ඇති බව යි. සිදු වීම වන තෙක් ම පැ.43 ලෙස ලකුණු කළ තොරතුර හා 2019.04.21 දින පෙරවරුවේ ලද තොරතුර, වර්ධනය කර ගැනීම හෝ වර්ධනය වීම පිළිබඳ ව ඇති සාධක මෙම නඩුවේ දී ඉදිරිපත් ව නැත.

173.පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව, පළමු සාක්ෂිකරු විශ්වාස කර ඇත්තේ අදාළ තොරතුර විදේශයකින් ලැබූ බව ට වන කාරණාව පමණි. මෙම නඩුවේ දී සැලකිය යුතු වන්නේ, ප්‍රහාරය සිදු වීමෙන් පසු තත්ත්වය නොව නඩුව ට විෂයගත ප්‍රහාරය සිදු වන තෙක් මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ චේතනාවෙන් කටයුතු කර, ඒ අදහසින් යම් නොකර හැරීමක් කිරීම ට, ප්‍රමාණවත් බුද්ධි තොරතුරක් තිබුණේ ද යන්න ය. ප්‍රහාරය සිදු වීමෙන් පසු ඇති වූ තත්ත්වය ප්‍රහාරය සිදු වන තෙක් දක්වා කාලය ට අදාළ කර ගැනීම ට නොහැකි ය. යම් සිද්ධියක් සිදු වූ පසු ලද තොරතුර සාධාරණීකරණය කිරීම ට ඕනෑ ම අයෙකු ට පුළුවන. එහෙත්, චූදිත කටයුතු කළ යුතු ව ඇත්තේ, සිද්ධිය ට පෙර තිබූ තත්ත්වය තුළ ය. 2019.04.21 පළමු පිපිරීම වන තෙක් ම කුමන වේලාවක, කුමන ස්ථානයක ට, ප්‍රහාරය එල්ල කරන්නේ දැයි නිශ්චිත ව ලද තොරතුරක් නැත. මෙම නඩුවේ චූදිතගේ වගකීම සලකා බැලිය යුත්තේ, එවන් වාතාවරණයක් තුළ ය.

174. පැ.43 ලේඛනයේ දැක්වෙන තොරතුර බුද්ධි තොරතුරක් ලෙස සැලකුව ද, නොසැලකුව ද එය චූදිත ට Textra තාක්ෂණය මාර්ගයෙන් යොමු

කළ බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය පැමිණිල්ලේ 35 වන සාක්ෂිකාර වර්තමාන පොලිස්පතිවරයාගේ සාක්ෂිය අනුව බිඳ වැටේ. නැතහොත්, සැකය ට තුඩු දීම ට හේතු වේ. මන්ද, වර්තමාන පොලිස්පතිවරයාගේ සාක්ෂිය අනුව පොලිස් දෙපාර්තමේන්තුව තුළ ඉහත කී Textra තාක්ෂණය භාවිතා නොකළ බව ඔහුගේ ස්ථාවරය යි.

175. පැ.43 හි දැක්වෙන තොරතුර බුද්ධි තොරතුරක් ලෙස සලකා එය වුදිත ට ලැබුනු බව ට සැලකුව ද, පසු දින පෙරවරු 8.30 ට පෙර වූදිත ට භූමියේ ආරක්ෂිත ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් හෝ හේතුවක් තිබූ බව ට සාධක ඇත්දැයි සලකා බැලිය යුතු ය.

176. ඉදිරිපත් සාක්ෂි මෙන් ම පොලිස්පතිවරයෙකු ට ඇති බලතල අනුව ඕනෑම නියෝගයක් ක්ෂණයකින් රට පුරා ම පොලිස් ස්ථානයන් ට ලබා දීමේ හැකියාව ඇත. එමෙන් ම එය එසේ විය යුත්ත කි. එබැවින් පැ. 43 ලැබුණේ නම් ආරක්ෂක ක්‍රියාමාර්ගයක් ගැනීමේ ප්‍රමාණවත් කාලයක් වූදිත ට තිබී ඇත. නමුත් සලකා බැලිය යුත්තේ කුමන ක්‍රියාමාර්ගයක් ගත යුතු ද යන කරුණ යි.

177. පහසුව තකා පැ.43 ලේඛනයේ අන්තර්ගතය පහත පරිදි ඇතුළත් කරමු.

> Sir,
> According to a foreign counterpart.
> “As per a reliable input, Zahran
> Hasim of National Towheed Jamath
> of Sri lanka and his associates
> have hatched a plan to carry out
> an Isthishhad attack in Sri Lanka.
> it is further learnt that they have
> conducted a dry run and caused a
> blast with explosives laden Motor
> cycle at Palmunai near Kattankudy
> in Sri Lanka on 16.4.2019 as part
> of their plan.

It is learnt that they are likely to carry
out their Istishhad attack in Sri Lanka
at any time on or before 21.4.2019.
They have reportedly selected 8
places including a church and a
Hotel, where Indians inhabit in large
number. Further details awaited ."

Director SIS

178. අදාළ පණිවිඩය අනුව, ආගමික අන්තවාදය හේතුවෙන් හෝ අත් නොහැරීමෙන්, මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසින් (isthishhad) සිදු කිරීම ට උත්සාහ කරන, සිදු වීම 2019.04.21 දින ට හෝ ඊට පෙර සිදු විය හැකි බව ට දක්වා ඇත. ප්‍රහාරය සිදු වන ස්ථානයන් ලෙස දක්වා ඇත්තේ මෙසේ ය. " They have reportedly selected 8 places including a church and a hotel, where indians inhabit in large number." ඒ අනුව ප්‍රහාරය සඳහා ඇතුළත් වන්නේ, හෝටලයක් සහ පල්ලියක් ඇතුළු ස්ථාන අටක් වන අතර, ඉන්දියානුවන් විශාල වශයෙන් ගැවසෙන ස්ථාන ලෙස ට දක්වා ඇත.

179. මෙසේ ලද තොරතුරෙන් පමණක් 2019.04.21 දින සිදු වූ ප්‍රහාරයන් නැවැත්වීම ට සාධාරණ පුද්ගලයෙකු ට එසේ නැතහොත් සාධාරණ මනසක් ඇති පුද්ගලයෙකු ට ප්‍රායෝගික හැකියාවක් ඇත් ද යන්න විමසා බැලිය යුතු ය. ප්‍රහාර එල්ල කරන බව ට හෙළිදරව් වූ ස්ථානයන් නිශ්චිත නැත. හෝටලයක්, පල්ලියක් සහ ඉන්දියානුවන් බහුල ලෙස ගැවසෙන ස්ථානයන් කී පමණින් කුමන ස්ථානයක ට කුමන ආකාරයේ ආරක්ෂාවක් සැපයිය යුතු ද යන්න නිශ්චය කළ නොහැකි ය.

180. සෑම හෝටලයක ට ම, සෑම පල්ලියක ට ම ආරක්ෂාව සපයන ලෙස වුදිත ට තිබූ බලතල අනුව දැන්වීම ට තිබූ බව ට යමෙකු ට තර්ක කළ හැකි ය. නමුත් තොරතුරේ සඳහන් දත්ත අනුව එය ප්‍රායෝගික ව කළ හැක්කක් බව පෙනී යන්නේ නැත. එදින පාස්කු ඉරිදා දිනය බව ට රටක

පොලිස්පතිවරයා ට ඔහුගේ අවබෝධය තිබිය යුතු ය. එසේ තිබුණේ වුව ද කුමන ස්ථානයක ට ආරක්ෂාව සපයන්නේ ද යන්න නිශ්චිත තීරණයක් ගැනීම ට පැ.43 හි ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන බව, අප ගේ ස්ථාවරය යි.

181. චූදිත විසින් ගත යුතු ව තිබූ බව ට පැමිණිල්ල විශ්වාසය තබන පියවරයන් චූදිත නොගෙන තිබුණේ වුව ද, එනම් චෝදනාවන්ගේ දැක්වෙන තොරතුරුවල සඳහන් වරද සිදු කිරීම වැළැක්වීම ට ක්‍රියාකිරීම නොකර හැරීමෙන්, චූදිත දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ සහ 300 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර ඇත් ද යන්න විමසා බැලිය යුතු ය.

182. ඉහත දැක්වීම ට යෙදුණු සිද්ධිමය සහ නීතිමය කරුණු යටතේ, මෙම නඩුවේ චූදිත නඩුව ට විෂයගත අපරාධ සිදු වන අවස්ථාවේ, පෙර දක්වන ලද පරිදි, මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා විසින් ද පැහැදිලි කර ඇති පරිදි මෙන් ම, ඉහත දක්වා ඇති දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ පළවන අංගය යටතේ, පැහැදිලි කිරීම යටතේ හෝ චූදිත නඩුවේ ප්‍රධාන වරදකරු ලෙස ට සැලකිය යුතු තත්ත්වයක වගකීමක ට, චූදිත ව යටත් කිරීම ට තරම් නොකර හැරීමක් සිදු කර ඇති බව ට ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත් ව නැති බව, අප ගේ ස්ථාවරය යි.

183. පෙර දක්වන ලද පරිදි චෝදනාවන්ගේ දැක්වෙන්නේ, චූදිත චෝදනාවල දැක්වෙන වරද සිදු කිරීම වැළැක්වීම ට නීති විරෝධී ව නොකර හැරි බව යි. එසේ චූදිත නොකර හැරි බව ට විශ්වාස කරන පැමිණිල්ල ට පැවරෙන වගකීමක් ඇත. එනම්, නොකර හැරීම පමණක් කියා සිටීම ප්‍රමාණවත් නොවන අතර, කළ යුතු ව තිබූ කාර්යය සහ ඉන් චූදිත නොකළ කාර්යය නැතහොත් ඉටු නොකළ වගකීම කුමක්ද යන්න ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත් කර සනාථ කළ යුතු වීම යි. පැමිණිල්ල එකී වගකීම ඉටු කිරීම ට කටයුතු කර නැතුවාක් මෙන් ම, ඊට සමත් ව නැත.

184. ඉහත Samy and Others Vs Attorney General තීන්දුවේ කරුණු අනුව සලකා බැලුව ද, චූදිත සාපරාධී චේතනාවකින් කටයුතු කළ බව ට පැමිණිල්ල සනාථ කිරීම ට අපොහොසත් ව ඇති බව මෙම අධිකරණයේ ස්ථාවරය යි.

**දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තියේ අදාළත්වය**

185. මේ අවස්ථාවේ දී, මෙම ත්‍රිපුද්ගල මහාධිකරණය King V.Ranhamy[23] නඩුවේ කරුණු කෙරේ ද අවධානය යොමු කර යි.

186. එකී නඩුවේ කරුණු අනුව යම් චූදිතයෙකු ට එරෙහි ව, මිනීමැරීමේ චෝදනාවක ට තරම් සාක්ෂි නොමැති අවස්ථාවක දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තිය යටතේ වරදකරුවෙකු කිරීම ට තරම් ප්‍රමාණවත් සාක්ෂි මෙවැනි නඩුවක දී, ඇත්දැයි සලකා බැලීම ට අධිකරණයක ට අවකාශ ලැබේ. ඉහත 298 වගන්තිය මෙසේ ය.

"298. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් නොවෙන අපරීක්ෂාකාරී හෝ නොසැලකිලිමත් ක්‍රියාවක් කිරීමෙන් යමකුගේ මරණය සිදු කරන තැනැත්තකුට.......... "

187. මෙහි දී, අපරීක්ෂාකාරී හෝ නොසැලකිලිමත් ක්‍රියාවක් පිළිබඳ ව යම් චූදිතයෙකු ට එරෙහි ව සනාථ කිරීම ට නම්, එහි දී, දැඩි හා ප්‍රබල සාක්ෂි ඉදිරිපත් ව තිබිය යුතු ය. මෙම නඩුවේ දී, ඉහත දැක්වීම ට යෙදුණු ඉදිරිපත් සාක්ෂි අනුව අඩු තරමින් චූදිත විසින් දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තිය යටතේ වන අපරීක්ෂාකාරී ක්‍රියාවක් හෝ නොසැලකිලිමත් ක්‍රියාවක් සිදු කළ බව ට හෝ පැමිණිල්ල විසින් ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත් කර නොමැති බව මෙම අධිකරණයේ ස්ථාවරය යි.

188. යුක්තිය ඉෂ්ට කිරීමේ දී අප වගකීම වන්නේ, මෙම නඩුවේ චූදිත යම්කිසි හෝ නොකර හැරීමක් කළේ ද යන්න නොව, ඉදිරිපත් සාක්ෂි අනුව

[23] 32 NLR 160

ඉහත ද දක්වන ලද පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ තුන්වන කොටසේ විස්තර කරන පරිදි, චෝදනාවන්ට අදාළ ව මිනීමැරීමේ චේතනාවෙන් ප්‍රධාන වරදකරුවෙකුගේ වගකීම යටතේ නොකර හැරීමක් කළේ ද යන්න ය. ඒ සා වගකීමකට චූදිත යටත් කිරීම ට තරම් පැමිණිල්ල විසින් මෙම නඩුවේ දී ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත් කිරීම ට අපොහොසත් ව ඇත.

189. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200 (1) වගන්තිය යටතේ මෙන් ම ඉහත දක්වන ලද කරුණු සැලකීමේ දී, ඉහත දැක්වීම ට යෙදුණු Attorney General Vs Baranage නඩු තීන්දුවේ දැක්වෙන කරුණු මත නඩුවේ වූ චෝදනාවන් ට හෝ ඊට අඩු චෝදනාවක ට චූදිත වරදකරු කිරීම ට තරම් ප්‍රබල සහ කාවදින සාක්ෂි ඉදිරිපත් කිරීම ට පැමිණිල්ල අපොහොසත් ව ඇත.

190. පැමිණිල්ල විශ්වාසය තබා ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛන සැලකීමේ දී, තොරතුරු වාර්තාවේ දක්වා ඇති සාක්ෂි හා ලේඛන අතරින් පැමිණිල්ලේ නඩුව සනාථ කිරීම ට ඇති සියලු සාක්ෂි කැඳවා ඇති බව මෙම අධිකරණයේ හැඟීම යි. නො එසේ ව, පැමිණිල්ල විසින් පැමිණිල්ලේ නඩුව අවසන් නොකරනු ඇත. කැඳවූ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ ලේඛන වල දැක්වෙන විස්තරයන් ට වඩා ප්‍රබල සාක්ෂි හා ලේඛන තිබුණේ නම්, පැමිණිල්ල ඒවා කැඳවිය යුතු ව තිබුණි. ඒ අනුව පැමිණිල්ල විශ්වාසය තබා ඇති සමස්ත සාක්ෂි හා ලේඛන මෙපමණ නම්, නීතිපතිවරයා විසින් මෙම නඩුවේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කිරීම ට පෙර දෙවරක් ඒ පිළිබඳ ව සලකා බැලිය යුතු ව තිබූ බව අපගේ විශ්වාසය යි.

191. මහාධිකරණයක් ඉදිරියේ නඩු පැවරීමක දී, චෝදනා හෝ අධිචෝදනා ඉදිරිය ට පවත්වාගෙන යා නොහැකි අවස්ථාවක නඩුව අතරමඟ අවසන් කිරීම පිළිබඳ ව අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදනයන් සපයා නැත. එසේ ප්‍රතිපාදනයක් සපයා නැත්තේ, ඕනෑම අවස්ථාවක චෝදනා

ඉල්ලා අස් කර ගැනීම සඳහා හේතු ඇති විට එසේ කිරීම ට නීතිපතිවරයා ට ඇති බලතල පාවිච්චි කරන්නේ යැයි ව්‍යවස්ථාදායකය ට ඇති අදහස බැවිනි. එහෙත්, අපගේ ස්ථාවරය වන්නේ, ඉහත දැක්වීම ට යෙදුණු කරුණු සහ නීතිමය තත්ත්වයන් යටතේ අඩු තරමින් පැමිණිල්ලේ ප්‍රධාන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අවසන් වීමෙන් අනතුරුව හෝ චෝදනා ඉදිරිය ට ගෙන යන්නේ ද නැද්ද යන්න සලකා බැලීම ට නීතිපතිවරයා ට අවස්ථාව තිබුණ ද, ඉන් ද පැමිණිල්ල ප්‍රයෝජන ගෙන නැති බව යි.

**තීරණය**

192. ඉහත සියලු කරුණු අනුව මෙම නඩුවේ චෝදනා හා සම්බන්ධ ව විත්ති වාචක නොකැඳවීම ට තීරණය කර මු.

193. මේ අවස්ථාවේ දී, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200 (1) වගන්තිය යටතේ කටයුතු කරමින්, නඩුවේ සියලු චෝදනාවන්ගෙන්, චූදිත වූ, පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර යන අය වෙන් වෙන් වශයෙන් නිදොස් කරමු.

| | |
|---|---|
| ආචාර්ය නාමල් බණ්ඩාර බලල්ලේ | එම්.වයි.එම්.ඉර්ෂඩීන් |
| මහාධිකරණ විනිසුරු (සභාපති) | මහාධිකරණ විනිසුරු |
| 2022.02.18 | 2022.02.18 |

(සටහන් කළේ : බාලසූරිය මිය සහ වත්සලා මෙය)

194. ශ්‍රී ලංකා ජනරජයේ නීතිපතිවරයා විසින් චෝදනා 855 කින් යුතු තොරතුරු වාර්තාවක් මෙම නඩුවේ චූදිතට එරෙහිව ඉදිරිපත් කරන ලදී. ඒ

අනුව ශ්‍රී ලංකා ජනරජයේ අග්‍රවිනිශ්චයකාරතුමා විසින් එකී තොරතුරු වාර්තාවට අදාල චෝදනා විභාග කිරීම සඳහා මෙම ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල පත් කර ඇත. වර්ෂ 2021.10.01 වන දින තොරතුරු වාර්තාව චූදිතට භාර කරන ලද අතර එකී තොරතුරු වාර්තාවේ සඳහන් චෝදනා 855 වෙන් වෙන් වශයෙන් චූදිතට කියවා තේරුම් කර දෙන ලදී. එකී සියළුම චෝදනාවන්ට චූදිත වෙන් වෙන් වශයෙන් නිවැරදිකරු බව පවසන ලදී.

195. ඉන්පසු පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි අංක 1 ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන, සාක්ෂි අංක 35 ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, සාක්ෂි අංක 1034 මොබිටෙල් පුද්ගලික සමාගම වෙනුවෙන් නියෝජිතයෙකු, සාක්ෂි අංක 1214 වර්ථමාන පොලිස්පති සී.ඩී වික්‍රමරත්න, සාක්ෂි අංක 1216 ප්‍රධාන පොලිස් පරීක්ෂක නිමල් සේනාරත්න සාක්ෂි දෙන ලද අතර අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වගන්තිය යටතේ වාර්තා කරන ලද පිළිගැනීම්ද, පැ.1 සිට පැ.772 දක්වා ලේඛන ලකුණු කරමින්ද පැමිණිල්ලේ නඩුව අවසන් කරන ලදී.

196. පැමිණිල්ල අවසන් කිරීමෙන් පසු විත්තිවාචක කැඳවන්නේද නැද්ද යන්න සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා නඩුව අඩාලව කල් තබන ලදී.

197. තොරතුරු වාර්තාවේ සඳහන් චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ වගකීම පැමිණිල්ල සතු වේ. එහිදී කිසිදු ඔප්පු කිරීමේ භාරයක් විත්තියට හිමි නොවේ. පැමිණිල්ලේ බැලූ බැල්මට නඩුවක් තිබෙන බව සනාථ කලහොත් පමණක් විත්තිවාචක කැඳවීමට අධිකරණයට තීරණය කළහැකිය. එසේ නොමැතිනම් විත්තිවාචක නොකැඳවා චූදිත නිදොස් කිරීමට අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200 (1) උප වගන්තිය යටතේ අධිකරණයට බලයක් ඇත.

198. පැමිණිල්ල විසින් නඩුව ඔප්පු කරන තෙක් නිර්දෝෂී භාවයේ පූර්ව නිගමනයෙහි අයිතිවාසිකම චූදිත සතු ව්‍යවස්ථානුකූල අයිතියකි.

199. මීළඟට සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල සම්පිණ්ඩනයක් පහත පරිදි ඉදිරිපත් කරමි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1.

200. මෙම සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාව වනවිට මධ්‍යම පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කර ඇත. ඔහු 1998 පෙබරවාරි මස 23 වන දින පොලිස් සේවයට එක්වී ඇති අතර වර්ෂ 2016 වන විට උසස්වීම් ලබා නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙසටද, 2019 පෙබරවාරි මාසයේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙසද උසස්වීම් ලබා ඇත. ඔහු වර්ෂ 2000.01.15 දින සිට 2013.12.31 දින දක්වා අභ්‍යන්තර බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේද, රාජ්‍ය බුද්ධි සේවයේද සේවය කර කෙටි කලක් කැනඩාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලයේ සේවය කර ඇත. වර්ෂ 2014.01.01 දින සිට 2014.06.06 දක්වා උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පුද්ගලික සහකාර ලෙස කටයුතු කර ඇත. ඒ වනවිට එම තනතුර දරා ඇත්තේ මෙම නඩුවේ චූදිත බව සාක්ෂිකරු පවසන ලදී. 2014 ජූනි මාසයේ සිට 2015 මාර්තු දක්වා කංකසන්තුරේ කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා වශයෙන් කටයුතු කර ඇති සාක්ෂිකරු වර්ෂ 2015 මාර්තු 03 වන දින රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක ලෙස පත් කර ඇත. රාජ්‍ය බුද්ධි සේවය ආරක්ෂක ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ බව සාක්ෂිකරු පවසයි. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කරන විට හා මෙම නඩුවට අදාල කාලසීමාව වනවිට ශ්‍රී ලංකා ජනරයේ පොලිස්පතිවරයා වශයෙන් මෙම නඩුවේ චූදිත කටයුතු කල බව සාක්ෂිකරු පවසන ලදී.

201. මෙම කාලසීමාව තුළ ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන ඉස්ලාමීය අන්තවාදී සංවිධානයක් වන ISIS සංවිධානය සහ ඊට සමගාමීව ශ්‍රී ලංකාව තුළදී ඉස්ලාමීය අන්තවාදී ක්‍රියාකාරීත්වයක් සිදු වන බවට අනාවරණය කරගෙන ඇති අතර සාක්ෂිකරු විසින් වර්ෂ 2018.12.30 දින සිට

2019.02.15 දින දක්වා මෙකී අන්තවාදී ක්‍රියාකාරීත්වයට අදාල වාර්තා රාශියක් එවකට ශ්‍රී ලංකා ජනරජයේ පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කල මෙම නඩුවේ චූදිතගේ අවධානය සඳහා යොමු කරන ලද බව සනාථ කිරීම සඳහා එකී ලිපිවල පිටපත් පැ. 1 සිට පැ. 34 දක්වා ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

202. තත්ත්වය මෙසේ තිබියදී වර්ෂ 2019.04.04 වන දින විදේශීය තොරතුරුකරුවෙකු විසින් WhatsApp මගින් සාක්ෂිකරුට දැනුම් දී ඇත්තේ කෙටි කාලයක් තුළ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට සහ වැදගත් කතෝලික පල්ලි කීහිපයක් ඉලක්ක කරගෙන ප්‍රහාරයක් සිදුවිය හැකි බවයි. එකී තොරතුරෙහි තිර පිටපතක්(Screen Shot) නඩු විභාගයේදී පැ. 35 ලෙස ලකුණු කරන ලදී. සාක්ෂිකරුට මෙම තොරතුර 2019.04.07 දින ලැබී ඇති අතර සාක්ෂිකරු විසින් 2019 අප්‍රේල් 09 වන දින ජාතික බුද්ධි ප්‍රධානී වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර එකී ලිපිය පැ. 36 ලෙස ලකුණු කරන ලදී. මෙම තොරතුර අනුව ශ්‍රී ලංකාව තුළ ස්ථානගතවී ඇති ජාතික තවුහිද් ජමාත් ව්‍යාපාරයේ සහරාන් හෂීම් සහ ඔහුගේ අනුගාමිකයින් කෙටි කලක් තුළ ශ්‍රී ලංකාව ඇතුලත මරාගෙන මැරෙන ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කිරීමට සූදානම් වන බවද, එහිදී වැදගත් කතෝලික පල්ලි සමහරක් සහ ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය ඉලක්ක වී ඇති බවත් සඳහන් කර ඇත. එහිදී ත්‍රස්තවාදීන් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළහැකි බවද, විශේෂයෙන්ම මරාගෙන මැරෙන ප්‍රහාර, ආයුධ සන්නද්ධ ප්‍රහාර, පිහි පහර සහ ට්‍රක්රථ ප්‍රහාර සිදු කළහැකි බවට දැනුම් දී ඇත. සාක්ෂිකරු මේ පිළිබඳව ජාතික බුද්ධි ප්‍රධානීට දැනුම් දී ඇති අතර පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් 2019.04.09 දින මේ පිළිබඳව ශ්‍රී ලංකා ජනරයේ පොලිස්පතිවරයා එනම් මෙම නඩුවේ චූදිතට දැනුම් දී ඇත. කෙසේවෙතත් මෙම පැ. 37 දරණ ලේඛනයෙහි සඳහන් විදේශීය තොරතුරුකරු ලබාදී ඇති තොරතුර ප්‍රකාරව එකී තොරතුරේ සඳහන් ස්ථාන ඉලක්ක කර ගන්නා ලෙසට නිශ්චිතව සඳහන් කල බවක් නිරීක්ෂණය වී නොමැති නමුත් අන්‍යාගමිකයන් ඝාතනය කිරීම උතුම් ආගමික කරුණක්

බවට සඳහන් කරමින් සමාජජාලා සහ ආගමික දේශන මගින් ප්‍රචාරය කරන බවට නිරීක්ෂණය කරන බව සඳහන් කර ඇත.

203. සාක්ෂිකරුට අනුව මෙම තොරතුර වර්ධනය කරගත යුතු තොරතුරක් විනා බුද්ධි තොරතුරක් ලෙස සැළකිය නොහැකි බවට සාක්ෂි දෙන ලදී.

204. තත්ත්වය මෙසේ තිබියදී 2019.04.20 දින හවස 4.10 ට, 4.15 ට පමණ නැවත වතාවක් විදේශීය තොරතුරුකරුගෙන් WhatsApp මගින් විශ්වසනීය තොරතුරක් ලැබී ඇති අතර ඒ අනුව 2019.04.21 වන දින ඉන්දියානු පුරවැසියන් වැඩිපුර ගැවසෙන පල්ලි සහ හෝටල් ඉලක්ක කරගෙන ප්‍රහාරයක් එල්ල විය හැකි බවට සාක්ෂිකරුට දැනුම් දී ඇත. එකී WhatsApp පණිවිඩයෙහි තිර පිටපත පැ. 42 ලෙස ලකුණු කර ඇති අතර එය පොලිස්පතිවරයා වන මෙම නඩුවේ චූදිතට, ජාතික බුද්ධි ප්‍රධානීට, ආරක්ෂක ලේකම්ට, අපරාධ පරීක්ෂණ දෙපාරතමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත, නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාව, විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරී වෙත දැනුම් දී ඇත. විශේෂයෙන්ම ආරක්ෂක ලේකම්, ජාතික බුද්ධි ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත වෙත WhatsApp පණිවිඩයක් ලෙස යොමු කර ඇති අතර මෙම නඩුවේ චූදිතට කෙටි පණිවිඩයක් සමග දුරකථන ඇමතුමක් ලබා දී ඇත. එසේම නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත, නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාව සමග දුරකථනයෙන් සාකච්ඡා කල බවද, විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරීද දැනුවත් කිරීම් කල බවද පවසන ලදී. එසේම පොලිස්පතිවරයාට දුරකථනයෙන් කතා කල අවස්ථාවේදී බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ වෙත දැනුම් දෙන ලෙසට චූදිත විසින් දැනුම් දීම හේතුවෙන් බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට

මෙන්ම ජාතික බුද්ධි ප්‍රධානීට සහ ආරක්ෂක ලේකම්වරයාටද දුරකථනයෙන් දැනුම් දුන් බව පවසන ලදී.

205. විශේෂයෙන්ම පොලිස්පතිවරයාට පවසන ලද කරුණු සම්බන්ධයෙන් ඔහු බරපතල ලෙස අවබෝධ කරගත්තේද යන්න සම්බන්ධයෙන් සාක්ෂිකරුට ගැටළුවක් වූ හෙයින් ආරක්ෂක ලේකම්වරයාට දුරකථනයෙන් පවසා ඇත්තේ පොලිස්පතිවරයාට මේ පිළිබඳව පවසන ලෙසටයි.

206. මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු විසින් ආරක්ෂක ලේකම්වරයාට යොමු කරන ලද පණිවිඩයට ප්‍රතිපණිවිඩයක් එවමින් ආරක්ෂක ලේකම්වරයා විසින් සාක්ෂිකරුගේ ඉල්ලීම මත පොලිස්පතිවරයා සමග සාකච්ඡා කල බවට සඳහන් කර ඇත.

207. සාක්ෂිකරු 2019.04.04 දින විදේශීය තොරතුරුකරුගෙන් ලද තොරතුර 2019.04.20 ලද තොරතුර සමග සංසන්දනය කර 2019.04.20 ලද තොරතුර වැදගත් බුද්ධි තොරතුරක් ලෙස නිගමනය කල හැක්කේ ඊට පෙර පාලම්කුඩා ප්‍රදේශයේ බයිසිකලයක් පුපුරවා හැරීම සහ සාක්ෂිකරු විසින් විදේශීය තොරතුරුකරු සමග අදහස් හුවමාරු කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසට බව සාක්ෂි දෙමින් පවසන ලදී.

208. සාක්ෂිකරුට අනුව අප රටේ බුද්ධි අංශවල සැකැස්ම සළකා බලන විට බුද්ධි සමාලෝචන මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලය සුවිශේෂී වැදගත්කමක් දරයි. මෙම සියළුම ආයතනවල ප්‍රමුඛ කාර්ය වී ඇත්තේ දේශීය හා විදේශීය බලවේග මගින් අප රටේ ස්වෛරීත්වයට සිදු වන්නා වූ හානි අවම කර ගැනීම හෝ වැළැක්වීම වේ. බුද්ධි සමාලෝචන මණ්ඩලය ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානීත්වයෙන් සතියකට වරක් රැස්වී ඇති අතර ඇතැම් අවස්ථාවල ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රධානත්වය දරා ඇත. එහි සෙසු සාමාජිකයන් ලෙස පොලිස්පතිවරයා, රාජ්‍ය බුද්ධි ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරු, යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක යන අයගෙන් සමන්විත වී ඇත. මීට අමතරව

ක්‍රියාත්මක වන ආරක්ෂක මණ්ඩලය ජනාධිපතිවරයාගේ ප්‍රධානීත්වයෙන් රැස්වී ඇති අතර එහිද ඉහත කී සාමාජිකයන්ට අමතරව අග්‍රාමාත්‍යවරයා සහ ජනාධිපති ලේකම්වරයාද සහභාගී වී ඇත.

209. 2019.04.09 වන දින බුද්ධි සමාලෝචන මණ්ඩලය ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වී ඇති අතර 2009.04.04 වන දින විදේශීය තොරතුරුකරුගෙන් ලද තොරතුර සාකච්ඡාවට භාජනය කිරීමට සාක්ෂිකරු ඉදිරිපත් වී නැත. ඒ පිළිබඳව බුද්ධි සමාලෝචන මණ්ඩලයේ අවධානය යොමු කරන ලෙසට ජාතික බුද්ධි ප්‍රධානීගෙන් ඉල්ලා සිටියද, ජාතික බුද්ධි ප්‍රධානී විසින් එය නොකළ බව සාක්ෂිකරු පවසයි. එම නිසා සාක්ෂිකරුද එම කරුණ බුද්ධි සමාලෝචන මණ්ඩලයේ අවධානය සඳහා යොමු නොකල බව පවසන ලදී.

පැමිණිලේ සාක්ෂි අංක 1214.

210. මෙම සාක්ෂිකරු වර්ථමාන පොලිස්පතිවරයා වන අතර ඔහු 1986 දී පොලිස් සේවයට සම්බන්ධ වී වර්ෂ 2019.04.24 වන දින වැඩ බලන පොලිස්පතිවරයා ලෙසද, 2020.11.25 දින ශ්‍රී ලංකා ජනරජයේ පොලිස්පතිවරයා ලෙසද පත් කර ඇත. පොලිස් ආඥා පනතේ 55 සහ 56 වන වගන්ති අනුව පොලිස් නිලධරයෙකු සතු වගකීම් සහ බලතල ඒ ආකාරයෙන්ම පොලිස්පතිවරයාටද පවතින බව සාක්ෂිකරු සාක්ෂි දෙමින් අධිකරණයේ අවධානය සඳහා යොමු කරන ලදී.

211. පොලිස්පතිවරයා නිල වශයෙන් ජාතික ආරක්ෂක කවුන්සිලයේ සාමාජිකයෙක් බවද, එහි ප්‍රධානත්වය රාජ්‍ය නායකයා දරණ බවද පවසයි. ජාතික ආරක්ෂක කවුන්සිලයේ දී සාමාජිකත්වය ජනාධිපතිවරයා දැරුවද රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් වන ප්‍රශ්න වලදී ආරක්ෂක කවුන්සිලයේ සෑම සාමාජිකයෙක්ම සම මට්ටමේ සිට සාකච්ඡා කරන බව පවසන ලදී. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට රාජ්‍ය නායකයාට මෙන් වගකීමක් පැවරී ඇති බවද පවසන ලදී. පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ

නියෝජ්‍ය පොලිස්පතිවරුන් මෙන්ම නියෝජ්‍ය පොලිස්පතිවරුන් විවිධ අංශ සඳහා අනුයුක්ත කර ඇති බවද, එක් එක් පොලිස්පතිවරයාට ආවේනික ක්‍රමවේදයන් යටතේ පරිපාලනය පවත්වාගෙන යා හැකි බවද පවසන ලදී. එසේම එක් එක් අංශ සඳහා සුවිශේෂී විශේෂඥ දැනුම ඇති නිලධාරීන් පත් කර ඇති විටක ඔවුන් හරහා පරිපාලනය ගෙන යා හැකි බවද සාක්ෂිකරු පවසයි.

212. එසේම බුද්ධි තොරතුරු විශ්ලේෂණය කිරීමේදී පත්වන සෑම පොලිස්පතිවරයෙකුම කරන ලද රාජකාරී අනුව ඒවාට ලබාදිය යුතු වටිනාකම ඒකාකාරී තත්ත්වයක විය නොහැකි බව සාක්ෂිකරු පවසයි. විශේෂයෙන්ම බුද්ධි අංශයක දීර්ඝ කාලයක් රාජකාරී කරන ලද නිලධරයෙකු බුද්ධි තොරතුරකට ලබා දෙන වටිනාකම බුද්ධි අංශයක රාජකාරී නොකරන ලද පොලිස්පතිවරයෙකුට ඒ ආකාරයෙන්ම තිබේද යන්න සම්බන්ධයෙන් සාක්ෂිකරුට මතයක් ප්‍රකාශ කල නොහැකි බව පවසන ලදී. කෙසේවෙතත් පොලිස්පතිවරයෙකුට යම්කිසි තීරණයක් ගැනීමේදී ගැටළුකාරී තත්වයක් ඇති වන විට ඒ ගැටළුකාරී තත්ත්වයට අදාල අංශවල සිටින විශේෂඥ දැනුම ඇති නිලධාරීන් සමග සාකච්ඡා කිරීම වඩාත් සුදුසු බව සාක්ෂිකරු පවසයි. එසේම රාජ්‍ය ස්ථාවරත්වය දේශපාලනික හෝ ආර්ථික වශයෙන් ගැටළුකාරී තත්ත්වයකට පත් වන විට රාජ්‍ය නායකයා සහ ජාතික බුද්ධි අංශයේ ප්‍රධානියා අතර දේශපාලන තොරතුරු සම්බන්ධ වෙනම ක්‍රමවේදයක් පවතින බවත්, එකී තොරතුරු සෙසු අය සමග හුවමාරු නොකර ගන්නා බවත් සාක්ෂිකරු පවසයි. යම්කිසි තොරතුරක් හෝ බුද්ධි තොරතුරක් ලැබුනු විට පොලිස්පතිවරයා ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති පුද්ගලයන් සමග සාකච්ඡා කර තීරණ ගතයුතු බවද, ඒසේ සාකච්ඡා කිරීමට බැරි අවස්ථාවක් ඇති වුවහොත් පොලිස්පතිවරයා විසින් ස්වකීය තීරණය ලබාගත යුතු බවත්, එහිදී ඔහුගේ පළපුරුද්ද, දැනුම, අත්දැකීම් සහ වාසනාවද බලපාන බව සාක්ෂිකරු පවසන ලදී. එසේම ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු තර්ජනයක් තිබෙන විටක පොලිස්පතිවරයා තමා යටතේ සිටින නිලධාරීන්ට දෙනු ලබන වාචික උපදෙස්

මත කටයුතු කිරීමට සිදු වන බවද, විශේෂයෙන්ම විශේෂ කාර්ය බලකාය ක්ෂණිකව එවැනි කර්තව්‍යයන් සඳහා යොදා ගත හැකි බවද පවසන ලදී.

213. බුද්ධි නිලධාරීන් විසින් එවනු ලබන වාර්තා පොලිස්පතිවරයා විසින් පුද්ගලිකවම පරිශීලනය කර අවශ්‍ය තීරණ ගත යුතු බවද, එහිදී ලිපි හුවමාරු වීමේදී සුදුසු කටයුතු සඳහා (for necessary action) වැනි සටහන් යෙදීම සාක්ෂිකරුගේ පරිපාලනය තුළ සිදු නොකර වෙනස් ක්‍රමවේදයක් අනුගමනය කරන බවද පවසයි. එසේම රාජ්‍ය බුද්ධි අංශයෙන් ලැබෙන තොරතුරු සම්බන්ධයෙන් තීරණ ගැනීමට හා රාජ්‍ය නායකයාට උපදෙස් දීමට පොලිස්පතිවරයාට හැකියාවක් තිබිය යුතු බවද පවසන ලදී.

214. 2019 අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරයෙන් පසු නීතිපතිවරයාගේ උපදෙස් මත පරීක්ෂණයක් පවත්වන ලෙසට පැ. 44 දරණ ලිපියෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට සාක්ෂිකරු දැනුම් දුන් බව පවසන ලදී. එසේම රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් පැ. 37, පැ. 39, පැ. 40 ලෙස ලකුණු කර යොමු කරන ලද ලේඛන සම්බන්ධයෙන් 2019.04.21 වන දින එවකට සිටි පොලිස්පතිවරයා වන චූදිත විසින් 2019.05.05 ට නැවත ප්‍රගතිය වාර්තා කරන ලෙසට දැනුම් දුන් බවට සටහනක් ඇති බව සාක්ෂිකරු පවසයි. කෙසේවෙතත් එම ලිපි කිනම් දිනක පොලිස්පතිවරයාට ලැබී තිබේද යන්න සම්බන්ධයෙන් සාක්ෂිකරුට පැවසිය නොහැකි බව පවසන ලදී. එසේම පොලිස් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන සන්නිවේදන පණිවිඩ WhatsApp මගින් සිදු වන බවත්, Texra නමැති සන්නිවේදනය ක්‍රමයක් පොලිස් දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වූ බවට තමාට අවබෝධයක් නොමැති බවත් පවසන ලදී. එසේම පොලිස්පතිවරයා විසින් යම්කිසි කරුණක් සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට හෝ පොලිස්පතිවරයෙකුට දැනුම් දුන් පසු ඔවුන් යටතේ සිටින ආයතන සහ නිලධාරීන්ට ඒවා යොමු කිරීමේ වගකීම අදාල නිලධාරීන් සතු බව පවසන ලදී.

215. ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් බුද්ධි අධ්‍යක්ෂකවරයාට ලැබෙන තොරතුරතුරු ආරක්ෂක මණ්ඩලයට, ආරක්ෂක ලේකම්වරයාට, පොලිස්පතිවරයාට අවශ්‍යනම් ත්‍රිවිධ හමුදාවට, බුද්ධි අංශවලට හෝ දැනුම් දීමට බුද්ධි අධ්‍යක්ෂකවරයාට හැකියාවක් ඇති බව පවසන ලදී. එසේම රාජ්‍ය බුද්ධි අංශය විසින් ඇති විය හැකි ව්‍යසනයක් සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ පවතින යම් යම් අංශවලට දැනුම් දුන් පසු ඒ මත කටයුතු කිරීමේ වගකීමක් අදාල අංශවලට පවතින බවද, පොලිස්පතිවරයාගෙන් එවැනි නියෝගයක් නොලැබුනේය යන පදනම මත වගකීම් පැහැර හැරීමට හැකියාවක් නොමැති බව සාක්ෂිකරු පවසන ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 35.

216. මෙම සාක්ෂිකරු සාක්ෂි දෙන අවස්ථාව වනවිට බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වන අතර මෙම නඩුවට අදාල කාලසීමාවට බස්නාහිර උතුර දිසාව, නොඑසේනම් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කර ඇත. එම කාලසීමාව වනවිට ශ්‍රී ලංකා ජනරජයේ පොලිස්පතිවරයා වශයෙන් මෙම නඩුවේ චූදිත කටයුතු කර ඇති බවද සාක්ෂිකරු පවසන ලදී. වර්ෂ 2019 අප්‍රේල් මාසයේ 08 දිනැතිව බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතාගේ අත්සනින් ලිපියක් 2019.04.11 වන දින සාක්ෂිකරුට ලැබී ඇත. එම ලිපිය සාක්ෂිකරු විවෘත අධිකරණයේදී හඳුනා ගත් අතර එය පැ. 37 සහ පැ. 37-අ ලේඛන බවට වැඩිදුරටත් හඳුනා ගන්නා ලදී. මෙම ලිපිය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාගේ අත්සන සහිතව පොලිස්පතිවරයා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට යොමු කර, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් සාක්ෂිකරුගේ අවධානය සඳහා යොමු කරන ලද ලිපියක් බවට එය හඳුනා ගන්නා ලදී. ඒ අනුව බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ඔහු යටතේ ඊට පහළින් සිටින නිලධාරීන්ට උපදෙස් 4 ක් ලබා දී ඇත.

01. එකී ලිපියෙහි සඳහන් පුද්ගලයින්ගේ ඡායාරූප ලබාගෙන ඒවා බුද්ධි අංශ නිලධාරීන් වෙත ලබා දී ඔවුන් අදාල ඉලක්ක ස්ථානවල හෝ අවට සිටී දැයි පරීක්ෂා කිරීම.

02. ඔවුන් නවාතැන් පොළවල් තුළ, නිවාසවල ආදී ස්ථානවල නවාතැන් ගෙන සිටින්නේද යන්න සහ මෙම තොරතුරු රහසිගතව තබාගෙන විමර්ශනය කිරීමේදී මහජනතාව අනිසි බිය ගැන්වීමකට ලක් නොකල යුතු බව.

03. කතෝලික පල්ලි වලට ආරක්ෂාව ප්‍රමාණවත් නොවන බවට වැටහේනම් ඒ සඳහා නිසි ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කිරීම.

04. මහජනතාව වැඩිපුර ගැවසෙන ස්ථානයන්හි වැඩසටහන්, ප්‍රසංග වැනි කරුණු සඳහා අනුමැතිය ලබාදීමෙදී ඒ සම්බන්ධව වැඩි අවධානයක් දිය යුතු බව.

217. 2019.04.11 දින සාක්ෂිකරුට ඉහත උපදෙස් සහිත ලිපි ලද පසු සාක්ෂිකරුගේද ආවරණ ලිපියක් සහිතව ඔහු යටතේ ඇති මීගමුව, ගම්පහ සහ කැළණිය කොට්ඨාශ තුනේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන්ට මෙන්ම බස්නාහිර උතුරු පළාත් අපරාධ අංශයේ සහ රථ වාහන අංශයේ අධ්‍යක්ෂකවරුන්ටද සාක්ෂිකරු වෙත ලිපි සහ ඇමුණුම් සහිතව 2019.04.12 දින යොමු කරන ලද බව පවසන ලදී.

218. කෙසේ වෙතත් ජාතික බුද්ධි අධ්‍යක්ෂක ජනරාල් විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද සාක්ෂිකරුගේ අවධානය සඳහා යොමුව ඇති ලිපියෙහි නිශ්චිත වශයෙන්ම මේ ආකාරයේ පහර දීමක් සිදු වන බව සඳහන් කර නොතිබුනද සාක්ෂිකරු විසින් තමා යටතේ සිටින සියළුම නිලධාරීන්ට මේ පිළිබඳව සන්නිවේදනය කල බව පවසයි.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1034.

219. මෙම සාක්ෂිකරු ශ්‍රී ලංකා මොබිටෙල් පුද්ගලික සමාගමේ විමර්ශන සම්බන්ධීකාරකවරයෙකි. ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය විසින් නිකුත් කරන ලද 0717582222 දරණ දුරකථන අංකයට අදාල වාර්තාව පැ. 46 ලෙසත්, 0703999800 අංකයට අදාල විස්තර වාර්තාව පැ. 45 ලෙසත් ලකුණු කරන ලදී. 2019.04.07 දින සිට 2019.04.22 දක්වා වාර්තා මේ අනුව ඉදිරිපත් කර ඇති අතර 0717582222 දරණ දුරකථනයට අදාල කෙටි පණිවිඩ වලට අදාල වාර්තාවක් පැ. 47 ලෙස ලකුණු කරන ලදී.

220. 0717582222 දරණ ජංගම දුරකථනය මෙම නඩුවට විෂයගත කාලසීමාව තුළ මෙම නඩුවේ චූදිත විසින් භාවිතා කල බව සහ 0703999800 දරණ ජංගම දුරකථනය පැ.සා. 1 විසින් භාවිතා කරන ලද බවට අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වගන්තිය යටතේ පිළිගන්නා ලදී.

පැමිණිල්ලේ සාක්ෂි අංක 1216.

221. මෙම සාක්ෂිකරු පොලිස්පති ලේකම් කොට්ඨාශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස 2019 මැයි 15 දින දක්වා කටයුතු කර ඇත. ඒ අනුව පැමිණිල්ල විසින් පැ.1 සිට පැ. 34 දක්වා ලේඛන කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කල අතර ඉන් පැ. 2, පැ.5, පැ. 12 දරණ ලේඛනවල පිටපත් පොලිස්පති කාර්යාලයේ නොමැති බව සාක්ෂිකරු පවසන ලදී. අධිකරණයෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පවසා සිටියේ වර්ෂ 2019 මැයි මාසයේ සිට සාක්ෂි දෙන අවස්ථාව තෙක් පොලිස්පති කාර්යාලයේ වර්ථමාන තනතුරේ රාජකාරී කරනු ලැබුවද සාක්ෂිකරුගේ අවධානය සඳහා යොමු කරන ලද ලේඛන ගොනුව කිසිදු අවස්ථාවක ජනාධිපති කොමිෂන් සභාවට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් කිසිදු ආයතනයකින් කැඳවා නොමැති බවයි.

222. මීට අමතරව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වවරයා වෙනුවෙන් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරියක සාක්ෂියට කැඳවා මෙම චෝදනාවන් වලට අදාල මියගිය අයගේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාද, තුවාල වූවන්ට අදාල අධිකරණ වෛද්‍ය වාර්තාද, රජයේ රස පරීක්ෂක වාර්තාද සළකුණු කරන ලදී.

**සාක්ෂි විශ්ලේෂණය.**

223. නීතිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු වාර්තාවේ සඳහන් චෝදනා මිනී මැරීමට ආධාර හා අනුබල දීම හෝ මිනී මැරීමට තැත් කිරීමට ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් වූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇත.

224. තොරතුරු වාර්තාවේ සඳහන් චෝදනාවල හරය වන්නේ වර්ෂ 2019 අප්‍රේල් 07 සහ වර්ෂ 2019 අප්‍රේල් 21 දින අතර කාලසීමාව තුළ මෙම අධිකරණයේ බල සීමාව තුළ පිහිටි කොළඹ හිදී ශ්‍රී ලංකා ජනරජයේ පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කරමින් "අ" උපලේඛනයේ විස්තර කර ඇති ස්වයං ඝාතන සහ වෙනත් වරද ජාතික තවුහිද් ජමාත් නම් සංවිධානයේ නායක වූ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් හෙවත් සහරාන් හෂීම් ඇතුළු අන් අය විසින් සිදු කරන බවට තොරතුරු ලැබී තිබියදී වූදිත එකී තොරතුරුවල සඳහන් වරද සිදු කිරීම වැලැක්වීමට ක්‍රියා කිරීම නීතිවිරෝධීව නොකර හැරීමෙන් ස්වයං ඝාතකයන් වූ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් හෙවත් සහරාන් හෂීම් සහ මොහොම් ඊබ්‍රාහිම් ඉල්හාම් මොහොමඩ් යන අයට එකී ස්වයං ඝාතන බෝම්බ ප්‍රහාර සිදු කිරීමට ආධාර අනුබල දුන් බවට වේ.

225. අනුබල දීම නමැති වරද දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියෙහි විස්තර කර ඇත්තේ මෙසේය.

**"යම් පුද්ගලයෙකු යමක් කිරීමට අනුබල දෙනුයේ ඔහු;**

**1. කවරෙකු හෝ, එය කිරීම සඳහා පොළඹවයි නම්,**

**2. එය කිරීම සඳහා යම් කුමන්ත්‍රණයකට සහභාගී වේ නම් හෝ,**

**3. එය කිරීම සඳහා යම් ක්‍රියාවක් මගින් හෝ නීතිවිරෝධී නොකර හැරීමක් මගින් හෝ චේතනාත්මකව හෝ අධාර කරයි නම්ය."**

226. මේ අනුව මෙම නඩුවේ චූදිතට නගා ඇති චෝදනා පදනම් කරගෙන ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියෙහි ඉහත III ශීර්ෂය යටතේ සඳහන් නීති විරෝධී නොකර හැරීම මත බව ඉතාමත්ම පැහැදිලි වේ.

227. ඉදිරිපත් කරන ලද තොරතුරු වාර්තාව අනුව චෝදනා ඔප්පු කිරීම සඳහා පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් 1216 ක් නම් කර තිබුණද පැමිණිල්ලෙන් කැඳවනු ලබුවේ සාක්ෂිකරුවන් පස්දෙනෙකු පමණි. ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමේදී මෙම නඩුවේ දී ප්‍රධාන වශයෙන් සළකා බැලිය යුතු වන්නේ 2019.04.04 සහ 2019.04.20 යන දිනයන් හිදී පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ට විදේශීය තොරතුරුකරුවෙකුගෙන් ලැබුනේ යැයි කියනු ලබන ස්වයං ඝාතන ප්‍රහාරයක් සම්බන්ධයෙන් වූ තොරතුරු චූදිතට දැනුම් දී තිබිය දී ඒ පිළිබඳව නිසි පියවරක් නොගැනීම චූදිත විසින් නීතිවිරෝධී ලෙස සිදු කර තිබේද යන්න වේ.

228. එහිදී පැමිණිල්ල විසින් චූදිත විසින් ගතයුතුව තිබූ ක්‍රියාමාර්ග මොනවාද, ඒවා නීතිවිරෝධී ලෙස නොගෙන තිබේය යන කරුණු අනිවාර්යෙන්ම සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළයුතුය. 2019.04.04 වන දින පැ.සා. 1 ට ලැබී ඇති පැ. 35 දරණ ලේඛනයේ සඳහන් තොරතුර පාදක කර ගනිමින් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් 2019.04.09 දිනැතිව වාර්තාවක් එවකට ශ්‍රී ලංකා ජනරයේ පොලිස්පතිවරයා වශයෙන් කටයුතු කල මෙම නඩුවේ චූදිත වෙත යොමු කරන ලද ලිපිය පැ. 37 ලෙස ලකුණු කරන ලදී.

229. මෙම පැ.37 දරණ වාර්තාවට පාදක වී ඇති පැ. 35 දරණ තොරතුර WhatsApp මාර්ගයෙන් පැ.සා. 1 ට ලැබී තිබුනු නමුදු පැ.සා.1 එම

තොරතුර විශ්ලේෂණය කර නිගමනය කර ඇත්තේ එය බුද්ධි තොරතුරක් ලෙස නොවේ. එසේම 2019.04.21 වන දින පස්වරු 4.15 ට නැවත වතාවක් විදේශීය තොරතුරුකරුගෙන් තොරතුරක් ලැබෙන තෙක් නිශ්චිත ප්‍රහාරයක් පිළිබඳ තොරතුරක් ලැබී නොතිබුන බවත්, ලැබී තිබුණ තොරතුර බුද්ධි තොරතුරක් කර ගන්නට සාක්ෂිකරුට තොරතුරු නොතිබුනු බවත්ය. (බලන්න 2021.11.29 දින පෙ.ව. 9.35 සටහනේ 02 වන පිටුවේ පහත ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු.)

"ප්‍ර :- නැහැ. ඒක තමයි මම අහන්නේ. මම අහන්නේ තමුන්ට විදේශ තොරතුරුකරුවෙකුගෙන් ඒ තොරතුර ලැබෙනකන්ම තමුන්ට බැරි වුනා නේද තමුන් කරන විශ්ලේෂණයේ සියළුම ක්‍රියාදාමයන් කරලා මේක බුද්ධි තොරතුරක් බවට පත් කර ගන්න ඒකයි අහන්නේ?

උ :- නිශ්චිත ප්‍රහාරයක් පිළිබඳ අපට තොරතුරු ලැබිලා තිබ්බේ නැහැ ස්වාමීනී.

ගරු මහාධිකරණ විනිසුරු එම්.වයි.එම් ඉර්ෂඩීන් මැතිතුමා විසින් යොමු කරන ලදී.

ප්‍ර :- ඒකේ ඒ උත්තරය මට පැහැදිලි නැහැ. ඒ උත්තරය නැවත කියන්න?

උ :- නිශ්චිත බුද්ධි තොරතුරක් කර ගන්න ඒ වේලාව වෙනකන් අපිට තොරතුරු තිබුනේ නැහැ ස්වාමීනී."

230. අනෙක් අතට පැමිණිල්ලේ සාක්ෂි අංක 1 මේ පිළිබඳ බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමේදී හෝ අවධානය යොමු කිරීමට පියවර ගෙන නැත. මේ සම්බන්ධයෙන් ඔහුගේ ස්ථාවරය වූයේ තමාට වඩා ඉහළ ස්ථානයක සිටින ජාතික බුද්ධි ප්‍රධානී වෙත මේ පිළිබඳව දැනුම් දී තිබූ හෙයින් බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමේදී ඒ පිළිබඳ අවධානය යොමු කිරීමේ වගකීම ජාතික බුද්ධි ප්‍රධානීන් සතුව තිබූ බවයි. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ගේ වචන වලින් පවසන්නේ නම් "මෙය ලෙඩක්" විය හැකි බවත්, එය

හෙළිදරව් කරන ලෙස එකී රැස්වීමේදී ජාතික බුද්ධි ප්‍රධානීට පවසා සිටිය බවට සාක්ෂි දෙන ලදී.

231. කෙසේවෙතත් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් වර්ථමාන පොලිස්පතිවරයාට අනුව බුද්ධි අධ්‍යක්ෂක ජනරාල් එසේ නොමැති නම් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ ප්‍රධාන වගකීම බුද්ධි තොරතුරු එකතු කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම වේ. එසේම දේශපාලන සහ ආර්ථික කටයුතුවලට සම්බන්ධ බුද්ධි තොරතුරු ඍජුවම සාකච්ඡා කරනු ලබන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා සහ රාජ්‍ය නායකයා අතර පමණි. එසේම අවශ්‍යනම් ඒවා ත්‍රිවිධ හමුදාවේ බුද්ධි අංශ සමග සාකච්ඡා කිරීමට පවා හැකියාවක් බුද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇත.

232. විශේෂයෙන්ම නඩු විභාගයේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 01 විසින් අනාවරණය නොකර විදේශීය රටක තොරතුරුකරුවෙකු විසින් සිදුවිය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් තොරතුරක් ලැබී එකී තොරතුර සම්බන්ධයෙන් විමර්ශණය කිරීම සඳහා රාජ්‍ය බුද්ධි සේවයේ ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරීන් පිරිසක් නැගෙනහිර පළාතට යොමු කර ඒ පිළිබඳව ලිඛිත වාර්තාවක් ජාතික බුද්ධි ප්‍රධානීට සහ පොලිස්පතිවරයාට ලබා දී තිබියදී 2019.04.09 දින පැවති බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමේදී එකී තොරතුර පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා විසින් අවධානය යොමු නොකිරීම ලිහිල්ව සැළකිය යුතු කරුණක් නොවේ. ඒ හා සළකා බලනවිට මෙම නඩුවේ චූදිත, පැ.සා. 1 විසින් යොමු කරන ලද පැ. 37 දරණ ලේඛනය පදනම් කරගෙන අවශ්‍ය පියවර ගැනීම සඳහා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාට, විශේෂ කාර්ය බලකාය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ විශේෂ ආරක්ෂක දිසාව භාර අධ්‍යක්ෂකවරයාට යොමු කර තිබූ බව පැමිණිල්ල වෙනුවෙන්ම සාක්ෂියට කැඳවන ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් එනම් පැමිණිල්ලේ සාක්ෂි අංක 35 ගේ සාක්ෂියෙන්ම අනාවරණය වේ.

233. මේ අනුව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ගේ සාක්ෂිය අනුව, පැමිණිල්ලේ සාක්ෂි අංක 1 බුද්ධි නිලධාරියෙකු වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කර තිබියදී, එමෙන්ම රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කර සිටියදී ඔහුට ලද තොරතුරක් වූ පැ. 35 දරණ WhatsApp පණිවිඩයේ සඳහන් තොරතුර බුද්ධි සමාලෝචන මණ්ඩලයේ අවධානය සඳහා යොමු නොකිරීම බරපතල තත්ත්වයකි. එම කරුණ සළකා බලනවිට මෙම නඩුවේ චූදිත පැ. 35 සහ 37 දරණ ලේඛන මත පදනම්ව එකී තොරතුරේ සඳහන් ප්‍රහාරයක් වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සහ ඒ පිළිබඳව අත්‍යාවශ්‍ය පාර්ශවයන් වෙත දැනුම් දී ඇති බව පැහැදිලිව පෙනී යයි.

234. මේ අනුව තොරතුරු වාර්තාවේ සඳහන් චෝදනා 855 හි සඳහන් 2019 අප්‍රේල් 07 සිට 2019 අප්‍රේල් 20 දක්වා කාලසීමාව තුළ ස්වයං ඝාතන ප්‍රහාරයන් වැළැක්වීම සඳහා චූදිත විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති බව පැහැදිලිව පෙනී යයි.

235. මෙහිදී මෙම තොරතුර බුද්ධි තොරතුරක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් යුධ හමුදා බුද්ධි අංශයෙන් හෝ ත්‍රිවිධ හමුදාවල බුද්ධි අංශ වලින් අවශ්‍ය කිසිදු සහයක් ලබා ගැනීමට කටයුතු කර නැත. පැමිණිල්ල වෙනුවෙන්ම කැඳවන ලද වර්ථමාන පොලිස්පතිවරයාගේ සාක්ෂියට අනුව එසේ ත්‍රිවිධ හමුදා බුද්ධි අංශ සමග සාකච්ඡා කර බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමට, විශ්ලේෂණය කිරීමට බුද්ධි අධ්‍යක්ෂකවරයාට බාධාවක් නැත. ඔහු ශ්‍රී ලංකා පොලීසියේ බුද්ධි අධ්‍යක්ෂකවරයා නොව රාජ්‍ය බුද්ධි සේවයේ බුද්ධි අධ්‍යක්ෂකවරයා වේ. එබැවින් ලැබෙන තොරතුරු බුද්ධි තොරතුරු බවට පරිවර්ථනය කර ගැනීම සම්බන්ධයෙන් සුවිශේෂී වගකීමක් ඇත්තේ රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයාට වේ.

236. 2019.04.20 දින පස්වරු 4.15 ට පමණ පැමිණිල්ලේ සාක්ෂි අංක 01 ට ලැබුනේ යැයි කියනු ලබන පැ. 42 දරණ WhatsApp පණිවිඩයේ

සඳහන් තොරතුර චූදිත වෙත දුරකථනයෙන් පැවසූ බව සාක්ෂිකරු පවසයි. එසේම එකී WhatsApp පණිවිඩය පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ විශේෂ කාර්යබලකායේ අණ දෙන නිලධාරී වෙත දැනුම් දුන් බවත් පවසන ලදී. පොලිස්පතිවරයාට එනම් මෙම නඩුවේ චූදිතට දුරකථනයෙන් දැනුම් දුන්නද එය බරපතල ලෙස සැළකූ බවක් නොපෙන්වූ හෙයින් ඒ පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දුන් බව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පැවසුවද ඒ බව සනාථ කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ මෙම නඩුවේ චූදිත අතර මෙම තොරතුර සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡාව හා චූදිත ඒ සම්බන්ධයෙන් දක්වන ලද ප්‍රතිචාරය සම්බන්ධයෙන් කැඳවිය හැකිව තිබූ සහ කැඳවිය යුතුව තිබූ ප්‍රධානම සාක්ෂිකරු වන්නේ එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරන අය වේ. ඔහුට එරෙහිව මීට සමාන නඩුවක චෝදනා ඉදිරිපත් කර තිබුනද සාක්ෂි ආඥා පනතේ XI වන පරිච්ඡේදය අනුව ඔහු මෙම නඩුවේ සාක්ෂි දීම සඳහා සුදුසු සාක්ෂිකරුවෙකු වේ. ඔහු මෙම නඩුවේ සාක්ෂිකරුවෙකු ලෙස නොකැඳවීම තුළ අධිකරණයට පැමිණිය හැකි එකම අනුමිතිය වන්නේ ඔහු සාක්ෂියට කැඳවූයේ නම් පැමිණිල්ලට අවාසිදායක සාක්ෂිකරුවෙකු හෝ චූදිතට වාසිදායක සාක්ෂිකරුවෙකු වන හෙයින් නොකැඳවා ඇත්තේය යන අනුමිතිය පමණි.

237. අනෙක්අතට පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ගේ සාක්ෂියට අනුවම මෙම තොරතුර ලැබීමෙන් පසු බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් තහවුරු කරගෙන ඇත්තේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් අවශ්‍ය ආරක්ෂක පියවර ගැනීම සඳහා නිලධාරීන් යොදවා ඇති බවයි. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 එම කරුණ පොලිස්පතිවරයාටද දැනුම් දී ඇත. ඒ බව පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ම පිළිගන්නා ලදී.

238. අනෙක්අතට රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා විසින් මෙවන් ප්‍රහාරයක් සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරීට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට යන සියළුම අයට දැනුම් දී තිබේ නම් ඔවුන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න සම්බන්ධයෙන් හා එම නිලධාරීන්ට යම් යම් තීරණ ගැනීමට බාධාවක් තිබුනේද, එසේනම් ඒ බාධාවන් මොනවාද යන්න සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ පැහැදිලි කිරීමක් සඳහා ඔවුන් සාක්ෂියට කැඳවීමේ වගකීමක්ද පැමිණිල්ල සතු විය.

239. එසේම චූදිතට නගා ඇති චෝදනා සළකා බලන විට මා ඉහතින් විස්තර කරන ලද පරිදි 2019.04.07 දින සිට 2019.04.20 දක්වා පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් චූදිත වෙත යොමු කරන ලද ලිපි වලට අදාලව ඔහු එකී විෂයන්ට අදාල නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගෙන් විවිධාකාරයෙන් වාර්තා කැඳවීමක් සිදු කර ඇත.

240. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 පැවසූ ආකාරයටම රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධාන වගකීම වන්නේ ශ්‍රී ලංකා රජයට අභ්‍යන්තර වශයෙන් සහ භාහිරව සිදුවන තර්ජනයන් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම වන අතර විශේෂයෙන්ම ඒවා බෙදා හැරීමේදී ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයාට සහ ජාතික බුද්ධි ප්‍රධානීටද, පොලිස්පතිවරයාටද වාර්තා කිරීමට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයාට බලය ඇත. කෙසේවෙතත් ඔහුගේ සාක්ෂියට අනුව එකී එක්රැස් කරගත්තා වූ තොරතුරු අනුව සැකකරුවන් අත්අඩංගුවට ගැනීම වැනි ක්‍රියාමාර්ග ගැනීමට බලයක් රාජ්‍ය බුද්ධි සේවයට නොමැති අතර රාජ්‍ය බුද්ධි සේවය විසින් යොමු කරනු ලබන වාර්තා අනුව ඒ සඳහා පියවර ගැනීමේ වගකීම ප්‍රධාන වශයෙන්ම පොලිස්පතිවරයා සතු වේ.

241. මා ඉහතින් විස්තර කරන ලද පරිදි පැමිණිල්ල විසින් පැ.1 සිට පැ. 41 ලෙස ලකුණු කරන ලද ලේඛනයන් අතිශය බහුතරයක්

සම්බන්ධයෙන් පොලිස්පතිවරයා විසින් සුදුසු අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාල අංශ වෙත යොමු කිරීමක් කර ඇත. ඒ අනුව 2019 අප්‍රේල් 07 දින සිට 2019 අප්‍රේල් 20 දක්වා මොහොමඩ් සහරාන් ඇතුළු අයවළුන් කරනු ලබන ස්වයං ඝාතක බෝම්බ ප්‍රහාර වැළැක්වීම සඳහා චූදිත විසින් නීතිවිරෝධී නොකර හැරීමක් කර ඇති බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

242. 2019 අප්‍රේල් 20 වන දින පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ට ලැබුනේ යැයි කියනු ලබන විදේශීය බුද්ධි තොරතුර සම්බන්ධයෙන්ද චූදිත විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත්තේය යන කරුණ හා/හෝ කුමන ක්‍රියාමාර්ගයක් ගැනීම පැහැර හැර ඇත්තේද යන්න සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් පැමිණිල්ලෙන් ඉදිරිපත් වී නැත. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 චූදිතට එම තොරතුර පිළිබඳ දැනුම් දීමෙන් පසු ඔහු පවසා ඇත්තේ මේ සම්බන්ධයෙන් බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැනුම් දෙන ලෙසයි. ඒ අනුව බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා මේ පිළිබඳව අවශ්‍ය පොලිස් නිලධාරීන් යොදවා ඇති බවට පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින්ම නැවත චූදිතට  දැනුම් දී තිබියදී චූදිත විසින් යම්කිසි නොකර හැරීමක් කර ඇති බවට හෝ කර ඇති නොකර හැරීම කුමක්ද යන්න සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් පැමිණිල්ල විසින් ඉදිරිපත් කර නැත.

243. චූදිත විසින් එවැනි ස්වයං ඝාතක ප්‍රහාරයක් වැළැක්වීම සඳහා ගත යුතුව තිබූ යම් ක්‍රියාමාර්ගයක් නොගෙන ඇත්තේ යැයි උපකල්පනය කලද එවැන්නක් සිදු කර ඇත්තේ මිනී මැරීමේ චේතනාවෙන් බවට, නොඑසේ නම් එසේ ස්වයං ඝාතන වලට ආධාර  අනුබල දීමේ චේතනාවෙන් නොකර හැරීමක් (Omision) සිදු කර ඇති  බවට කිසියම් හෝ සාක්ෂියක් අධිකරණයට ඉදිරිපත් වී නැත.

244. අධිකරණයට ඉදිරිපත් වී ඇති එකම සාක්ෂිය වන්නේ 2019.04.04 වන දින පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ට ලද තොරතුර බුද්ධි තොරතුරක් බවට පත් වීමට පෙර පවා චූදිත විසින් එවැනි ප්‍රහාරයක්

වැලැක්වීම සඳහා පියවර ගැනීමේ හැකියාව ඇති සියළුම ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ හා අධ්‍යක්ෂකවරුන්ගේ අවධානය සඳහා යොමු කර ඇති බවයි.

245. නීතිවිරෝධී නොකර හැරීමකට අදාළව අපරාධමය වගකීම පැවරීම සම්බන්ධයෙන් අප රටේ තීරණය වූ වැදගත් නඩු තීන්දුවක් ලෙස **Samy and Others v Attorney – Generl (Bindunuwewa Murder Case) 2007 (2) SLLR 216** හි වාර්තා වී ඇති නඩු තීරණය වැදගත් වන අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඬුල්ලේ තීරණය ප්‍රකාශයට පත් කරමින් වීරසූරිය විනිසුරුතුමා නීතිවිරෝධී නොකර හැරීමකදී පොලිස් නිලධරයෙකුට අපරාධමය වගකීම පැවරීම සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය සාකච්ඡා කර ඇත. එහිදී එතුමා පවසන්නේ යම් සිදුවීමක් තුළ එය වැලැක්වීමට වගකීමක් තිබීම හා එකී වගකීම පැහැර හැරීම නිසා මරණයක් සිදු වීම ඔප්පු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත්, එසේ වගකීම ඉටු කිරීම පැහැර හැරීම චේතනාන්විතව සිදු කර තිබිය යුතු බවත්ය. ඒ අනුව එකී නීතිවිරෝධී නොකර හැරීම අදාල වරද සිදු කිරීම සඳහා චේතනාන්විතව සිදු කර තිබීම පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළයුතු බව පවසා ඇත. එම නඩුවේදී එතුමා කර ඇති පහත ප්‍රකාශය පහසු පරිශීලනය සඳහා සටහන් කර තබමි.

"The above proposition of the law would make it clear that the mere fact that there was a duty to act in the given circumstances and death has resulted due to the said failure to act will not be sufficient to establish the offence unless the prosecution proves that the omission was intentional."

246. එසේම එකී නඩු තීන්දුවේ ආරම්භක සටහනේ පස්වන ඡේදය පහසු පරිශීලනය සඳහා සටහන් කර තබමි. ඒ අනුව යම්කිසි පොලිස් නිලධරයෙකු යම්කිසි නීතිමය වශයෙන් වගකීමක් පවරා ඇති විටෙක එකී

වගකීම යම්කිසි ආකාරයකට සිදු කර ඇති විටෙක එම ක්‍රියාමාර්ගය නොව ඊට වඩා ඵලදායි වෙනත් ක්‍රියාමාර්ගයක් ගත හැකිව තිබුනේ යැයි ඔප්පු කිරීම මත අපරාධමය වගකීමක් පැවරීමට හැකියාවක් නොමැති බවට සඳහන් කර ඇත.

"There is no an illegal omission - or intentional failure to comply with the duty imposed by law by police officers. Having regard to the department orders, if the Officer - in - charge has exercised his discretion bona fide and to the best of his ability, he cannot be faulted for the action he has taken even though it may appear that another course of action could have proved more effective in the circumstances."

247. මෙම නඩුවේදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව චූදිතට එවැනි අපරාධමය චේතනාවක් තිබුනි නම් 2019.04.04 දින පැමිණිල්ලේ සාක්ෂි අංක 1ට ලද තොරතුර මත 2019.04.09 දිනම අදාල නිලධාරීන් දැනුවත් කිරීමට හා ඉදිරි පියවර ගන්නා ලෙසට උපදෙස් දීමට අවශ්‍යතාවයක් නැත.

248. මෙහිදී පැමිණිල්ල විසින් පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සාක්ෂියට කැඳවා ඔප්පු කිරීමට බලාපොරොත්තු වූයේ ශ්‍රී ලංකාව තුළ ඉස්ලාමීය අන්තවාදයක් ක්‍රමිකව ගොඩනැගෙමින් තිබුනු බවට ජාතික බුද්ධි සේවය විසින් හඳුනා ගෙන ඒ පිළිබඳව විටින් විට චූදිත දැනුවත් කර තිබිය දී ඒ අනුව කටයුතු කිරීමට චූදිත නීතිවිරෝධී ලෙස පැහැර හැර ඇති බව ඔප්පු කිරීම වේ. මෙහිදී කණගාටුදායක තත්ත්වය වන්නේ චූදිතට විරුද්ධව චෝදනා ගොනු කිරීමට පෙර විමර්ශන නිලධාරීන් හෝ වෙනත් කිසිදු ආයතනයක් විසින් චූදිතගේ පාර්ශවයෙන් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් මොනවාද යන්න පිළිබඳ කිසිදු විමර්ශනයක් නොකර නඩු පැවරීමට පියවර ගෙන ඇති බවයි. විශේෂයෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 1216 ලෙස කැඳවන ලද ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න පොලිස්පති කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරියෙකු වන අතර 2019 මැයි මාසයේ සිට

සාක්ෂිකරු සාක්ෂි දුන් 2022.01.19 දිනය දක්වා කිසිදු ආයතනයක් විසින් එනම්, මේ පිළිබඳව විමර්ශනය කරන ලද ආයතනයක් හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් කිසිදු ආයතනයක් විසින් මුල් ලිපි ගොනුව පරිශීලනය සඳහා නොකැඳ වන ලද බව පවසන ලදී. මෙම සාක්ෂිය කිසිදු ආකාරයකට අභියෝගයකට ලක් වී නැත. මේ අනුව පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහළම නිලධාරියා වශයෙන් කටයුතු කළ පොලිස්පතිවරයාට ඔහු රාජකාරිමය වශයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග මොනවාද යන්න සම්බන්ධයෙන්, විශේෂයෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 1 විසින් චූදිත වෙත යොමු කරන ලද ලිපි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු කර තිබේද යන්න සම්බන්ධයෙන් පවා ගැටළුකාරී තත්ත්වයක් පැමිණිල්ලෙන්ම සාක්ෂියට කැඳවූ පැමිණිල්ලේ සාක්ෂි අංක 1216 ගේ සාක්ෂියෙන් උද්ගත වේ.

249. විශේෂයෙන්ම පැමිණිල්ලේ සාක්ෂි අංක 35 ගේ සාක්ෂියෙන් සහ පැමිණිල්ලේ සාක්ෂි අංක 1216 ගේ සාක්ෂියෙන් අනාවරණය වන්නේ චූදිත විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග කිසිවක් කෙරෙහි අවධානය යොමු නොකර චූදිතට අපරාධමය චෝදනාවන් ගොනු කිරීමට පියවර ගෙන ඇති බවයි.

250. පැමිණිල්ලේ සාක්ෂි අංක 1 ගේ සාක්ෂියෙන්ම හෙළිදරව් වූ ආකාරයටම 2019.04.20 වන දින විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරියා හෝ අනෙකුත් නිලධාරීන්ටද මේ පිළිබඳව දැනුම් දී තිබිය දී ඔවුන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්න සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් නොකැඳවීමෙන් පෙනී යන්නේ එම සාක්ෂි කැඳවූයේ නම් එකී සාක්ෂි පැමිණිල්ලට අවාසි දායක හෝ විත්තියට වාසිදායක හේතුවෙන් නොකැඳවන ලද්දේය යන අනුමිතියකට එළඹීම පමණි.

251. මෙහිදී ඉදිරිපත් වී ඇති සමස්ථ සාක්ෂි සලකා බැලීමේදී අඩුම තරමින් චූදිත නොසැලකිල්ලකින් කටයුතු කරන බවට හෝ සාක්ෂි ඉදිරිපත් වී

නැත. අපරාධ නොසැලකිල්ල **(Criminal Negligence)** යන්න සලකා බැලීමේදී චූදිතයෙකුගේ හුදු නොසැලකිල්ල ඔප්පු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර චූදිත නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම සහ මිය ගිය අයගේ හෝ අයවළුන්ගේ මරණයට එකම හා ආසන්නතම හේතුව චූදිතයෙකුගේ නොසැලකිල්ල බව ඉතාමත් ප්‍රබල සාක්ෂි මගින් පැමිණිල්ල ඔප්පු කළ යුතුය. මේ සම්බන්ධයෙන් **Gour** තම **PENAL LAW OF INDIA** ග්‍රන්ථයේ 11 වන සංස්කරණයේ 4 වන වෙළුමේ 3024 පිටුවේ ඉන්දීය දණ්ඩ නීති සංග්‍රහයේ නොසැලකිලිමත් ක්‍රියාවකින් මරණය සිදුකිරීමට අදාල 304 A වගන්තිය අර්ථ දක්වමින් කර ඇති පහත විග්‍රහ කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

" The requirements of this section are that the death of any person must have been caused by the accused doing any rash or negligent act. In other words, there must be proof that the rash or negligent act of accused was the proximate cause of the death. There must be direct nexus between the death of a person and the rash or negligent act of the accused.

A remote nexus is not enough. For the purpose of criminal law there are degrees of negligence and a very high degree of negligence is required to be proved before a charge can be sustained under this section. Reasonable foresight is the criterion of negligence. In the case of negligence, the person accused does not do an act which he is bound to do. Mere negligence is not enough to bring a case within the ambit and scope of the section. Negligence or rashness proved by evidence must be such as should carry with it a criminal liability. Criminal rashness is hazarding a dangerous act with the knowledge that it is so and that may cause an injury. There is a breach of positive duty.

In all cases under Sec. 304-A there is a casual chain which consists of many links, it is only that which contributes to the cause of all causes. And it is not enough for the prosecution to show that the act on of the accused was one of the causes of death. It must show that it is the direct consequence of a rash and negligent act and that the act was the proximate and efficient cause without the intervention of another's negligence. Only the negligence in conforming to the rules would not be sufficient for conviction."

252. මා විසින් චෝදනාවල සඳහන්ව නැති අපරාධ නොසැලකිල්ල පිළිබඳව සාකච්ඡාවට භාජනය කළේ **32 NLR 160** හි වාර්තා වී ඇති **King Vs Ranhamy** නඩු තීරණය පදනම් කරගනිමිනි. එකී නඩු තීරණය අනුව යම්කිසි චූදිතයෙකුට මිනිමැරුම සම්බන්ධයෙන් අධිචෝදනා ඉදිරිපත් කර ඇති විටෙක දණ්ඩ නීති සංග්‍රහයේ 298 වගන්තියේ සඳහන් නොසැලකිලිමත් ක්‍රියාවකින් සිදුකරන ලද මරණය සම්බන්ධයෙන් වන වරදට වරදකරු කළ හැකි බවට තීරණය කර ඇති හෙයිනි. මෙම නඩුවේදී චූදිත කරන ලද නොකර කිරීමක් සම්බන්ධව මනුෂ්‍ය ඝාතනයට ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් චෝදනා නගා ඇති හෙයින් සහ එකී චෝදනාව ඔප්පු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොවූ බැවින් අඩුම තරමින් අපරාධමය නොසැලකිල්ල සම්බන්ධයෙන් හෝ සාක්ෂි ඉදිරිපත් වී තිබේද යන්න සලකා බැලිය යුතු හෙයිනි.

253. මෙම නඩුවේ ඉදිරිපත් වී ඇති සාක්ෂි සමස්ථයක් ලෙස සලකා බැලීමේදී චූදිතගේ අපරාධ චේතනාව තබා අඩුම තරමින් නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බවට හෝ පැමිණිල්ලෙන් සාක්ෂි ඉදිරිපත් වී නැත.

254. පුද්ගලයෙකුට විරුද්ධව අපරාධ චෝදනාවක් ගොනු කිරීමේදී එය වගකීමකින් හා ප්‍රවේශමෙන් කළ යුතු වේ. විශේෂයෙන්ම අප රට තුළ පවතින ව්‍යාවස්ථාපිත නීතිය අනුව පුද්ගලයෙකුට විරුද්ධව අපරාධ

චෝදනාවක් ගොනු කිරීමට නම් අනිවාර්යයෙන්ම එම පුද්ගලයා අපරාධ චේතනාවෙන් (Criminal Intention) කටයුතු කළ බවට සාක්ෂි තිබිය යුතුය. මෙයට ව්‍යාතිරේකි අවස්ථාවක් වන්නේ යථාර්ත වගකීම (Strict Liability) පිළිබඳව වරදවල් සම්බන්ධයෙන් වේ.

255. මෙම නඩුවේදී මා ඉහතින් විස්තර කළ පරිදි සහරාන් හෂීම් හෝ අනෙකුත් ස්වයංඝාතක බෝම්බකරුවන්ට චූදිත විසින් චේතනාන්විතව ආධාර හා අනුබල දුන්නේය යන්න සලකා බැලීමේදී චූදිත විසින් එකී ප්‍රහාරයන් වැළැක්වීම සඳහා කරන ලද නොකරහැරීම කුමක්ද යන්න සම්බන්ධයෙන් හෝ සාක්ෂි ඉදිරිපත් නොවීය. එසේම පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් 1216 ක් අතරින් ඉදිරිපත් කරන ලද චෝදනා ඔප්පු කිරීම සඳහා කැඳවන ලද සාක්ෂිකරුවන් පස්දෙනෙකුගේ සාක්ෂිවලින් මෙකී ප්‍රහාරයන් වැළැක්වීම සඳහා චූදිත විසින් ගත යුතුව තිබූ ක්‍රියාමාර්ග මොනවාද, ඒවා චූදිත විසින් නොගත්තේය යන කරුණ ඔප්පු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොවීය. එවන් තත්ත්වයක් තුළ චූදිත අත්අඩංගුවට ගැනීම සඳහා උපදෙස් දී ඇත්තේ කුමන පදනමක් මතද යන්න පවා ගැටළු සහගත වේ.

256. මෙම සිදුවීම ඉතා බරපතල හා සංවේදී සිද්ධියකි. කිතුනු බැතිමතුන්ට ඉතා වැදගත් දිනයක් වන පාස්කු දිනයේදී ආගමිකවතාවත්වල යෙදෙන්නවුන්, කිසිවක් නොදන්නා කුඩා දරුවන් පවා ම්ලේච්ඡ ලෙස ඝාතනයට ලක්විය. තවත් පිරිසක් සුව කළ නොහැකි ආකාරයේ තුවාල ලබා ඇත. තවත් පිරිසක් තම දෙමාපියන් අහිමිවීම නිසා අනාගතය පිළිබඳව දැඩි අවිනිශ්චිතභාවයන්ට පත්ව ඇත.

257. නමුත් එකී සංවේදී කරුණු පදනම් කරගෙන කෙසේ හෝ යමෙකුට එරෙහිව නඩු පැවරීම (සාක්ෂි නොමැතිව) අනුමත කළ නොහැකිය.

258. විශේෂයෙන්ම රාජ්‍ය නිලධාරින්ට විරුද්ධව ඔවුන් රාජකාරිමය වශයෙන් කරන ලද නොකර හැරීමක් සම්බන්ධයෙන් අපරාධ චෝදනා ගොනු කිරීමේදී ඉතාමත්ම ප්‍රවේසම්සහගත විය යුතු වේ. එසේ නොමැතිව මනුෂ්‍ය

ඝාතනයක් සම්බන්ධයෙන් චෝදනා ගොනු කිරීම යුක්ති සහගත නොවන අතර එසේ නඩු පැවරීම තුළ රාජ්‍ය සේවය පමණක් නොව අප රටේ අපරාධ යුක්ති ක්‍රියාදාමය පිළිබඳවද මහජන විශ්වාසය බිඳ වැටීමට හේතුවනු ඇත.

259. මෙම සියළුම සාක්ෂි සළකා බැලීමේදී ඉදිරිපත් කර ඇති චෝදනා කිසිවක් සම්බන්ධයෙන් බැලූ බැල්මට සාක්ෂි පැමිණිල්ලෙන් ඉදිරිපත් කර නොමැති හෙයින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 200 (1) වගන්තිය යටතේ විත්ති චාචක නොකැඳවා චූදිත නිදොස් කිරීමට උගත් සභාපති විනිසුරුතුමා සහ සහෝදර විනිසුරුතුමා ගෙන ඇති තීරණයට මම එකඟ වෙමි.

ඒ.කේ.එම්.පටබැඳිගේ

මහාධිකරණ විනිසුරු

2022.02.18

(සටහන් කළේ: මදූෂානි කරුණාරත්න මෙය)